

භූගෝල විද්‍යාව

7 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

භූගෝල විද්‍යාව

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
(2008 වර්ෂයේ සිට 7වන ශ්‍රේණිය සඳහා)

7වන ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

භූගෝල විද්‍යාව

7 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය: 2007

ISBN 978 - 955 - 654 - 108 - 3

"ආසියානු සංවර්ධන බැංකුවේ
ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
මගින් මුද්‍රණය කරන ලදී."

භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
වෙබ් අඩවිය : www. nie. lk

මුද්‍රණය:
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

පෙරවදන

නව සහශ්‍රකයේ දී සිදුකල පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුල පවතින යම් යම් ගැටලු නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැක. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ, සාමාජීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේ ය. නමුදු වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. මෙම පසුබෑමට හේතුව කිසිදු නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක්ම තීරණ ගනිමින් ඒ දේ පමණක්ම නැවත නැවත ඉදිරිපත් කිරීමේ හේතුවෙනි.

මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිළි දැක්මකින් යුතුව විෂයමාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණත් මඟින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ කුසලතා හා නිපුණතා වැඩි වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරය පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්ට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත් සේ උපකාරී වනු ඇතැයි යනු අපගේ පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මගපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමෙහි දී මෙන් ම ශිෂ්‍යයන් ඇගයීමේ දී උපකාරී වනු ඇත. ගවේෂණ හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුන්ට කාල සටහන් පිළියෙල කිරීමේ දීත්, සීමිත සම්පත් වෙන්කර දීමේ දීත් අභ්‍යන්තර අධීක්ෂණයේ දීත් මහත් ලෙස උපකාරීවනු නොඅනුමාන ය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම ය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුන්ට, හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරීවන මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලු දෙනාට ම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

සංඥාපනය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ 2008 වර්ෂය සඳහා මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද, ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා අතින් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහි වූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිතා කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

මෙහි හමුවන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය කොටසේ දී නව ඉගෙනුම් ක්‍රියාවලියක් සහිත පංතිකාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මකව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතුය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි කොට සංවිධානාත්මකව හා අංග සම්පූර්ණව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතුය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයකට ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරින් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පංතිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විටම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ඉවත් කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදව් කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමක් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් හොඳ ඉගෙනුමකට හේතු වේ.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීම කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම ගැන ද සැලකිලිමත් වන්න.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

සම්පත් දායකත්වය

උපදේශනය	
මහාචාර්ය ජේ. ඩබ්. වික්‍රමසිංහ මයා	අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය
විමල් සියඹලාගොඩ මයා	සහකාර අධ්‍යක්ෂ ජනරාල් (භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය) ජාතික අධ්‍යාපන ආයතනය
විෂය උපදේශනය	
සම්මානිත මහාචාර්ය එම්. එම්. කරුණානායක මයා	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය එන්. කේ. දන්ගල්ල මයා	කැළණිය විශ්ව විද්‍යාලය
මහාචාර්ය වී. නන්දකුමාර් මයා	පේරාදේණිය විශ්ව විද්‍යාලය
මහාචාර්ය කේ. එන්. ජේ. කටුපොත මයා	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය එම්.ඩී.සී.අභයරත්න මයා	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ආචාර්ය ඒ. එස්. එම් නවුෆල් මයා	පේරාදේණිය විශ්ව විද්‍යාලය
ආචාර්ය ජේ. එම්. සමරකෝන් බණ්ඩා මයා	රජරට විශ්ව විද්‍යාලය
ආචාර්ය එච්. ඩී. ඒ. ලලිතා බටුවිටගේ මිය	විශ්‍රාමික අධ්‍යක්ෂ (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව) ජාතික අධ්‍යාපන ආයතනය
අධ්‍යක්ෂණය	
ආචාර්ය යූ. නවරත්නම් මයා	අධ්‍යක්ෂ (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව) ජාතික අධ්‍යාපන ආයතනය
මෙහෙයවීම	
එම්. පී. රංජනී ධනවර්ධන මිය	ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය
ලේඛක මණ්ඩලය	
එම්. පී. රංජනී ධනවර්ධන මිය (ව්‍යාපෘති නායක)	ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය
එම්. කේ. කේ. ප්‍රියන්ත මයා	ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය
කේ. ඒ. එල්. ගීතානි මෙනවිය	සහකාර ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය
එස්. කරුණාකරන් මයා	සහකාර ව්‍යාපෘති නිලධාරී ජාතික අධ්‍යාපන ආයතනය
එෆ්. එම්. නවාස්දීන් මයා	කථිකාචාර්ය, විවෘත විශ්ව විද්‍යාලය
ආර්. පී. පීරිස්. මයා	විශ්‍රාමික අතිරේක විභාග කොමසාරිස්
එස්. එම්. දයානන්ද මයා	විශ්‍රාමික ව්‍යාපෘති නිලධාරී
ඊ. එම්. සීලවතී. මැණිකේ මිය	ගුරු උපදේශක, කුලියාපිටිය කොට්ඨාසය
එච්. වීරරත්න මයා	ගුරු උපදේශක, (විශ්‍රාමික) මාතර කලාපය
ජේ. ඒ. බී. හීන්කෙන්ද මයා	ගුරුඋපදේශක, මහනුවර කලාපය
ඩබ්ලිව්. වල්පිටගේ මිය	ගුරු උපදේශක, මතුගම කලාපය
ඩී. එස්. එච් විජේසේකර	ගුරු සේවය, කොට්ටාව ආනන්ද මහා විද්‍යාලය
කේ. කේ. යූ. ගුණරත්න	ගුරුසේවය, පොල්පාගොඩ නවෝද්‍යා පාසල යක්කමුල්ල
ඩබ්. එන්. එම්. විජේරත්න බණ්ඩා	ගුරුසේවය, ජාතික පාසල මහියංගනය
ඩී. ටී. ඒ. එස්. දසනායක	ගුරුසේවය, ලුණුමෝදර විජය ම. විද්‍යාලය
සංස්කරණය	ව්‍යාපෘති කණ්ඩායම, ජාතික අධ්‍යාපන ආයතනය
සිතියම්	
කේ. ඒ. එල්. ගීතානි මෙනවිය	සහකාර ව්‍යාපෘති නිලධාරී ජාතික අධ්‍යාපන ආයතනය
පිටකවර නිර්මාණය	
ඒ. එල්. එස්. පි. අතපත්තු මෙය	ජාතික අධ්‍යාපන ආයතනය
පරිගණක වදන් සැකසුම	
එන්. පී. නිසංසලා ජයරාණි මෙනවිය	ජාතික අධ්‍යාපන ආයතනය
විවිධ සහාය	
ඒ. එල්. එස්. පි. අතපත්තු මෙය	සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
එස්. ඩී. සමරක්කොඩි මිය	සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
එම්. එන්. එන්. රිහානා මෙය	සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
ආර්. එම්. රූපසිංහ මයා	සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

1.0 හැඳින්වීම

සමාජ අධ්‍යයන හා ඉතිහාසය විෂයය සමෝධානිකව ඉගැන්වීම නිසා ඉතිහාසය භූගෝල විද්‍යාව හා පුරවැසි අධ්‍යාපනය පිළිබඳ සිසුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප පහළ මට්ටමක පවතින බවත්, සිසුන් ලබාගත් දැනුම ප්‍රායෝගික ව භාවිත නොවන බවත් විවිධ පර්යේෂණවලින් හා ප්‍රසිද්ධ විභාගවලදී සිසුන් දී ඇති පිළිතුරුවලින් අනාවරණය විය. ඒ සඳහා වහා ප්‍රතිකර්ම යෙදිය යු බවට සමාජයේ විවිධ කොටස්වලින් බලපෑම් එල්ල විය. එබැවින් 2005 වසරේ සිට සමාජ අධ්‍යයනය හා ඉතිහාසය යන විෂයය වෙනුවට භූගෝල විද්‍යාව, ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය යනුවෙන් අනිවාර්යය විෂයයන් තුනක් 7 වන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට තීරණය කර ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකාවේ සියලු ම විෂය නවීකරණය වීමත්, නිපුණතා පාදක අධ්‍යාපනයක් සියලු ම පාසල් දරුවන්ට ලබාදීම අත්‍යවශ්‍ය නිසාත් 2007 වසරේ සිට භූගෝල විද්‍යාව විෂයය 6 වන ශ්‍රේණියේ සිටම පාසල් පද්ධතියට හඳුන්වාදුන් අතර 10 වන ශ්‍රේණියට ද භූගෝල විද්‍යාව නව විෂයය නිර්දේශ හඳුන්වා දෙනු ලැබීය. 2008 වසරේ දී 7 වන ශ්‍රේණියට හා 11 වන ශ්‍රේණියට භූගෝල විෂය නව විෂය නිර්දේශය හඳුන්වා දෙනු ලැබේ.

භූගෝල විද්‍යා විෂයයෙන් ස්ථානීය, ප්‍රාදේශීය හා ගෝලීය පරිමාණයන්ගෙන් ස්වාභාවධර්මය හා සමාජය අතර අන්තර් සම්බන්ධතාවය හා ඒවායේ රටාවලින් හා ක්‍රියාවලි අවකාශීය කාලික යථාදර්ශයකින් අධ්‍යයනය කිරීම සිදු වේ. එමෙන් ම භූගෝල විද්‍යාව විෂයමාලාව අධ්‍යයනයෙන් ශිෂ්‍යයින්ට තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගැනීමට හැකිවන අතර ඒ පිළිබඳ අවබෝධයකි යුතු ව ක්‍රියාත්මක විය හැකිය.

දෙවන කොටසේ ඉදිරිපත් කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද 5E සංකල්පය අනුව ගොඩනගා ඇත. මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ශිෂ්‍ය නිපුණතා සංවර්ධනයට යොදා ගැනීම වැදගත් ය. මෙම ක්‍රමවේද තිබෙන සම්පත් අනුව හා ඔබගේ නිර්මාණශීලිත්වය අනුව තවදුරටත් සංවර්ධනය කරගැනීම ද ඔබට හැකි වනු ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද තුළින් නිපුණතා මට්ටම ළඟා කරවීමත් අපේක්ෂා කෙරේ. තෙවන කොටසෙු තක්සේරුව හා ඇගයීම සිදුකළ යුතු ආකාරය ඔබට පැහැදිලි කර ඇත. පළමු, දෙවන හා තෙවන වාරය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ ඉදිරිපත් කර ඇත. මෙය කේවල ක්‍රියාකාරකමකි. ඒ අනුව ශිෂ්‍යයා තක්සේරු කිරීමට හා ඇගයීමට ඔබට හැකියාව ලැබේ.

මෙම විෂය නිර්දේශය සහිත ගුරු මාර්ගෝපදේශය කොටස් තුනකින් යුක්තය

1. කොටස - විෂය නිර්දේශය
2. කොටස - ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය
3. කොටස - තක්සේරුව හා ඇගයීම

ඒ අනුව 7 වන ශ්‍රේණිය විෂය නිර්දේශය අධ්‍යයනයෙන් අප ජීවත්වන ලෝකය හඳුනාගැනීමටත්, ශ්‍රී ලංකාවේ භූ දර්ශනය තුළනාත්මකව අධ්‍යයනයටත්, කමා ආසන්න ප්‍රදේශයේ භූ දර්ශනය අධ්‍යයනය කිරීමටත්, ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික අපදා හඳුනා ගැනීමටත්, තේමා සිතියම් කියවීමේ කුසලතා ලබාගැනීමටත් හැකියාව ලැබේ. යම් විෂය කරුණු රැසක් ඉගැන්වීමේ අදහසකින් බැහැරවී ජීවත්වීමේ දී අවශ්‍ය නිපුණතා රැසක් මෙම විෂය අන්තර්ගතයක් හඳුනාගෙන තිබේ. නිපුණතා වර්ධනයට උචිත ඉගෙනුම් ඉැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමර ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමටද අපේක්ෂා කෙරේ.

මෙම විෂයය නිර්දේශය පන්ති කාමර මට්ටමින් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී 50% වැඩි ප්‍රමාණයක් ප්‍රායෝගික ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කිරීමට අපේක්ෂිතය. එමගින් සිසුන්ගෙන් දැනුම, ආකල්ප, කුසලතා සමබර වන ආකාරයේ ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ නිර්මාණය කිරීමට හැකිවනු ඇත. එය ශිෂ්‍යයා තුළ නිපුණතා සංවර්ධනය කිරීමට පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීමේ දී කැපවීමෙන් කටයුතු කළ විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් ඇතුළු උපදේශක මණ්ඩලයේ මහත්ම මහත්මීන්ටත්, ලේඛක මණ්ඩලයේ මහත්ම මහත්මීන්ටත්, නන් අයුරින් උපකාර කළ සියලු ම දෙනාටත් කෘතඥ පූර්වක ස්තුතිය පිරිනමමු.

– විෂය කමිටුව

පටුන

	පිටුව
1. පෙරවදන	iii
2. සංදේශය	iv
3. සම්පත් දායකත්වය	v
4. හැඳින්වීම	vi - vii
5. පටුන	viii
6. විෂය නිර්දේශය	2 - 5
7. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය	6 - 119
හැඳින්වීම	7 - 11
ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය	12 - 119
8. තක්සේරුව හා ඇගයීම	120 - 128
හැඳින්වීම	121 - 122
ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ	123 - 128

විස්තරාත්මක විෂය නිර්දේශය

භූගෝල විද්‍යා විෂයයේ අරමුණු

- තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන එකිනෙකා සමගත්, පරිසරය සමගත් සුසංයෝගී ව ජීවත් වීමට හුරුවීම.

- භෞතික හා මානව භූ දර්ශනයේ සංරචක, ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.

- භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප වර්ධනය කර ගැනීම.

- දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතයට හුරු වීම.

- ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජයගැනීමට උපකාරී වන සුවිශේෂ දිවිරැකුම් කුසලතා වර්ධනය කර ගැනීම

- ස්වභාව ධර්මය හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතා සහ ඒවායේ රටාවන්, ක්‍රියාවලි අවකාශීය හා කාලික යථාදර්ශයකින් අධ්‍යයනය කිරීම.

නිපුණතාව	ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම	විෂය අන්තර් ගතය	කාලච්ඡේද
භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි	I අප ජීවත්වන ලෝකය විමර්ශනය කරයි.	අප ජීවත්වන ලෝකයේ - හැඩය - අක්ෂාංශ, දේශාංශ - මහාද්වීප හා සාගර	06
	II. ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි.	ශ්‍රී ලංකාවේ - රාෂ්ට්‍රීය ප්‍රදේශය - දේශගුණික සුවිශේෂත්වය - පරිපාලන මායිම (පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ග්‍රාම නිලධාරි කොට්ඨාශ) - ආර්ථිකයේ ස්වරූපය	10
භෞතික හා මානුෂ ක්‍රියාවලින් ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.	III. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය භූ දර්ශන තුලනාත්මකව විමර්ශනය කරයි	භූ දර්ශනය හැඳින්වීම ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රාදේශීය භූ දර්ශන හඳුනා ගැනීම - මධ්‍යම කඳුකර භූ දර්ශන තේ වතු වගාව වානිජ එළවලු වගාව - වියලි කලාපීය භූ දර්ශන වැව් ජනාවාස හේන් ගොවිතැන් - තෙත් කලාපීය භූ දර්ශන පිටාර තැනි (ගං වතුර) නාගරික ජනාවාස - වෙරළ තීරය ආශ්‍රිත භූ දර්ශන සංචාරක කර්මාන්තය ධීවර කර්මාන්තය	14

නිපුණතාව	ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම	විෂය අන්තර් ගතය	කාලච්ඡේද
තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.	IV තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය පරීක්ෂා කරයි.	තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශන - මධ්‍යම කඳුකරය - වියළි කලාපය - තෙත් කලාපය - වෙරළ තීරය පාසල් අයත් ප්‍රදේශයේ භූ දර්ශන පිළිබඳ සුවිශේෂීව අධ්‍යනය කිරීම අපේක්ෂිත	10
ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා අවස්ථා ජය ගැනීමට උපකාරිවන සුවිශේෂ දිවි රැකුම් කුසලතා භාවිත කරයි	V. ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා විමර්ශනය කරයි.	ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා නියග, ගංවතුර, - සුළිසුළං, විදුලි කෙටීම් හා අකුණු සැර, නායයෑම්, චණ්ඩ මාරුත, සුනාමි - ස්වාභාවික ආපදාවේ ස්වභාවය හා ඒවා - ස්වාභාවික ආපදා ඇතිවීමට බලපාන හේතු - ස්වාභාවික ආපදාවලින් වැලකීම සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග - ස්වාභාවික ආපදා අවස්ථාවකදී ඊට මුහුණ දෙන ආකාරය - ස්වාභාවික ආපදා අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග	10
දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රමශිල්ප භාවිත කරයි.	VI. තේමා සිතියම් කියවයි.	තේමා සිතියම් කියවීම - තේමා සිතියම් හැඳින්වීම 10 - දිශාව හා පරිමාණය - සම්මත වර්ණ හා සංකේත මාර්ග ජනාවාස ගංගා සහ අනිකුත් ජලනල සමෝච්ඡ රේඛා	

4.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු ද වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත්කිරීම සඳහා සෑම ශිෂ්‍යයෙකුට ම සහභාගී විය හැකි වැඩ සටහන් සම්පාදනය කිරීම පාසල් පාලන අධිකාරීන්ගේ වගකීමක් කොට සැලකේ. පහත දැක්වෙන්නේ එවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයකි.

- භූගෝල විද්‍යා විෂය සංගමයක් පිහිටුවීම : මෙමඟින් දැනුම මිනුම වැඩසටහන්, විවාද, ප්‍රදර්ශන, බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන වැනි විවිධ කාර්යයන් සඳහා යොමු කිරීම.
- බිහි වැඩ, ක්ෂේත්‍ර චාරිකා හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම හා සහයෝගයෙන් කටයුතු කිරීමට යොමු කිරීම.
- පුද්ගලයින් හා පොත පත මූලාශ්‍ර වශයෙන් ගෙන කුඩා පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම. මෙමඟින් විවිධ වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීමට පෙළඹවීම
- ප්‍රදේශයෙන් පිහිටුවා ගෙන තිබෙන වෙනත් පාරිසරික සංවිධානය සමඟ එක් ව කටයුතු කිරීමට සිසුන් දිරි ගැන්වීමටත්, භූගෝල විද්‍යාත්මක දැනුම පුළුල් කිරීමටත් උපකාර කිරීම.

ඉගෙනුම් - ඉගැන්වීම්
ක්‍රමවේදය

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

හැඳින්වීම

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් අන්දමින් දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම/පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම/ ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය/දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (DEMONSTRATIONS) ඍජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ. ඒවා,

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම

ආදිය වේ.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර, සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ 3 වන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයකුට ම වගකීම් පැවරෙන පරිදි

ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත්, සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරැදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ 2 පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESS-MENT) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

5.0 භූගෝල විද්‍යාව ඉගැන්වීමේ ක්‍රමවේද

භූගෝල විද්‍යාව විෂය ගතික, සජීවී හා ප්‍රායෝගික විෂයකි. එසේ වුව ද පසුගිය දශක කීපයක් තිස්සේ පාසල් පද්ධතියේ පන්ති කාමරයේ භාවිත කළ හුරු පුරුදු දේශන ක්‍රමය තවදුරටත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් පවත්වා ගැනීම මෙහි දී අවධාරණය නොකෙරේ. සිසුන් නිරන්තර ක්‍රියාකාරී පුද්ගලයන් බවට පත් කරවන, ඔවුන්ගේ ආකල්ප සුභවාදී ව වර්ධනය කරවන තරගය වෙනුවට සාමූහිකත්වයට හුරු කරවන ආකාරයේ වඩාත් ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් නිපුණතා තුළින් ශිෂ්‍ය සංවර්ධනය කිරීම අවශ්‍ය ය. මේ සඳහා පන්ති කාමරය තුළ ගොඩනගා ගැනීමට හැකි ඉගෙනුම් ක්‍රමවේද, විද්‍යාව හා තාක්ෂණයේ වෙනස්කම් ද සමාජයේ අවශ්‍යතා ද සලකා සංවිධානය කර ගත යුතු ය. එවැනි ක්‍රමවේද කිහිපයක් පහත දැක්වේ.

5.1 බිහිවැඩ/ක්ෂේත්‍ර වැඩ

භූගෝල විද්‍යාවේ බොහෝ සංකල්ප පහසුවෙන් සාධනය කර ගත හැක්කේ ක්ෂේත්‍රයේ කෙරෙන බිහි වැඩ හෙවත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගිනි. වඩා සංවිධානාත්මක ව හා පූර්ව සූදානමකින් යුතු ව, ඉවසිලිමත් ව හා සාමූහික සිදු කරන බිහි වැඩ මගින් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිය. මෙවැනි ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සංවිධානය කළ හැකි අවස්ථා කිහිපයකි.

(අ) ආසන්න පරිසරය යොදා ගැනීම
ශිෂ්‍යයාගේ ආසන්න පරිසරයපාදක කොට බිහි වැඩ ක්‍රියාත්මක කිරීමෙන් නිරීක්ෂණය, ගවේෂණය හා දත්ත රැස්කිරීම වැනි ඉගෙනුම් ක්‍රම පහසුවෙන් භාවිත කළ හැකිය. පාසලෙන් හෝ තම නිවසින් වඩා ඈතට නොගොස් ආසන්න පරිසරය තේරුම් ගැනීමට ද, ආසන්න පරිසරයේ සිදු වන විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ සෘජු අත්දැකීම් ලබා ගැනීමට ද ඒ අනුව පරිසර හිතකාමී ව ජීවත් වීමට හුරු වීමට ද මෙමගින් සිසුන්ට අවකාශ සැලසේ.

(ආ) පරිසරය සිතියම්ගත කිරීම
භූගෝල විද්‍යාවට අයත් මූලික සංකල්පය පහසුවෙන් සාධනය කළ හැක්කේ පරිසරයේ භූ විෂමතා ලක්ෂණ සිතියම් ගත කිරීමෙනි. ඒ මගින් ප්‍රායෝගික භූගෝල විද්‍යාව පිළිබඳ ව පවතින ශිෂ්‍ය කුසලතා තවදුරටත් වර්ධනය කළ හැකි ය. සිතියම්ගත කිරීමේ දී දිශාව, පරිමාණය හා සංකේත පිළිබඳ අවබෝධයක් ලබා

5.2 අධ්‍යාපන චාරිකා

පූර්ව සූදානමක් සහිත ව, අරමුණු පැහැදිලි ව හඳුනා ගෙන සුදුසු සංවිධානයක් සිසුන් අතරින් ම ගොඩනගා ගැනීමෙන් විෂය නිර්දේශයේ අදාළ මාතෘකා කිහිපයකට අවශ්‍ය දැනුම හා අවබෝධය පහසුවෙන් ලබාදීමට අධ්‍යාපන චාරිකා ප්‍රයෝජනවත් ය. ඒ තුළින් මූලික සංකල්ප ද පහසුවෙන් අවබෝධ කළ හැකි වේ.

5.3 වාර්තා සැකසීම

විවිධ මාධ්‍ය උපයෝගී කර ගෙන ක්ෂේත්‍රයෙන් රැස්කර ගන්නා දත්ත පාදක කොට වාර්තා සැකසීමත් ඒවා පන්ති කාමරයේ දී ප්‍රගුණ කිරීම හා සාකච්ඡා කිරීමත්, තවත් ආකාරයක ඉගෙනුම් ක්‍රමවේදයකි. මෙම කාර්ය කණ්ඩායම් ක්‍රමයට ඉටු කිරීමට සිසුන් පෙළඹවීමෙන් කණ්ඩායම් හැඟීම ඇති කිරීම මගින් යහපත් ප්‍රතිඵල ලැබිය හැකිය.

5.5 බිත්ති පුවත්පත්

බිත්ති පුවත්පත් මගින් ප්‍රකාශයට පත් කර විය හැකි තොරතුරු රාශියක් ඇත. ඉන් කිහිපයක් නම් ,

- බිහි වැඩ හා අධ්‍යාපන චාරිකා මගින් රැස්කර ගන්නා විවිධ තොරතුරු හා දත්ත
- අවට පරිසරය පිළිබඳ විවිධ වාර්තා
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් සිදුවන භූගෝල විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත තොරතුරු , වාර්තා , චිත්‍ර හා ඡායාරූප
- සිසු නිර්මාණ

5.5 ප්‍රදර්ශනය

පාසල මගින් ප්‍රදර්ශන සංවිධානය ද ඉගෙනුම් ක්‍රමවේදයකි. මෙවැනි ප්‍රදර්ශනයකට ඇතුළත් කළ හැකි උපාංග රාශියකි. එනම්,

- ක්ෂේත්‍රයෙන් සොයා ගන්නා ලද භූගෝල විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ද්‍රව්‍ය, විවිධ ප්‍රාණීන්, පැළෑටි වර්ග, පාෂාණ කැබලි ආදී වශයෙන්
- කාලගුණික දත්ත රැස්කිරීමට භාවිත කරන විවිධ සිතියම් ආකෘති හා බිත්ති පුවත්පත්

5.6 ක්ෂේත්‍ර පොත නිර්මාණය හා භාවිතය

පාසල ආසන්න පරිසරයේ හා ශ්‍රී ලංකාව තුළ සිදුවන භූගෝලීය වැදගත්කමක් ඇති විවිධ සිදුවීම් පිළිබඳ පින්තූර හා තොරතුරු එක්රැස් කිරීම ඉතා යෝග්‍යය. මෙසේ රැස්කර ගත් තොරතුරු සිසුවාගේ දැනුම වර්ධනයට හා නිර්මාණශීලී බව ඇති කිරීමට උපකාරී වේ.

පන්ති කාමරය තුළ සිදු කෙරෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉහත දැක් වූ ඉගෙනුම් ක්‍රමවේද සංශෝධන සහිත ව හා අවස්ථාවෝචිත ව යොදා ගැනීමට ගුරුවරුන්ට හැකියාවක් ඇත.

5.7 අන්තර්ජාලය හා මෘදුකාංග භාවිතය මගින් තොරතුරු ගවේෂණය.

- Encarta, encyclopedia.
- N. G. S.C. National Geographycal online

  http: // w.w.w. national geographic. com/
- Britanica
- UB GIAL - Internet Geography Information

  http: / w.w.w. geog. buffalo. edu/

  GIAL / netgeog. htm/
- Googal Earth

ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය

7.1 ඒකකය

අප ජීවත්වන ලෝකය

හැඳින්වීම

භූගෝල විද්‍යාව හැදෑරීමේ දී අප ජීවත්වන ලෝකය පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව අප ජීවත්වන ලෝකයේ හැඩය හා එහි ස්වරූපය පිළිබඳවත්, නිශ්චිත පිහිටීම හඳුනාගැනීම සඳහා උපකාරීවන අක්ෂාංශ හා දේශාංශ රේඛා පිළිබඳවත්, මහාද්වීප හා සාගර පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අවධාරණය කෙරේ.

එමෙන්ම අප ජීවත්වන ලෝකයේ ජනතාවගේ ජීවන රටාවල විවිධත්වයක් ද දක්නට ලැබේ. ඒ අනුව සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින යනුවෙන් රටවල් කාණ්ඩ දෙකකට බෙදා ඇත.

එසේ ම වර්තමානයේ මානව සංවර්ධන දර්ශකය පදනම් කරගෙන රටවල්, ඉහළ ආදායම් ලබන රටවල්, මධ්‍ය ආදායම් ලබන රටවල් හා පහළ ආදායම් ලබන රටවල් ලෙස ද කාණ්ඩ කර ඇත.

විෂය අන්තර්ගතය

7.1.1 හැඩය

ගංගා නිම්න ශිෂ්ටාචාර වාසීන් අතරින් මිසර, සුමේරියන් හා චීන ශිෂ්ටාචාර වාසීන් පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස හඳුනාගෙන තිබිණි. මිසරයේ ජීවත් වූ ඉරෙස්ටෝතිනිස් නැමති ගණිතඥයා මිසරයේ සයින් හා ඇලෙක්සැන්ඩ්‍රියා යන නගරවලට හිරු එළිය වැටීමේ කෝණ අනුව කරන ලද පර්යේෂණයකින් ලෝකය ගෝලාකාර වස්තුවක් බවත් හඳුන්වා දුනි. ඔහු විසින් පෘථිවියේ වායු ප්‍රමාණය නිවැරදි ව ගණනය කරන ලදී.

පෘථිවිය පැතලි වස්තුවක් යන අදහස ප්‍රචලිත වූයේ මධ්‍යකාලීන යුරෝපයේ ය. විද්‍යා පුනරුද සමයේ යුරෝපීයයන් විසින් පෘථිවිය ගෝලකාර වස්තුවක් බව සොයා ගන්නා ලදී. පෘථිවිය ගෝලකාර වස්තුවක් බව පෙන්වාදීමට චන්ද්‍රිකා ඡායාරූප පමණක් වුවද දැන් ප්‍රමාණවත් ය.

රූපය 1.1 පෘථිවියේ හැඩය

- පෘථිවිය ගණිතමය ගෝලයක් නොවන අතර ධ්‍රැව ප්‍රදේශ මඳක් පැතලි ලක්ෂයක් ගන්නා අතර සමක ප්‍රදේශය මඳක් පිටතට නෙරා ඇත.



රූපය 1.2 පෘථිවියේ විෂ්කම්භය

- පෘථිවි ආදර්ශ ගෝලය කක්ෂ තලයට අංශක 23 $^{1}/_{2}$ක ආනතියකින් පිහිටා තිබීම.



1.3 රූපය

7.1.2. අක්ෂාංශ

- භූගෝලීය අරමුණු ඉටුකර ගැනීම සඳහා පෘථිවි ගෝලයේ වෘත්තාකාරව ඇඳ ඇති මනඃකල්පිත රේඛා අක්ෂාංශ වශයෙන් හැඳින්වීම.
- පෘථිවි ගෝලය වටා හරි මැදින් තිරස් අතට විහිදෙන රේඛාව සමකය (අක්ෂාංශ 0^0) ලෙස හැඳින්වේ.
- සමකයට සමාන්තරව උතුරින් විහිදෙන තිරස් රේඛා උතුරු අක්ෂාංශ ලෙස ද
- සමකයට සමාන්තරව දකුණින් විහිදෙන තිරස් රේඛා දකුණු අක්ෂාංශ ලෙස ද හැඳින්වේ.
- අක්ෂාංශ රේඛා උතුරු ධ්‍රැවයේ දී හා දකුණු ධ්‍රැවයේ දී ලක්ෂයක් දක්වා කුඩා වෙමින් විහිදීම.

- ප්‍රධාන අක්ෂාංශ රේඛා 05කි.
  - අක්ෂාංශ 0^0 (සමකය)
  - උතුරු අක්ෂාංශ $23\ {}^{1}/_{2}{}^{0}$ (කර්කටක නිවර්තනය)
  - උතුරු අක්ෂාංශ $66\ {}^{1}/_{2}{}^{0}$ (ආක්ටික් වෘත්තය)
  - දකුණු අක්ෂාංශ $23\ {}^{1}/_{2}$ (මකර නිවර්තනය)
  - දකුණු අක්ෂාංශ $66\ {}^{1}/_{2}$ (ඇන්ටාක්ටික් වෘත්තය)



1. 4 රූපය

7.1.3 දේශාංශ

- පෘථිවි ගෝලයේ උතුරු ධ්‍රැව ලක්ෂයේ සිට දක්ෂිණ ධ්‍රැව ලක්ෂය දක්වා ලම්භකව විහිදෙන මනඃ කල්පිත රේඛා දේශාංශ වශයෙන් හැඳින්වීම.
- දේශාංශ 0^0 ග්‍රිනිච් රේඛාව ලෙස හැඳින්වීම
- ග්‍රිනිච් රේඛාවට නැගෙනහිරින් විහිදෙන දේශාංශ රේඛා නැගෙනහිර දේශාංශ වශයෙනුත් බටහිරින් විහිදෙන දේශාංශ රේඛා බටහිර දේශාංශ වශයෙනුත් හැඳින්වීම.
- ප්‍රධාන දේශාංශ රේඛා 2කි.
  - දේශාංශ 0^0 (ග්‍රිනිච් මධ්‍ය දේශාංශ)
  - දේශාංශ 180^0 (ජාත්‍යන්තර දින රේඛාව)



සිතියම 1.1
ප්‍රධාන දේශාංශ පිහිටීම

16

7.1.4 මහාද්වීප හා සාගර

- පෘථිවි ගෝලයේ ඇති විශාල භූමි ස්කන්ධ මහාද්වීප වශයෙන් හැඳින්වීම
- මහාද්වීප 7කි
  - ආසියා මහාද්වීපය
  - අප්‍රිකා මහාද්වීපය
  - යුරෝපා මහාද්වීපය
  - උ. ඇමරිකා මහාද්වීපය
  - ද ඇමරිකා මහාද්වීපය
  - ඕස්ට්‍රේලියා මහාද්වීපය
  - ඇන්ටාක්ටිකා මහාද්වීපය
- මහාද්වීප අතර පවතින කරදියෙන් පිරුණු විශාල ප්‍රදේශ සාගර වශයෙන් හැඳින්විම.
- **සාගර 5 කි**
  - ඉන්දියන් සාගරය
  - අත්ලන්තික් සාගරය
  - පැසිපික් සාගරය
  - උත්තර සාගරය (ආක්ටික් සාගරය)
  - දක්ෂිණ සාගරය (ඇන්ටාක්ටික් සාගරය)

නිපුණතාව : **භෞතික මානව භූදර්ශනයේ සංරචක ගතිලක්ෂණ හා ක්‍රියාවලී පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියාකරයි**

නිපුණතා මට්ටම : අප ජීවත්වන ලෝකය විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.1.1 ''පෘථිවියේ හැඩය හඳුනා ගනිමු''

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.1.1.1 කාර්ය පත්‍රිකාව
- ආදර්ශ ගෝලය
- ආදර්ශ ගෝලයක චිත්‍රයක්
- ප්ලාස්ටික් බෝලයක්
- සුදු කඩදාසි
- ගම්
- කතුරු
- ෆෙල්ට් පෑන්
- පෙළපොත්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1.1 :

- ආදර්ශ ගෝලය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න
- ආදර්ශ ලෝක ගෝලය පරීක්ෂා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න
- එහි රේඛා විහි දී ඇති ආකාරය නිරීක්ෂණය කිරීමට ඉඩ සලස්වන්න
- ආදර්ශ ලෝක ගෝලයේ ස්වභාවය දැක්වෙන කරුණු ඉස්මතු වනසේ ප්‍රශ්න කීපයක් අසමින් සාකච්ඡාවක් ගොඩ නගන්න
- පෙර දැනුම විමසමින් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන අයුරින් සාකච්ඡාවක යෙදෙන්න

- පෘථිවිය ගෝලකාර වස්තුවක් බව.
- පෘථිවිය අංශක 23 $^{1}/_{2}$ ඇලව පිහිටා ඇති බව.
- කල්පිත අක්ෂාංශ රේඛා උතුරු ධ්‍රැවයේ දී හා දකුණු ධ්‍රැවයේ දී ලක්ෂයක් දක්වා කුඩා වෙමින් විහිදී ඇති බව
- ධ්‍රැව ලක්ෂ දෙක සම්බන්ධ කරමින් උතුරේ සිට දකුණට දිවෙන කල්පිත රේඛා දේශාංශ රේඛා බව

මිනිත්තු 10

පියවර 7.1.1.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කීපයකට බෙදන්න
- නායකයන් පත් කර ගැනීමට අවස්ථාව දෙන්න
- ඇමුණුම 7.1.1.1 පිටපත් කරගෙන කණ්ඩායම්වලට බෙදා දෙන්න
- කාර්ය පත්‍රිකාවේ සඳහන් උපදෙස් අනුව සිසුන් ක්‍රියාකාරකම් නිරත කරවන්න.
- සිසුන් කාර්යයේ යෙදෙන අවස්ථා නිරීක්ෂණය කරමින් අඩු පාඩු ඇතොත් නිවැරදි කරන්න.

මිනිත්තු 30

පියවර 7.1.1.3 : ■ කණ්ඩායම් විසින් කරන ලද නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න
■ එක් එක් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
■ එම නිර්මාණවල දුබලතා ඇතොත් ඒවා නිවැරදි කරමින් සාකච්ඡා කරන්න.

- පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව.
- සමකයේ සිට උත්තර ධ්‍රැවයට හා දක්ෂිණ ධ්‍රැවයට ආදර්ශ ගෝලයේ අක්ෂාංශ වෘත්ත විහිදෙන බව.
- උතුරු අක්ෂාංශ 23 $^1/_2{}^0$ කර්කටක නිවර්තනය බව.
- ග්‍රිනිච් දේශාංශයට (0^0) බටහිරින් ඇති දේශාංශ බටහිර දේශාංශ බව නැගෙනහිර දේශාංශ බව.
- ග්‍රිනිච් දේශාංශයට නැගෙනහිරින් ඇති දේශාංශ නැගෙනහිර දේශාංශ බව .
- සෑම දේශාංශ රේඛාවක්ම උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය හා සම්බන්ධ බව.
- උතුරු අක්ෂාංශ 66 $^1/_2{}^0$ ආක්ටික් වෘත්තය බව.
- දකුණු අක්ෂාංශ 66 $^1/_2{}^0$ ඇන්ටාක්ටික් වෘත්තය බව.

මිනිත්තු 40

තක්සේරුව හා ඇගැයීම් නිර්ණායක

■ පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව විස්තර කරයි.
■ අක්ෂාංශ හා දේශාංශ රේඛා හඳුනා ගැනීමට ආකෘති නිර්මාණය වැදගත් බව අගයයි.
■ ආදර්ශ ගෝලයක අක්ෂාංශ හා දේශාංශ ඇඳ නම් කරයි.
■ කණ්ඩායමක් සමග වැඩ කිරීමේ දී සාමූහිකව වැඩ කරයි.
■ අධ්‍යයන කටයුතුවල දී ආදර්ශ ලෝක ගෝලය පරිහරණය කරයි.

ඇමුණුම 7.1.1.1

කාර්ය පත්‍රිකාව

■ සපයා ඇති ආදර්ශ ගෝලය නිරීක්ෂණය කරන්න.
■ සපයාගත් ප්ලාස්ටික් බෝලයක් (විෂ්කම්භය 10 cm පමණ) ඇසුරින් ඒ මත සුදු කඩදාසි පල්ප් අලවන්න.
■ ධ්‍රැව ලක්ෂ දෙක ලකුණු කරන්න.
■ ආදර්ශ ගෝලයේ දැක්වෙන ආකාරයට පැන්සලෙන් උතුරු හා දකුණු ලක්ෂ දෙක හරි මැදින් මැනගෙන තිරස් අතට දිවෙන වෘත්තාකාර රේඛාවක් අඳින්න. එය සමකය ලෙස නම් කරන්න.
■ සමකයේ එම උතුරු හා දකුණු ලක්ෂයන්හි හරිමැද තිරස් අතට දිවෙන වෘත්තාකාර රේඛාව ලකුණු කරන්න.
■ සමකයෙන් උතුරින් අංශක 23 $^1/_2{}^0$ රේඛාව කර්කටක නිවර්තනය ලෙස ද සමකයට දකුණින් අංශක 23 $^1/_2{}^0$ රේඛාව මකර නිවර්තනය ලෙස නම් කරන්න.
■ උතුරු අක්ෂාංශ අංශක 66 $^1/_2{}^0$ ආර්ටික් වෘත්තය ලෙස ද දකුණු අක්ෂාංශ අංශක 66 $^1/_2{}^0$ ඇන්ටාක්ටික් වෘත්තය ලෙස ද නම්කරන්න.
■ සමකයට ලම්බක ව ග්‍රීනිච් නගරය හරහා යන රේඛාව ඇඳ අංශක 0^0 ලකුණු කරන්න. පසුව අංශක 180^0 ගොඩබිම නොකැපෙන සේ ඇඳ එය සම්මත දින රේඛාව ලෙස නම්කරන්න.

නිපුණතාව : **භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලී පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියාකරයි.**

නිපුණතා මට්ටම : අප ජීවත්වන ලෝකය විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : 7.1.2 ''මහාද්වීප හා සාගර හඳුනා ගනිමු''

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.1.2.1 ඉන්දියන් සාගරය ආශ්‍රිත කලාපය දැක්වෙන සිතියම
- ඇමුණුම 7.1.2.2 ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව
- ඇට්ලස් පොත්, ලෝක ආකෘති සිතියම් (සෑම සිසුවකුටම 1 බැගින්)
- පාට පැන්සල්
- හාෆ්ෂීට්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.2.1 :

- ඇමුණුම 7.1.2.1 පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඒ තුළින් පෙන්නුම් කරන දේ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- ඇමුණුමේ සඳහන් උපදෙස් පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න

> - මහාද්වීප යනු පෘථිවි ගෝලයේ ඇති විශාල භූමි ස්කන්ධ බව
> - මහාද්වීප අතර පවතින කරදියෙන් පිරුණු විශාල ප්‍රදේශ සාගර බව
> - ලෝකයේ මෙවැනි මහාද්වීප සාගර තවත් හඳුනා ගත හැකි බව

මිනිත්තු 10යි

පියවර 7.1.2.2 :

- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.1.2.2 කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා එක් එක් කණ්ඩායමට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න
- අවශ්‍ය අවස්ථාවල දී කණ්ඩායම්වලට මඟපෙන්වීම් කරන්න.

මිනිත්තු 15

පියවර 7.1.2.3 :

- කණ්ඩායම්වලට ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එම කණ්ඩායමටම ක්‍රියාකාරකම් පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.
- එම නිර්මාණවල දුබලතා ඇතොත් ඒවා නිවැරදි කරමින් සාකච්ඡා කරන්න.
- සෙසු කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පිළිබඳ ව අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න
- සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න

> - ලෝකයේ මහාද්වීප 7ක් ඇති බව
> - ලෝකයේ සාගර 5ක් ඇති බව
> - ලෝකයේ සාගර හා මහාද්වීප ප්‍රමාණයෙන් එකිනෙකට වෙනස් බව
> - විශාලම මහාද්වීපය ආසියා මහාද්වීපය බව
> - විශාලම සාගරය පැසිපික් සාගරය බව
> - මහාද්වීප හා සාගර වෙන් වෙන්ව දැක්විය හැකි බව

මිනිත්තු 15

තක්සේරුව හා ඇගයීම

- මහාද්වීප හා සාගර යනු මොනවාද යන්න විස්තර කරයි.
- ගොඩබිම් ප්‍රදේශ ඉතා සීමිත බැවින් එය රැකගත යුතු බව පිළිගනියි.
- මහාද්වීප හා සාගර ලෝක සිතියමක ලකුණු කර සේයා කරයි.
- නිර්මාණශීලිව කටයුතු කරයි.
- අධ්‍යයන කටයුතුවල දී සිතියම් පරිහරණය කරයි.

ඇමුණුම 7.1.2.1

උපදෙස්

- මහාද්වීපවල ස්වභාව හඳුනා ගැනීමට සිසුන් යොමු කරවන්න .
- ලෝකයේ ව්‍යාප්ත සාගරවල ස්වභාවය හඳුනා ගැනීමට යොමු කරවන්න.

ඇමුණුම 7.1.2.2

ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව

- ඔබ කණ්ඩායමට සපයන ලද ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න
- දෙන ලද ලෝක ආකෘති සිතියමේ ලෝකයේ මහාද්වීප එකිනෙකට වෙනස් වර්ණ භාවිත කරමින් සේයා කරන්න.
- ලෝකයේ සාගර නිල් පාටින් පාට කරන්න.
- සාගර නම් කරන්න.

නිපුණතාව : **භෞතික මානව භූ දර්ශනයේ සංරචක ගතිලක්ෂණ හා ක්‍රියාවලී පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියාකරයි.**

නිපුණතා මට්ටම : අප ජීවත්වන ලෝකය විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.1.3. ලොව රටවල් ජීවන මට්ටම අනුව වර්ග කරමු

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.1.3.1 කාර්ය පත්‍රිකාව
- තෝරාගත් රටවල් නම් කරන ලද ලෝක සිතියමක්
- ඇට්ලස් ලෝක සිතියම් පොත
- ලෝක ආකෘති සිතියම්
- පාට පැන්සල්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.3.1 :
- ශ්‍රී ලංකාවට මෝටර් රථ ගෙන්වන රටක් හා ශ්‍රී ලංකාවට යන්ත්‍රෝපකරණ ගෙන්වන රටක් බැගින් නම් කරන ලෙස විමසමින් පාඩමට පිවිසෙන්න.
- එම දැනුම ඇසුරින් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් පිළිබඳ සාකච්ඡා කරන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන අයුරින් සාකච්ඡාවක් මෙහයවන්න.

> - ජීවන තත්ත්වය අනුව රටවල් විවිධත්වයක් ගන්නා බව
> - ඉහළ ජීවන තත්ත්වක් ගන්නා රටවල් සංවර්ධිත රටවල් බව
> - පහළ ජීවන තත්ත්වයක් ගන්නා රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල් බව
> - සංවර්ධිත හා සංවර්ධන වෙමින් පවතින රටවල්වල අභ්‍යන්තරයේ සංවර්ධනයේ විෂමතා දක්නට ඇති බව

මිනිත්තු 10

පියවර 7.1.3.2 :
- කණ්ඩායම් නායකයෙක් සහිතව සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- කණ්ඩායම් සියල්ලටම ලෝක සිතියම් බැගින් බෙදා දෙන්න.
- ඇමුණුම් අංක 7.1.3.1 කාර්යය පත්‍රිකාව බෙදා දෙන්න.
- ලෝක සිතියම් පොතේ සෑම මහද්වීපයකටම අයත් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් නියෝජනය වන පරිදි රටවල් සෙවීමට යොමු කරවන්න.

මිනිත්තු 15

පියවර 7.1.3.3 :
- කණ්ඩායම් විසින් සංවර්ධන හා සංවර්ධිත හා වෙමින් පවතින රටවල් ලෝක ආකෘති සිතියමෙන් සොයා වර්ණ කර නම් කර පෙන්වීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් නායකයා විසින් මෙම සිතියම් පන්තියට ඉදිරිපත් කරන්න.
- වර්ණ කර නම් කර ඇති සිතියම්වල දුබලතා හා ප්‍රබලතා සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.

■ පහත සඳහන් කරුණු ඉස්මතු වනසේ සමාලෝචනයක යෙදෙන්න.

- සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙන වෙනම හඳුනා ගැනීමට හැකි බව.
- ඉහළ ජීවන තත්ත්වයක් ඇති රටවල් සංවර්ධිත රටවල් ලෙස පිළිගන්නා බව.
- සංවර්ධිත රටවල් බොහෝමයක් ම ඇ.එ.ජ හා යුරෝපා මහද්වීපයට සීමා වී ඇති බව.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝමයක් ම අප්‍රිකා, ආසියා හා දකුණු ඇමරිකා මහාද්වීපවල දක්නට ඇතිබව
- මෙම රටවල් දෙවර්ගය ගැනම විෂමතා ඇති බව.

මිනිත්තු 15

තක්සේරුව හා ඇගයීම

■ ජීවන තතත්ත්වයන් අනුව රටවල් වර්ග දෙකට බෙදිය හැකි බව විස්තර කරයි.
■ ඉහළ ජීවන තත්වයක් ඇති රටවල් සංවර්ධිත රටවල් බව පිළිගනියි.
■ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙන් කර ලකුණු කරයි.
■ සහයෝගයෙන් කටයුතු කරයි.
■ ලෝකයේ රටවල සංවර්ධිත විෂමතාවයන් අවබෝධ කරගෙන ඒවා අවම කර ගැනීමට කළ හැකි දායකත්වයන් පැහැදිලි කරයි.

ඇමුණුම 7.1.3.1

කාර්ය පත්‍රිකාව

■ ඔබට දෙන ලද ලෝක සිතියම් පොත් උපයෝගි කරගෙන පහත සඳහන් රටවල් හඳුනා ගන්න.
■ ලෝක සිතියම් පොතේ සෑම මහද්වීපයක්ම අයත් වන පරිදි කැනඩාව, නොර්වේ, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව, චිලී, සෝමාලියාව, ඉතියෝපියාව, ටැන්සානියාව, ජපානය, ආර්ජන්ටිනාව යන රටවල් සොයන්න.
■ ඔබ හඳුනා ගත් රටවල් ආදර්ශ ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

7.2 ඒකකය

ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව

හැඳින්වීම

ඉන්දියන් සාගරයේ පිහිටා ඇති කුඩා දිවයිනක් වන ශ්‍රී ලංකාව සුවිශේෂ වූ භූගෝලීය අනන්‍යතාවයකට උරුමකම් කියයි. පුළුල් මහාද්වීප තටකය ආශ්‍රිතව විහිදෙන මුහුදු ප්‍රදේශය, පරිපාලන පහසුව සඳහා භූමියේ සීමා වෙන්කරගත් පරිපාලන මායිම්, ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව ආවේනික වූ දේශගුණික ලක්ෂණ හා ඒ අනුව හැඩගැසුණු ආර්ථික රටාව පිළිබඳ ගවේෂණය කර තොරතුරු ලබා ගැනිම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

විෂය අන්තර්ගතය

7.2.1 රාෂ්ට්‍රීය ප්‍රදේශය

- ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ ස්ථානීය පිහිටීම හා එහි සීමා
  - උ. අක්ෂාංශ 5^{0} $55^{/}$ සිට උ. අක්ෂාංශ $9^{0}51^{/}$
  - නැ. දේශාංශ 79^{0} $42^{/}$ සිට නැ. දේශාංශ 81^{0} $52^{/}$ දක්වා

- විශාලත්වය
  - ශ්‍රී ලංකාව පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා දිග කි. මී. 432 කි. පළල කොළඹ සිට සංගමන්කන්ද තුඩුව දක්වා කි.මී. 224 කි.

- දිවයිනේ මුළු බිම් ප්‍රමාණය ව.කි.මී. 65, 525 කි.

- රාෂ්ට්‍රීය මුහුද
  - වෙරළ ඉම රේඛාවේ සිට නාවික සැතපුම් 12කට නොවැඩි කලාපය මීට අයත් වේ (නාවික මීටර් 1852)
  - එම සීමාව තුළ වායුගෝලය, මුහුද, මුහුදු පත්ල හා එහි උප පාංශු ස්ථර පද්ධතිය අප රට සතුය.

සිතියම 2.1 ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය



මූලාශ්‍රය- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

7.2.2 පරිපාලන මායිම්

- ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු පහසුවීම සඳහා භූමිය විවිධ ඒකකවලට බෙදා ඇත.
  - පළාත් මායිම්
  - දිස්ත්‍රික්ක මායිම්
  - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම්
  - ග්‍රාම නිලධාරි කොට්ඨාස මායිම්
- සිතියම්වල සම්මත සංකේත යොදා ගනිමින් පරිපාලන මායිම් වෙන් කොට ඇත.

සිතියම 2.2 ශ්‍රී ලංකාවේ පරිපාලන මායිම්



7.2.3 දේශගුණය

- ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවත් සුවිශේෂ වූ දේශගුණික ලක්ෂණවලින් සමන්විත වීම.
- ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණ ලක්ෂණ හඳුනා ගැනීමට හැකි වුවත් සමස්තයක් ලෙස ගත්විට ශ්‍රී ලංකාව මෝසම් දේශගුණ කලාපයට අයත් වීම.

- ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක
  - සමකයට ආසන්නව පිහිටීම
  - දූපතක් ලෙස පිහිටීම
  - ඉන්දියානු උපමහාද්වීපයට ආසන්නව පිහිටීම
  - භූමියේ උස
  - සුළං බලපෑම
  - සාගරයේ සිට ඇති දුර

සිතියම 2.3 ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය



- ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය
  - වර්ෂාපතනය ලැබෙන ක්‍රම 3 කි.
  - සංවහන වර්ෂාව
  - මෝසම් වර්ෂාව
  - චාසුලි වර්ෂාව
- වර්ෂාපතනය ලැබෙන කාලසීමාවන්

- ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප
  - පහතරට තෙත් කලාපය
  - පහතරට වියළි කලාපය
  - කඳුරට තෙත් කලාපය
  - කඳුරට වියළි කලාපය
  - අර්ධ ශුෂ්ක කලාපය

සිතියම 2.4
නිරිත දිග මෝසම් සුළං හමන කාලයේ වර්ෂාපතන ව්‍යාප්තිය
(මැයි මැද සිට සැප්තැම්බර් දක්වා මි.මි.වලින්)



සිතියම 2.5
ඊසාන දිග මෝසම් සුළං හමන කාලයේ වර්ෂාපතන ව්‍යාප්තිය
(දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා මි.මි.වලින්)



7.2.4 ආර්ථිකය

- ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවලින් සමන්විත වීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැදගත් තැනක් කෘෂිකාර්මික අංශයට හිමිවීම.
- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙන් ඉහළ ප්‍රතිශතයක් කෘෂි අංශයේ නිෂ්පාදන කටයුතුවල නිරත වීම.
- රටේ ආදායමෙන් වැඩි කොටසක් කෘෂිකර්මය ආශ්‍රයෙන් ලැබීම.
- ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය, අමුද්‍රව්‍ය නිෂ්පාදනය, අපනයන සඳහා බෝග නිෂ්පාදනය කෘෂිකර්මය යටතේ වැදගත්ය.
- ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ග කිහිපයක්ම දක්නට ලැබීම
  - කැනීම් ආශ්‍රිත කර්මාන්ත (නිශ්කර්ෂක කර්මාන්ත) වැලි, මැටි, මිනිරන්, මැණික්, ඛනිජ
  - නිෂ්පාදන කර්මාන්ත - (ටයර්, ටියුබ්, සිමෙන්ති, සීනි ආදී)
  - සේවා කර්මාන්ත - (ප්‍රවාහන, සංචාරක, සන්නිවේදන, රක්ෂණ, බැංකු)
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කර්මාන්ත වැදගත්කමක් ගනී.
- ග්‍රාමීය ආර්ථික තුළ ගෘහ කර්මාන්ත ව්‍යාප්ත වීම.
- 80 දශකයෙන් පසු කර්මාන්ත ප්‍රාදේශීයකරණය වීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සේවා කර්මාන්තවල දායකත්වය ඉහළ අගයක් ගනී.

නිපුණතාව : **භෞතික මානව භූ දර්ශනයේ සංරචක ගතිලක්ෂණ හා ක්‍රියාවලී පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියාකරයි.**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.2.1 අපේ මව් බිමේ සීමා සොයමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.2.1.1 පුවත්පත් නිවේදනය
- ඇමුණුම 7.2.1.2 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.1.3 ශ්‍රී ලංකා (රාෂ්ට්‍රීය සීමාව දැක්වෙන) සිතියම
- ඇමුණුම 7.2.1.4 ආකෘති සිතියම්
- පාට පැන්සල් / පෙල්ට් පෑන්
- කෝදු / පැන්සල්
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1.1 :

- ඇමුණුම 7.2.1.1 පුවත්පත් නිවේදනය සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- එහි දැක්වෙන තොරතුරු පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - එක් එක් රටවලට මුහුදු සීමා වෙන් කර ඇති බව
> - තම රටට අයිති නොවන මුහුදු තීරයක ධීවර කර්මාන්තයේ නියැලීම දඩුවම් ලැබිය හැකි වරදක් බව
> - ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයේ අයිතිය ශ්‍රී ලංකා රජය සතු බව

මිනිත්තු 10

පියවර 7.2.1.2 :

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.2.1.2 කාර්ය පත්‍රිකාව හා ඇමුණුම 7.2.1.3 ක්‍රියාකාරකම සඳහා අදාළ සිතියම කණ්ඩායමකට එක බැගින් බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථාවල දී මගපෙන්වීම් හා උපදෙස් ලබා දෙන්න.
- ක්‍රියාකාරකමේ සමස්ත නිමැවුම පන්තියට ඉදිරිපත් කරවීමට සූදානම් කරවන්න.

මිනිත්තු 30

පියවර 7.2.4.3 :

- කණ්ඩායම් ක්‍රියාකාරකමේ නිමැවුම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව ඌනපූරණයට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වලටද අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - අක්ෂාංශ දේශාංශ පිහිටීම අනුව ශ්‍රී ලංකාවේ නිශ්චිත පිහිටීම දැක්විය හැකි බව
> - දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දුර කි. මී. 432ක් බව
> - කොළඹ සිට සංගමන්කන්ද දක්වා දුර කි.මී. 224ක් බව
> - වර්ග කි.මී. 65525ක ගොඩබිම් කොටසක් ශ්‍රී ලංකාව අයත් බව
> - ශ්‍රී ලංකාව වටා පිහිටි මහාද්වීපික බෑවුම් ප්‍රදේශය (මුහුදු ප්‍රදේශය) රාෂ්ට්‍රීය මුහුද ලෙස හඳුන්වන බව
> - ගොඩබිම් මායිමේ සිට නාවික සැ 12 කට නොවැඩි ප්‍රදේශයක් රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයට අයත් බව. (නාවික සැ. 1 = මීටර් 1852කි)
> - රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයේ දේශපාලන අයිතිය ශ්‍රී ලාංකීය රජය සතු බව
> - රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශ සීමාව තුළ වායුගෝලය, මුහුද, මුහුදු පත්ල හා එහි උප පාංශු ස්ථරයේ අයිතිය ශ්‍රී ලංකාව සතු බව
> - ජාත්‍යන්තර නාවික යාත්‍රාවලට අනවසරයෙන් ශ්‍රී ලංකා රාෂ්ට්‍රීය ප්‍රදේශයට ඇතුළුවිය නොහැකි බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාවය යටතේ රාෂ්ට්‍රීය ප්‍රදේශයේ සීමා නම් කරයි.
- ශ්‍රී ලාංකීය පුරවැසියන් වශයෙන් රාෂ්ට්‍රීය ප්‍රදේශයේ සීමා හඳුනාගත යුතු බව පිළිගනියි.
- ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය ප්‍රදේශය දැක්වෙන සිතියමක් නිර්මාණය කරයි.
- යම් කිසි නීති රීති පද්ධතියක් තුළ කටයුතු කිරීමට හුරුවක් ලබයි.
- ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය දේශ සීමා පිළිබඳ සමාජය දැනුවත් කිරීමට පෙළඹෙයි.

ඇමුණුම 7.2.1.1

පුවත්පත් නිවේදනයක්

සීසෙල්ස් දිවයිනට අයත් ධීවර යාත්‍රා 2 ක් 2005 දෙසැම්බර් 23 දින පෙ.ව. 4.35ට ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු තීරයේ මාළු අල්ලමින් සිටිය දී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඇත. පසුව පොලිස් නිලධාරීන් විසින් ධීවරයන් අත් අඩංගුවට ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පියවර ගන්නා ලදහ.

ඇමුණුම 7.2.1.2

කාර්ය පත්‍රිකාව

සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම අධ්‍යයනයකර පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

- සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හා ඒ ආශ්‍රිත තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න.
- ශ්‍රී ලංකාවේ නිර්පේක්ෂ ස්ථානීය පිහිටීම ලියා දක්වන්න.
- සිතියමේ ගොඩ බිම වටා ඇති මායිම් පිළිබඳ හොඳින් අධ්‍යයනය කර ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ ස්ථානීය පිහිටීම අක්ෂාංශ දේශාංශ අනුව ලියා දක්වන්න.
- ඔබට සපයා ඇති සිතියමේ පේදුරු තුඩුව හා දෙවුන්දර තුඩුව හඳුනාගෙන එම ස්ථාන යා කරමින් රේඛාවක් අඳින්න. එම ස්ථාන දෙක අතර දුර ලියා දක්වන්න.

- සපයා ඇති සිතියමේ කොළඹ හා සංගමන්කන්ද තුඩුව යා කරමින් රේඛාවක් අඳින්න. එම ස්ථාන දෙක අතර දුර ලියා දක්වන්න.
- ශ්‍රී ලංකාවේ වර්ග ප්‍රමාණය ලියා දක්වන්න.
- ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය ලා නිල් පාටින් සේයා කරන්න.
- රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයේ සීමාව ලියා දක්වන්න.
- අපේ රට වටා පිහිටි රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය අයිතිය පිළිබඳ වැදගත් තොරතුරු ලියා දක්වන්න.
- සිතියමට සුදුසු නමක් යොදන්න.

ඇමුණුම 7.2.1.3

ක්‍රියාකාරකම සඳහා සිතියම



නිපුණතාව : **භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියාකරයි.**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.2.2 පරිපාලන මායිම් හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.2.2.1 වෙන්දේසි ඉඩමක පිඹුරුපතක්
- ඇමුණුම 7.2.2.2 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.2.2.3 පරිපාලන මායිම් දැක්වෙන ශ්‍රී ලංකා සිතියම (එක් සිසුවකුට එක බැගින් සපයාගන්න)
- පාට පැන්සල්
- බ්ලේඩ් / කතුරු
- ගම්
- බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලක් (සිතියමේ ප්‍රමාණයට)
- ඇට්ලස් පොත්

විශේෂ උපදෙස් :

- පාඩමට නියමිත දිනට පෙර දින පන්තියේ සිසුන් දෙදෙනා බැගින් යුගල කරන්න. සිසුන් ඔත්තේ සංඛ්‍යාවක් ඇති විට ඉතිරි සිසුවා එක් යුගලයකට ඇතුළත් කරන්න.
- සපයා ඇති සිතියම එම ප්‍රමාණයේ බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලක අලවා ගැනීමට උපදෙස් දෙන්න
- එක් එක් පළාත් විවිධ ලා වර්ණවලින් පාට කිරීමට උපදෙස් දෙන්න
- සිතියමේ දක්වා ඇති පළාත් මායිම් ඔස්සේ එක සිසුවෙකුටදල අනෙක් සිසුවාට දිස්ත්‍රික් මායිම් ඔස්සේ ද කොටස් කපාගෙන ඒමට උපදෙස් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.2.1 :

- ඇමුණුම 7.2.2.1 හි සඳහන් වෙන්දේසි ඉඩමක පිඹුරුපත පන්තියේ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එය නිරීක්ෂණය කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක යෙදෙන්න.

> - ඉඩමක් කොටස් කිරීමේ දී මායිම් රේඛාවන්ගෙන් වෙන් කොට හඳුනා ගත හැකි බව.
> - ඉඩමේ සීමාව හා කොටස් වෙන් කිරීමේ දී විවිධ ක්‍රම මගින් සලකුණු කරන බව (කුඤ්ඤ යෙදීම වැනි ක්‍රම)
> - සීමා වෙන් කර ගැනීම, ගැණුම් කරුවාට එම ඉඩම සංවර්ධනය කර ගැනීමේ දී ඉතා ප්‍රයෝජනවත් වන බව.

මිනිත්තු 10

පියවර 7.2.2.2 :

- පෙර දින වෙන් කළ පරිදි සිසුන් දෙදෙනා බැගින් යුගල කරන්නග
- ඇමුණුම 7.2.2.2 හි සඳහන් කාර්ය පත්‍රිකාවේ දැක්වෙන ක්‍රියාකාරකම පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

■ අදාළ පරිපාලන ඒකක පිළිබඳ ඉගෙන ගැනීමට සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
■ අවශ්‍ය අවස්ථාවල දී මගපෙන්වීම් හා උපදෙස් ලබා දෙන්න.
■ ක්‍රියාකාරකම තුළ දී ඉගෙන ගත් සමස්තය පොදු කණ්ඩායමට ඉදිරිපත් කරවීමට සූදානම් කරවන්න.

මිනිත්තු 30

පියවර 7.2.2.3 : ■ එක් යුගලයකින් සුළු කොටසක් බැගින් සියලුම යුගල වලින් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න (ඉදිරිපත් කළ යුතු කොටස පිළිබඳ ගුරුවරයා විසින් සිසුන්ව දැනුවත් කරන්න)
■ ඉදිරිපත් කළ යුගලය ලවා ප්‍රථම ඌණපූරණය කරවන්න.
■ සෙසු සිසුන්ට සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
■ සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන්නේ සමාලෝචනයක යෙදෙන්න.

■ පරිපාලන පහසුව සඳහා ශ්‍රී ලංකාව කුඩා ඒකක වලට බෙදා ඇති බව
■ ශ්‍රී ලංකා පළාත් නවයකට හා දිස්ත්‍රික්ක විසිපහකට බෙදා ඇති බව
■ පරිපාලන මායිම් වෙන් කිරීමේ දී භෞතික ලක්ෂණ මායිම් ලෙස යොදාගෙන ඇති බව
■ දිස්ත්‍රික්කයක් තවත් කුඩා පරිපාලන ඒකක ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් වෙන් කර ඇති බව
■ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයකට වෙන් කර ඇති බව
■ පරිපාලන කටයුතු කාර්යක්‍ෂමව හා ඵලදායිව කිරීමට මෙම බෙදීම් ඉවහල් වන බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම
■ ශ්‍රී ලංකාවේ පරිපාලන මායිම් නම් කරයි.
■ පාලන පහසු ව සඳහා විවිධ පරිපාලන ඒකක සකස්කර ඇති බව පිළිගනියි.
■ පරිපාලන ඒකක හඳුනා ගැනීමේ ක්‍රීඩාවක නිරත වෙයි.
■ කාර්යන් විමධ්‍යගත කිරීම තුළින් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව කටයුතු කිරීමට පෙළඹෙයි.
■ සාමූහිකත්වය තුළින් සාර්ථකත්වය කරා ලගා වීමට හුරුවක් ලබයි.

ඇමුණුම 7.2.2.1

රූප සටහන
වෙන්දේසි ඉඩමක පිඹුරුපතක්



ඇමුණුම 7.2.2.2

කාර්ය පත්‍රිකාව

- සපයාගෙන ඇති සිතියම් කැබලි උපයෝගී කරගෙන පළාත් හා දිස්ත්‍රික්ක හඳුනා ගනිමින් සිතියම තිබු පරිදි නැවත සකස් කරන්න.
- ඉන් පසු කණ්ඩායමේ දෙදෙනා කාඩ්පත් කට්ටල දෙක මාරු කරගෙන නිවැරදිව සකස් කරමින් දිස්ත්‍රික් හා පළාත් හඳුනා ගන්න.

ඇමුණුම 7.2.2.3 සඳහා සිතියම පරිපාලන මායිම් දැක්වෙන ශ්‍රී ලංකා සිතියම



පසු වැඩ

1. පළාත් මායිම දක්වන සංකේතය අඳින්න.
2. දිස්ත්‍රික් මායිම දක්වන සංකේතය අඳින්න.
3. ශ්‍රී ලංකාව බෙදා ඇති දිස්ත්‍රික්ක ගණන කීයද?
4. එක් එක් පළාතට අයත් දිස්ත්‍රික්ක වෙන වෙන ම ලියන්න.
5. පළාත් හා දිස්ත්‍රික්ක ලෙස ශ්‍රී ලංකාව බෙදීමේ අරමුණ කුමක් ද?
6. පළාත් හා දිස්ත්‍රික්ක වෙන් කිරීමේදී යොදා ගෙන ඇති භෞතික මායිම් මොනවා ද?
7. ඔබ වාසය කරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය කුමක් ද?
8. ඔබ වාසය කරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය කුමක් ද?
9. ඔබ වාසය කරන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කය හා පළාත නම් කරන්න.

නිපුණතාව : භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලී අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි ග

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.2.3 ශ්‍රී ලංකාවේ දේශගුණයේ සුවිශේෂත්වය දකිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.2.3.1 පිවිසීම සඳහා රූපය
- ඇමුණුම 7.2.3.2 කාර්ය පත්‍රිකාව
- ශ්‍රී ලංකාවේ වර්ෂාපතන සිතියම්
- ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව සිතියම්
- ශ්‍රී ලංකාවේ දේශගුණ කලාප සිතියම
- පෙල්ට් පෑන්
- පෙළ පොත
- කෝදු
- A 4 කඩදාසි
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.3.1 :

- ඇමුණුම 7.2.3.1 හි සඳහන් රූප පිළිබඳ අධ්‍යයනයට අවස්ථාව සලසන්න.
- එහි සඳහන් තොරතුරු පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක යෙදෙන්න.

■ නුවරඑළිය ප්‍රදේශය ශීත ප්‍රදේශයක් බව
■ අහස වළා කුළුවලින් බර වී පවතින බව
■ නුවරඑළියේ පවතින අඩු උෂ්ණත්වය ගතේ වෙහෙස නිවන බව
■ ලංකාව තුළ විවිධ දේශගුණ කලාප ඇති බව

මිනිත්තු 10

පියවර 7.2.3.2 :

- පන්තියේ සිසුන් කණ්ඩායම් 6කට බෙදන්න.
- ඇමුණුම 7.2.3.2 කණ්ඩායම් 6ට බෙදා දෙන්න
- කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය මග පෙන්වීම් හා උපදෙස් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම තුළ දී සපයාගත් තොරතුරු පොදු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

මිනිත්තු 30

පියවර 7.2.3.3 :

- කණ්ඩායම් ක්‍රියාකරකම් ඇසුරින් සැකසූ වගු සටහන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායම පළමුවෙන්ම ඌන පූරණය කරවන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

- සිසුන්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් සමස්ත පාඩම පිළිබඳ පහත සඳහන් කරුණු ඇතුළත්වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ විෂමතා කෙරෙහි විවිධ සාධක බලපාන බව
> - නිරිත දිග මෝසම් වැසි දිවයිනේ නිරිත දිග ප්‍රදේශයට වඩාත් බලපාන බව
> - ඊසාන දිග මෝසම නිරිත දිග මෝසමට වඩා අඩු වර්ෂා පතනයක් ලබා දෙන බව
> - වාසුලි වර්ෂාපතනය බොහෝ විනාශකාරී ප්‍රතිඵල ගෙන දෙන වර්ෂාවක් බව
> - දේශගුණ කලාප 5ක් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන බව
> - සංවහන වර්ෂාපතනය ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට ඕනෑම කාලයක දී ලැබෙන බව
> - ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවත් විවිධ දේශගුණික ලක්ෂණ දක්නට ලැබෙන බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණික ලක්ෂණ විස්තර කරයි.
- දේශගුණ විවිධත්වය කෙරෙහි විවිධ භෞතික සාධක බලපාන බව පිළිගනියි.
- ශ්‍රී ලංකාවේ දේශගුණික ලක්ෂණ දැක්වෙන වගු සටහන් සකස් කරයි.
- වර්ෂාපතනය ලැබෙන කාල අනුව සිය වැඩ කටයුතු හසුරුවා ගැනීමට අත්දැකීමක් ලබයි.
- ශ්‍රී ලංකාවේ දේශගුණික විවිධත්වය පිළිබඳ අන් අය දැනුවත් කිරීමේ හැකියාව ලබයි.

ඇමුණුම 7.2.3.1

පිවිසීම සඳහා රූපය:-

ඇමුණුම 7.2.3.2

කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම: ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් වගු සටහන සම්පූර්ණ කරන්න.

උෂ්ණත්වය කෙරෙහි බලපාන සාධක	උෂ්ණත්වයේ ස්වභාවය

සපයාගත් තොරතුරු පොදු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

2 කණ්ඩායම :ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ නිරිතදිග මෝසම් වර්ෂාපතනය පිළිබඳ තොරතුරු එක් රැස් කිරීමයි. ඒ සඳහා පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.

බහුලව ව්‍යාප්ත වන ප්‍රදේශ	වැසි ලැබෙන කාලය	විශේෂ ලක්ෂණ

සපයාගත් තොරතුරු පොදු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

3 කණ්ඩායම :ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ ඊසාන දිග මෝසම් වර්ෂාපතනය පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරීමයි.

බහුලව ව්‍යාප්තවන ප්‍රදේශ	වැසි ලැබෙන කාලය	විශේෂ ලක්ෂණ

සපයාගත් තොරතුරු පොදු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

4 කණ්ඩායම :ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ සංවහන වර්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කිරීමයි.

බහුලව ව්‍යාප්තවන ප්‍රදේශ	වැසි ලැබෙන කාලය	විශේෂ ලක්ෂණ

සපයාගත් තොරතුරු පොදු කණ්ඩායම ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

5 කණ්ඩායම :ශ්‍රී ලංකාවේ වාසුළි වර්ෂාපතනය පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.

බහුලව ව්‍යාප්තවන ප්‍රදේශ	වැසි ලැබෙන කාලය	විශේෂ ලක්ෂණ

සපයාගත් තොරතුරු පන්තියේ සිසුන්ට ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

6 කණ්ඩායම :ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.

දේශගුණ කලාපය	ව්‍යාප්තිය	විශේෂ ලක්ෂණ

සපයාගත් තොරතුරු පන්තියේ සිසුන්ට ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

නිපුණතාව : භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලී අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.2.4 අප රට ආර්ථික තතු විමසමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම්

- ඇමුණුම 7.2.4.1 - කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පින්තූර
- ඇමුණුම 7.2.4.2 කාර්ය පත්‍රිකාව
- පින්තූර කාඩ්පත් - (කෘෂිකර්මාන්තය හා සම්බන්ධ)
- ඩිමයි කොළ
- ගම්
- කතුරු
- සෙලෝටේප්,
- පෙල්ට් පෑන්
- රූලක්
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.4.1 :

- ඇමුණුම 7.2.4.1 හි සඳහන් පින්තූර/ වීඩියෝ දර්ශනයක් / පරිඝණක රූප රාමුවක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- පින්තූර හොඳින් නිරීක්ෂණයට අවස්ථාව ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාවක යෙදෙන්න.

> - කෘෂිකර්මාන්තය යටතේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ බෝග වගා කරන බව
> - ශ්‍රී ලංකා ආර්ථිකයේ කෘෂිකර්මයට වැදගත් තැනක් හිමිවන බව
> - ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ග කිහිපයක් ඇති බව
> - එක් එක් ප්‍රදේශයට ආවේනික වූ කර්මාන්ත ඇති බව
> - සේවා කර්මාන්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් තැනක් ගන්නා බව

මිනිත්තු 10

පියවර 7.2.4.2 :

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- 7.2.4.2 ඇමුණුමෙහි සඳහන් කාර්ය පත්‍රිකාව කණ්ඩායමට එක බැගින් බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථාවලදී මගපෙන්වීම් හා උපදෙස් ලබා දෙන්න.
- ක්‍රියාකාරමේ සමස්ත නිමැවුම පන්තියට ඉදිරිපත් කරවීමට සූදානම් කරවන්න.

මිනිත්තු 30

පියවර 7.2.4.3 :

- කණ්ඩායම් ක්‍රියාකරකම් නිමැවුම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව ඌනපූරණයට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා ප්‍රකාශ කිරීමට ඉඩ සලස්වන්න.
- සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - ශ්‍රී ලංකා ආර්ථිකයේ කෘෂිකර්මික අංශය කැපී පෙනෙන බව
> - ආහාර බෝග නිෂ්පාදනය, අපනයනය සඳහා බෝග නිෂ්පාදනය, අමු ද්‍රව්‍ය නිෂ්පාදනය, කෘෂිකර්මය ආශ්‍රිතය කැපී පෙනෙන බව
> - එක් එක් ප්‍රදේශවල දේශගුණයට අනුව විවිධ බෝග වර්ග ව්‍යාප්ත වී ඇති බව
> - අපනයන බෝග නිෂ්පාදනය විදේශ විනිමය උපයමින් අපේ ආර්ථිකය පෝෂණය කරන බව
> - අමුද්‍රව්‍ය ලෙස වගා කරන බෝග ආශ්‍රිතව විවිධ කර්මාන්ත ස්ථානගත වී ඇති බව
> - ගෘහ කර්මාන්ත ගම්බද ප්‍රදේශවල ආර්ථිකයට නව ජීවයක් ලබා දෙන බව
> - එක් එක් ප්‍රදේශවලට ආවේනික වූ කර්මාන්ත රැසක් ඇති බව
> - මහා පරිමාණ කර්මාන්ත රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශය විසින් ද පවත්වා ගෙන යන බව
> - ප්‍රාදේශීයව කර්මාන්ත ව්‍යාප්තිය රටේ ආර්ථිකයට ඉහළ නැංවීමට දායක වී ඇති බව
> - රට පුරා ව්‍යාප්ත වූ සේවා කර්මාන්ත රැසක් ඇති බව
> - සේවා ආශ්‍රිත රැකියා බහුල ලෙස ව්‍යාප්ත වී ඇති බව
> - ප්‍රවාහන, බැංකු, රක්ෂණ, වෙළෙඳම, සංචාරක, අධ්‍යාපන, සෞඛ්‍ය, යන අංශ යටතේ සේවා ව්‍යාප්ත වී ඇති බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාවේ ආර්ථිකය යටතේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා ආශ්‍රිත විශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ප්‍රාදේශීයව ව්‍යාප්ත වූ කර්මාන්ත කෘෂිකාර්මාන්තයත්, සේවාත් රටේ ආර්ථිකය ඉහළ නැංවීමට දායක වී ඇති බව පිළිගනියි.
- ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ අංශවල පින්තූර එකතුවක් සකස් කරයි.
- රටේ ආර්ථික සංවර්ධනයට දායක වීමෙන් සාර්ථක පුරවැසියකු ලෙස ජීවත්වීමට පෙළඹෙයි.
- අතීත උරුමයන් ලෙස දිගුකාලීනව පැවතෙන කර්මාන්ත ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකමක් බව පිළිගෙන කටයුතු කරයි.

ඇමුණුම 7.2.4.1

මෙහි සඳහන් පින්තූර පන්තියේ ප්‍රදර්ශනය කරන්න

කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පින්තූර

ගෘහ කර්මාන්ත





සෞඛ්‍යසේවා

බැංකුවක්

සන්නිවේදය



ඇමුණුම 7.2.4.2

කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම

ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාවය යන මාතෘකාව යටතේ 'කෘෂිකර්මාන්තය' පිළිබඳ තොරතුරු ඇතුළත් පින්තූර එකතුවක් සකස් කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යයයි.

- මෙහි දී පහත සඳහන් මෘතෘකා යටතේ පින්තූර හා තොරතුරු එක්රැස් කරන්න.
  - පරිභෝජනය සඳහා ආහාර ද්‍රව්‍ය නිපදවීම උදා:- වී, ධාන්‍ය, එළවලු, පළතුරු, සත්ත්ව පාලනය හා ධීවර කර්මාන්තය
  - අපනයනය සඳහා බෝග වගාව උදා:- තේ, පොල්, රබර්, කෝපි, කුරුඳු, බඩ ඉරිඟු ආදිය.
  - පින්තූර ඇසුරෙන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති බෝග වර්ග පිළිබඳ තොරතුරු එක් රැස් කරන්න. උදා:- කඳුරට - එළවලු, තේ, ආදිය
හේන් ගොවිතැන - ධාන්‍ය එළවලු ආදිය.
- ඔබ සපයාගත් තොරතුරු පන්තියේ පොදු කණ්ඩායමට ඉදිරිපත් කරීමට සුදානම් කරගන්න.

2 කණ්ඩායම

ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාවය යන මාතෘකාව යටතේ 'කර්මාන්ත' පිළිබඳ තොරතුරු ඇතුළත් පින්තූර එකතුවක් සකස් කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කර්යයයි.

- මෙහි දී පහත සඳහන් මාතෘකා යටතේ පින්තූර හා තොරතුරු එක් රැස් කරන්න.
  - ගෘහ කර්මාන්ත උදා:- වළං, වේවැල් භාණ්ඩ, රෙදි විවීම ආදිය
  - අතීතයේ සිට ලංකාවේ විශේෂ ප්‍රදේශවලට සීමා වී ඇති කාර්මාන්ත
උදා:- දුම්බර- පැදුරු, කිරිවවුල - පිත්තල භාණ්ඩ, අම්බලන්ගොඩ - වෙස් මුහුණු,
ගාල්ල- කළුවර ලී කැටයම්, මාතර - බීරළු ආදිය.
  - කුඩා කර්මාන්ත උදා:- සිසිල් බීම, විස්කෝතු, ලේස් රෙදි, ඉලාස්ටික්, කාබන් කඩදාසි ආදිය.
  - මහා පරිමාණ කර්මාන්ත උදා:- සිමෙන්ති, සීනි, යකඩ හා වානේ, ටයර් ආදිය.
  - ප්‍රාදේශීයව ව්‍යාප්ත වී ඇති අපනයන සැකසුම් කර්මාන්ත
උදා:- නිමි ඇඳුම්, දැව නිෂ්පාදන, පිගන් ගඩොල් ආදිය
- ඔබ සපයාගත් තොරතුරු හා පින්තූර පන්තියේ පොදු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

3 කණ්ඩායම

ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාවය යන මාතෘකාව යටතේ 'සේවා' පිළිබඳ තොරතුරු ඇතුළත් පින්තූර එකතුවක් සකස් කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යයයි.

- මෙහි දී පහත සඳහන් මාතෘකා යටතේ පින්තූර හා තොරතුරු එක්රැස් කරන්න.
  - ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපනය, බැංකු, සන්නිවේදන, රක්ෂණ, වෙළෙඳ හා සංචාරක යන අංශ යටතේ පින්තූර හා තොරතුරු එක්රැස් කරන්න.
  - ශ්‍රී ලංකා ආර්ථිකයේ සේවා අංශයේ දායකත්වය පිළිබඳ ඔබ සපයාගත් පින්තූර හා තොරතුරු ඇසුරු කරගෙන නිර්මාණයක් සකස් කරන්න. පොදු කණ්ඩායම ඉදිරිපත් කිරීමට සුදානම් කරන්න.

7.3 ඒකකය

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

හැඳින්වීම

ශ්‍රී ලංකාව සුවිශේෂවුත් සංකීර්ණවුත් භූ දර්ශන රැසකින් සමන්විත වූ දූපතකි. මධ්‍යම කඳුකරය, වියළි කලාපය, තෙත් කලාපය, වෙරළ තීරය ඉන් ප්‍රධාන භූ දර්ශන වේ. කිසියම් ප්‍රදේශයක භූ දර්ශනය එම ප්‍රදේශයේ භෞතික ලක්ෂණවල ස්වභාවයම පමණක් නොවන අතර මානව සාධක හා භෞතික සාධක අතර ඇති අන්තර් සම්බන්ධතාව තුළින් ප්‍රදර්ශනය වන ස්වභාවය වේ.

එක් එක් භූ දර්ශනය තුළ ද සුවිශේෂ තත්ත්වයක් ප්‍රාදේශීයව දැකිය හැකි වේ. මේ සියලු ස්වභාවයන් අධ්‍යයනය කිරීමට අපහසු කරුණකි. එක් එක් භූ දර්ශනයක් පිළිබඳ මූලික තොරතුරු සහ දැනුමක් ලබාදීම මෙම ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කෙරෙන අතර තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය පිළිබඳ ව සුවිශේෂිව තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම ද අපේක්ෂිත කෙරේ.

■ **විෂය අන්තර්ගතය**

7.3 ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

■ **භූ දර්ශනය හැඳින්වීම**

භූ තලයමත භෞතික හා මානුෂ ක්‍රියාවලී අතර පවත්නා සම්බන්ධතාව තුළින් ප්‍රදර්ශනය කෙරෙන ස්වභාවය භූ දර්ශනය ලෙස හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන 4ක් හඳුනාගත හැකි ය.

- මධ්‍යම කඳුකර භූ දර්ශනය
- වියළි කලාපීය භූ දර්ශනය
- තෙත් කලාපීය භූ දර්ශනය
- වෙරළතීරය ආශ්‍රිත භූ දර්ශනය

සිතියම 3.1

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය



මධ්‍යම කඳුකරයේ භූ දර්ශනය

මධ්‍යම කඳුකරයේ භූ දර්ශනයේ උස් වූ කඳු බිම්, ප්‍රපාතාකාර බෑවුම්, කඳු වැටි, දිය ඇලි හා සානු කැපිපෙනන ලක්ෂණ ලෙස හඳුනා ගත හැකි ය. භෞතික පරිසරයට අනුගත වූ මානව ක්‍රියාකාරකම් රාශියකි. කඳු වටා දිවෙන වංගු සහිත වූ මහාමාර්ග හා දුම්රිය මාර්ග ද කඳු බෑවුම්වල ඉදි වූ නිවාස ද විවිධ වූ වගාවන් ද ඒ අතර සුවිශේෂී වේ. ශිත දේශගුණයට ඔරොත්තු දෙන ඇඳුම් පැළඳුම් ද මෙහි විශේෂිත ලක්ෂණයකි. විවිධ වූ ශාක වර්ගයන් ගෙන් හෙබි සාම්ප්‍රදායික ගෙවතු ද මධ්‍යම කඳුකරය පුරා ව්‍යාප්ත ව ඇත. හෙල්මළු ආකාරයට ඇති වී වගාබිම් මිනිසාගේ පාරිසරික අනුගතවීම මනාව පෙන්වයි.

- මධ්‍යම කඳුකරයේ කැපීපෙනෙන භෞතික සාධක අතර පිදුරුතලාගල, සමනළ, නමුණුකුළ, නකල්ස් රාගල, හපුතලේ ආදී කඳු පන්ති පිහිටීම
- කඳු පන්ති අතර පිහිටි මහනුවර, හැටන්, වැලිමඩ, හෝර්ටන් තැන්න ආදී සානු පිහිටා තිබීම
- ප්‍රධාන ගංගා කිහිපයකම ආරම්භක ස්ථානය වීම හා අලංකාර දිය ඇලි පැවතීම (මහවැලි, කළු, දුන්හිඳ, දියලුම ආදී)
- සුවිශේෂී වූ ශාක හා සත්ත්ව විශේෂතා පැවතීම
- වගාවන් අතර තේ ,එළවලු වගාව සහ මල් වගාව වැදගත් කමක් දැරීම

තේ වගාව

- භූමියේ බෑවුම් ස්වරූපය හා දේශගුණය අනුව මධ්‍යම කඳුකරය තුළ ව්‍යාප්ත වී ඇති තේ වගාව අප රටේ ප්‍රධාන අපනයන බෝගයක් වීම
- තේ වගාව හා බැඳුණු රැකියා හා විශේෂ වූ ජීවන රටාවක් බිහිවීම
- තේ කර්මාන්ත ශාලා, නිවාස, පාසල්, හා පරිවහන පද්ධති බිහිවීම
- නුවරඑළිය, බදුල්ල, මහනුවර, කෑගල්ල හා මාතලේ දිස්ත්‍රික්කවල තේ වගාව ව්‍යාප්ත විම

මධ්‍යම කඳුකරයේ කඳු පන්ති

රූපය 3.1



මධ්‍යම කඳුකරයේ සානු

රූපය 3.2



වානිජ එළවලු වගාව

- මධ්‍යම කඳුකරයේ සමතලා බිම් ප්‍රදේශයන්හි බහුලව ව්‍යාප්ත වීම බෑවුම් ප්‍රදේශවල දී වගා කටයුතු කිරීම.
- එළවලු වගාව සඳහා සුදුසු වර්ෂාපතනයක් (මිලි මීටර් 200-300) හා සුදුසු උෂ්ණත්වයක් (16° -27°)පැවතීම
- එළවලු වගාව හා බැඳුණු ජීවන රටාවක් ගොඩනැගීම
- වෙළෙඳාම හා සම්බන්ධ වු මානව අන්තර් සම්බන්ධතා ගොඩ නැගීම
- එළවලු වගාව ආශ්‍රිත විවිධ රැකියා ක්ෂේත්‍ර බිහිවීම (ඇසුරුම් උපකරණ සැකසීම, අපනයනය සඳහා එළවලු ඇසුරුම් කිරීම, තේරීම සම්බන්ධ හා ප්‍රවාහනය ආශ්‍රිත රැකියා)
- මධ්‍යම කඳුකරයේ නැගෙනහිර (වැලිමඩ, බණ්ඩාරවෙල හා බදුල්ල) හා මධ්‍යම කඳුකරයේ බටහිර සමතලා බිම් වල ව්‍යාප්ත වීම

තෙත් කලාපීය භූ දර්ශනය

සමතලා බිම් මෙන්ම අභ්‍යන්තර හෙල් වැටි වලින් ද සමන්විත වු තෙත් කලාපය ජෛව විවිධත්වයකින් යුක්තය. සුවිශේෂි වු ශාක පද්ධතින්ගෙන් හා සත්ත්ව විශේෂයන්ගෙන් සමන්විත ය. වසර පුරාම අධික වර්ෂාපතනයක් තිබීම නිසා ඝන යටිරෝපනයක් සහිත උස ගස්වලින් යුක්ත වු සුවිශේෂි වනාන්තර පද්ධතියක් දක්නට ලැබෙන අතර, විශාල ජල ප්‍රමාණයක් ගලා යන ගංගා රාශියක් පිහිටා ඇත. නිරිත හා බටහිර දිශාගතව අධික ජන ඝනත්වයකින් ද නාගරික ප්‍රදේශ හා නිවාස සංකීර්ණ ද, කර්මාන්ත ශාලා ද, විවිධ වු වගාවන් ගෙන් ද යුක්ත වී ඇත. වී, රබර්, පොල්, බෝග අතර ප්‍රධාන වේ. විවිධ වු උප සංස්කෘතීන් ගොඩනැගී තිබීම (පැල්පත් ආශ්‍රිත මිනිසුන්ගේ ජීවන රටාව, නිවාස සංකීර්ණ වල ජීවත්වන්නාවුන්ගේ ජීවන රටාව ආදී)

නාගරික ජනාවාස

- අධික ජන සංඛ්‍යාවක් ඒකරාශී වීම නිසා නාගරික නිවාස බිහිවීම (තට්ටු නිවාස, නිවාස සංකිර්ණ, සුඛෝපභෝගි නිවාස, කුඩා නිවාස හා පේලි ගෙවල් බිහිවීම)
- මංසන්ධි හා සංකීර්ණ වු මහාමාර්ග හා දුම්රිය මාර්ග ජාලයක් පැවතීම
- කර්මාන්ත ශාලා (කුඩා හා මහා පරිමාණ) ව්‍යාප්ත ව තිබීම
- ප්‍රධාන නගර (වෙළෙඳ, පරිපාලන) පිහිටා තිබීම
- නාගරික ජනාවස ආශ්‍රිත විශේෂ වු උප සංස්කෘතීන් බිහිවීම

පිටාර තැනි

- ප්‍රධාන ගංගා රාශියක් පිහිටීම නිසා පිටාර තැනි නිර්මාණය වීම (කැලණි ,කළු, ගිං, නිල්වලා)
- අධික වර්ෂාව නිසා විශාල ජල ප්‍රමාණයක් ගලායාම
- ගං වතුර උවදුරට ලක්වන ප්‍රදේශවල ජන ජීවිතයේ සුවිශේෂ හැඩ ගැසීම්
- ගංවතුර ගැලීම නිසා මානව කටයුතුවලට සිදුවන බලපෑම
- පිටාර තැනි ආශ්‍රිතව විවිධ වු රැකියාවන් බිහිවීම (කොරටු වගාව, ගඩොල් කැපීම්)
- ගංගා නිම්න අශ්‍රිතව වී වගාව ව්‍යාප්ත වීම
- පිටාර තැනි ආශ්‍රිත තෙත් බිම බිහිවීම හා එහි ජෛව විවිධත්වයක් පැවතීම

වෙරළ තීරය ආශ්‍රිත භූ දර්ශනය

දිවයින වටා ව්‍යාප්ත වු වෙරළ තීරය සුවිශේෂි වු භූමියකි. වැලිතලා, වැලි වැටි, මෝය හා කලපු ලක්ෂණ හා කිවුල් දිය වගුරු වලින් සමන්විත වු සමතලා බිම් රාශියකි. විශේෂිත වු ශාක පද්ධතින්ගෙන් හා සත්ත්ව විශේෂයන්ගෙන් සමන්විතය. තෘණබිම්, කඩොලාන පද්ධති හා කොරල් පර ආදිය ද එහි ජෛව විවිධත්වය ද සුවිශේෂි වේ. වෙරළාශ්‍රිත ඉඳි වු ජනාවාස ඇත. වෙරළේ සිට දැල් අදින පිරිස්, බිලී කොකු මගින් මසුන් අල්ලන පිරිස් හා වෙරළ තීරයේ සුන්දරත්වය

විදින විදේශකයන් ද අප වෙරළ තීරයේ දක්නට ඇති සුවිශේෂී ලක්ෂණයන් ය. ගම්මාන ආශ්‍රිතව නවතා ඇති ධීවර බෝට්ටු සමූහයන් හා තැනින් තැන ඇති ධීවර වරායන් ද මේ අතර විශේෂිතය. වෙරළ තීරයට ඔබ්බෙන් වූ ලුනු ලේවායන් ද මෙම විශේෂිත පරිසර පද්ධතියේ මානව ක්‍රියාකාරකමකි. මසුන් ඇල්ලීම ප්‍රධාන ජීවනෝපාය වන අතර ඒ ආශ්‍රිත විවිධ රැකියා බිහි වී ඇත.

සංචාරක කර්මාන්තය

- ආකර්ෂණීය වෙරළ තීරය
- සංචාරක කර්මාන්තයට උචිත පරිසරය
- සුඛෝපභෝගී හෝටල් පහසුකම් සපයා තිබීම
- සංචාරක කර්මාන්තය ආශ්‍රිත විවිධ රැකියා බිහිවීම (විසිතුරු භාණ්ඩ, ඇඳුම් පැළඳුම්, දේශීය අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිපදවීම ස්වයං රැකියා, මඟ පෙන්වන්නන්)

ධීවර කර්මාන්තය

- ධීවර කර්මාන්තයට සුවිශේෂී වූ පරිසර පද්ධතිය (කලපු/මෝය/ වගුරු/කඩොලාන බිම්)
- ගැඹුරු මුහුදේ සහ නොගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය
- විශේෂිත මසුන් නිෂ්පාදනය (ඉස්සන්)
- මත්ස්‍ය සම්පත බහුලව වීම (නොගැඹුරු මුහුදු තීරය / ප්ලැන්ක්ටන් වැනි මත්ස්‍ය ආහාර බහුල වීම)
- ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා බිහිවීම (මාළු වෙළෙඳාම ,කරවල වේලීම, උම්බලකඩ නිෂ්පාදනය, දැල් කර්මාන්තය,හා ධීවර ආම්පන්න නිෂ්පාදනය ආදී)
- ධීවර කර්මාන්තය හා බැඳුණු සංස්කෘතියක් බිහිවීම

වියළි කලාපීය භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ විශාල බිම් ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇත. අධික උෂ්ණත්වයකින් යුක්ත වූ (27°cට වැඩි) වියළි කලාපයේ වර්ෂාපතනය අඩු ය. අවුරුද්දේ වැඩි කාලයත් දැඩි සූර්ය රශ්මිය ලැබීම හා දීර්ඝකාලීන නියගයක් පැවතීම නිසා ජල හිඟය බෙහෙවින් වැඩිය. ජල හිඟයට පිළියම් ලෙස තැනින් තැන ඉදි වූ විශාල පරිමාණයේ මහා වැව් වලට යාව ඉදි වූ කුඩා හා මධ්‍යම පරිමාණ වැව් රාශියකගෙන් යුක්තය. විශාල කුඹුරු යායවල් හා ඒ ආශ්‍රිත අතුරු බෝග නිෂ්පාදනයන් සිදුකෙරේ. විසිරුණු ජනාවාස රටාවක් දක්නට ඇති අතර වැව් ආශ්‍රිතව ඒකරාශිවූ ජනාවාස ඇත. උස් නොවූ ශාක වැවෙන අතර වන රක්ෂිත හා සත්ත්ව අභය භූමි රාශියක් වියළි කලාපයේ ඇත. වෙනත් කලාප වලට වඩා ජෛව විවිධත්වයක් ඇති අතර වනාන්තර වල ඖෂධ හා වටිනා දැව වර්ග ඇත.

වැව් ජනාවාස

- වියළි කලාපීය භූ දර්ශනයේ වැදගත් තැනක් හිමිවන්නේ වැව් ජනාවාසවලටය
- අධික නියගය නිසා ජලය එක් රැස්කර ගැනීමට වැව් නිර්මාණය කිරීම
- වැව් ජලයෙන් උපරිම ඵල ලබා ගැනීමට කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- වාරි පද්ධති බිහිවීම

හේන් ගොවිතැන

- සාම්ප්‍රදායික වගාක්‍රම භාවිතය
- ජලසම්පාදනය කළ නොහැකි බිම් යොදාගැනීම
- අඩු අස්වැන්න
- කුරක්කන්, මුං ,තල, මෙනේරි, මිරිස්, වට්ටක්කා, කැකිරි වැනි බෝග වගාව.

නිපුණතාව : **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.3.1 'උඩරට අසිරිය'

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.3.1.1 - පිවිසීම සඳහා ගීතය
- ඇමුණුම 7.3.1.2 - පිවිසීම සඳහා පින්තූර
- ඇමුණුම 7.3.1.3 - තේ වගාව- විස්තර සටහන
- ඇමුණුම 7.3.1.4 එළවළු වගාව - විස්තර සටහන
- ඇමුණුම 7.3..1.5 කාර්ය පත්‍රිකාව

ගුරුවරයාට උපදෙස් : මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි. සිසුන්ට ලියන කඩදාසි රැගෙන ඒමට උපදෙස් දෙන්න. පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්කර එම කණ්ඩායම් නැවත කොටස් 2කට බෙදාගත යුතු වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1.1 :

- ''සීත සුළං අවට හමන්නේ'' ගීතය සිසුන් ලවා ගායනා කරවන්න හෝ ඇමුණුම 7.3.1.2 හි සඳහන් පින්තූර සිසුන් වෙත ප්‍රදර්ශනය කරවන්න.
- ඇසුරින් මධ්‍ය කඳුකරයේ වගාවන් පිළිබඳ ව සාකච්ඡාවේ යෙදෙන්න කරුණු අනාවරණය කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරගන්න.

> - තේ වගාව ශ්‍රී ලංකාවේ සීමිත වූ ප්‍රදේශවල කෙරෙන බව
> - එය කඳුකර බිම ආශ්‍රිත ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති බව
> - එළවලු උඩරට හා පහතරට යනුවෙන් වර්ගකල හැකි බව
> - මධ්‍ය කඳුකරයේ ප්‍රධාන වැවිලි බෝග දෙක තේ සහ එළවළු බව

මිනිත්තු 10

පියවර 7.3.1.2 :

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කීපයකට බෙදන්න.
- එම කණ්ඩායම් නැවත කොටස් 2කට බෙදා ඇමුණුම 7.3.1.3 එක් කණ්ඩායමකටත් ඇමුණුම 7.3.1.4 අනෙක් කණ්ඩායමටත් ලබා දෙන්න.
- ඒවා සිසුන්ට විමර්ශනය කිරීමට කාලය ලබා දෙන්න
- සකසාගත් කාර්ය පත්‍රිකා (ඇමුණුම 7.3.1.5 පරිදි) කණ්ඩායම් 2 අතරේ බෙදා හරින්න.
- සියලුම සිසුන් වෙත අවධානය යොමු කරමින් කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමෙහි නියුක්ත කරවන්න.

මිනිත්තු 40

පියවර 7.3.1.3 :

- පැවරුම් පත්‍රිකා ඇසුරෙන් සිසුන්ගේ පිළිතුරු කණ්ඩායම් නායකයින් ලවා පන්තියේ ඉදිරිපත් කරවන්න.
- පහත කරුණු ඉස්මතුවන පරිදි සියලු සිසුන් සම්බන්ධ කරගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවේ යෙදෙන්න.
- එම කරුණු හුණු පුවරුවේ පෙළගැස්වීම තුළින් සිසුන් පාඩමට ක්‍රියාකාරිව සම්බන්ධ කරගන්න.

■ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- මධ්‍ය කඳුකරයේ කෘෂිකාර්මික රටාව කෙරෙහි භූ දර්ශනය බලපා ඇති බව
- මධ්‍ය කඳුකරයේ තෙත් දේශගුණයක් සහිත බෑවුම් බිම් ආශ්‍රිතව තේ වගාව ව්‍යාප්ත වී ඇති බව
- මධ්‍ය කඳුකරයේ සානු ප්‍රදේශ ආශ්‍රිත ජල පහසුකම් සහිත මද බෑවුම්වල එළවළු බෝග වගා කරන බව.
- තේ වගාව ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය යටතේ ද එළවළු බෝග ස්වභාවික දියපාරවල් ආශ්‍රිතව ද ජල සම්පාදනය යටතේ සිදු කරන බව.
- මධ්‍යම කඳුකරයේ නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙළ ප්‍රදේශවල වැඩි වශයෙන් එළවළු වගාව ව්‍යාප්ත වී ඇති බව.
- උඩරට ප්‍රදේශ අර්තාපල්, බෝංචි, ලීක්ස්, කැරට් ගෝවා වැනි වගාවන් සඳහා වඩාත් ප්‍රසිද්ධ බව

මිනිත්තු 30

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- තේ වගාවට බලපාන සාධක නම්කරයි
- භෞතික භූ දර්ශනය අනුව වගා රටාවන් තීරණය වී ඇති බව පිළිගනියි.
- උඩරට හා පහතරට වශයෙන් එළවළු වර්ගකර දක්වයි.
- බෑවුම් බිම්වල වගාකටයුතු සිදුකිරීමේ දී පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමට පෙළඹේ.
- භූ දර්ශනයේ ස්වභාවය අනුව කෘෂිකාර්මික රටාවන් හැඩගැසී ඇති බව ප්‍රකාශ කරයි.

ඇමුණුම 7.3.1.1

සීත සුළං අවට හමන්නේ
සුදු වලාකුලයි කන්දේ හැපෙන්නේ
නුවරඑළියේ යන්න විවේකයක් ගන්න
ඇගේ පතේ වෙහෙස නිවන්න. . .

හැම කන්දක් සරුසාරව පෙනෙන්නේ
තේ දළු සුළඟට ලෙලදෙන්නේ
කොමල ලඳුන් ඒ තේ දළු නෙලන්නේ
සිරිසාරයි සරුසාරයි කන්ද උඩරටටේ. . .

බලන්න ආසයි තක්කලි ඉදීලා
මල් පිදුනු ගෝවා පැසීලා
කඳු මුදුනේ බීට් රූට් වැවීලා
සිරිසාරයි සරුසාරයි කන්ද උඩරටේ
සිරිසාරයි සරුසාරයි කන්ද උඩරටේ. . .

ඇමුණුම 7.3.1.2

තේ වගා බිමක්

ඇමුණුම 7.3.1.3

තේ වගාව

ශ්‍රී ලංකාවේ වැවිලි බෝග අතරින් මුල් ස්ථානය ගන්නේ තේ වගාවයි. තේ ගස හොඳින් වැඩීම සඳහා 15.6^{0}ජ° - 27.^{0}0ජ^{0} අතර මාධ්‍ය උෂ්ණත්වයක් තිබීම සහ අවුරුද්ද මුළුල්ලේ පැතිරුණු වර්ෂාපතනයක් ලැබීම අවශ්‍ය වේ.

ඒ අනුව වර්ෂයට මි. මි 2000 - 5400 අතර වර්ෂාපතනයක් ලැබෙන 15.6^{0}0c° - 27.^{0}0c° අතර උෂ්ණත්වයක් සහිත මධ්‍ය කඳුකර ප්‍රදේශ ආශ්‍රිත උස් බිම් තේ වගාවට හිතකරයි. තේ පැළයේ මුල් පද්ධතියට ජලය රඳාපැවතීම අහිතකර බැවින් මද බැවුම් සහිත බිම් වඩාත් සුදුසු වේ.

ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට මීටර 600ට වඩා වැඩි උස්බිම්වල තේ වගාව පැතිර තිබෙන අතර ඉන් මීටර් 1200ට වඩා උස්බිම් ආශ්‍රිතව වගා කරනු ලබන තේ ''උඩරට තේ'' නමින් හැඳින්වේ ''උඩරට තේ'' වගාව නුවර එළිය, බදුල්ල, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල ව්‍යාප්තව තිබේ.

ඇමුණුම 7.3.1.4

උඩරට එළවළු බෝග වගාව

ශ්‍රී ලංකාවේ එළවළු වගා කරන ප්‍රදේශ ද තෙත් කලාපීය, වියළි කලාපය හා කඳුකර යනුවෙන් වර්ගකල හැකි ය. ලංකාවේ දැනට වගාකරන එළවළුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් උඩරට ප්‍රදේශවල වගාකරනු ලබයි.

නුවරඑළිය, වැලිමඩ, බදුල්ල සහ බණ්ඩාරවෙල ප්‍රදේශ අර්තාපල්, කැරට්, බීට්රූට්, ලීක්ස්, ගෝවා, බෝංචි, නොකෝල් වැනි එළවලු සඳහා ප්‍රසිද්ධය. අල බෝගයක් ලෙස ද සැලකෙන අර්තාපල් සඳහා නුවරඑළිය හා වැලිමඩ ප්‍රදේශ වඩාත් ප්‍රසිද්ධය.

ඇමුණුම 7.3.1.5

කාර්ය පත්‍රිකාව 1

- තේ වගාවට හිතකර භූගෝලීය සාධක මොනවාදැයි පහත ශීර්ෂ යටතේ ලියා දක්වන්න
  - භූමිය
  - උෂ්ණත්වය
  - වර්ෂාපතනය
- තේ වගාවට යෝග්‍ය භූමියේ උෂ්ණත්ව මට්ටම සඳහන් කරන්න.
- ''උඩරට තේ'' ලෙස ශ්‍රී ලංකා තේ වර්ග කෙරෙන පදනම කුමක් ද?
- ''උඩරට තේ'' වගා කෙරෙන දිස්ත්‍රික්ක නම් කරන්න.
- තේ වගාව සඳහා බෑවුම් බිම් යොදාගනු ලබන්නේ මක් නිසා ද?
- තේ වගාවේදි බෑවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීමට යොදාගන්නා විවිධ ක්‍රම හඳුන්වන්න.

කාර්ය පත්‍රිකාව 2

- පහතින් දක්වා ඇති එළවළු වර්ග උඩරට එළවළු හා පහත රට එළවළු යනුවෙන් වර්ගකර වගු ගත කරන්න (බෝංචි, ගෝවා, පිපිඤ්ඤා, සලාද, ලීක්ස්, බණ්ඩක්කා, මෑකරල්, වට්ටක්කා, අර්තාපල්, බීට් රූට්, කැරට්, වම්බටු, තලන බටු, වැට කොළු)
- ඉහත වර්ගවල පරිදි එම එළවළු ඒ ප්‍රදේශවල වගා කිරීමට බලපා ඇති ප්‍රධාන සාධකය කුමක් ද?
- අර්තාපල් වගාව සඳහා වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ 2ක් නම් කරන්න.
- වගා කටයුතුවල දී බෑවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා යොදාගන්නා විධික්‍රම මොනවා ද?

නිපුණතාව : **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කරයි

ක්‍රියාකාරකම : 7.3.2 වියළි කලාපය හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.3.2.1 දිය සිඳී ඉරිතලාගිය වැව් පිටියක දර්ශනයක්
- 7.3.2.2 හේනක දර්ශනයක්
- 7.3.2.3 ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සීමා දක්වන සිතියම
- 7.3.2.4 වියළි කලාපයේ නියං උපද්‍රව සිදුවන ප්‍රදේශ දක්වන සිතියම
- 7.3.2.5 වියළි කලාපයේ වැව් සහ ගංගා දැක්වෙන සිතියම
- 7.3.2.6 කාර්ය පත්‍රිකාව 1
- 7.3.2.7 කාර්ය පත්‍රිකාව 2
- 7.3.2.8 කාර්ය පත්‍රිකාව 3
- 7.3.2.9 කාර්ය පත්‍රිකාව 4
- ශ්‍රී ලංකා සිතියමක්
- පාට පැන්සල්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.2.1 :

- දිය සිඳී ඉරිතලා ගිය වැව් පිටියක දර්ශනයක් සහිත පිංතූරයක් (ඇමුණුම. 7.3.2.1) හා හේනක දර්ශනයක් (ඇමුණුම 7.3.2.2) පන්තියේ සිසුන් වෙත ඉදිරිපත් කර එය නිරීක්ෂණය කිරීමට ඉඩ සළසන්න.
- ඒවායේ දැක්වෙන ලක්ෂණ සිසුන් සමග සාකච්ඡා කරමින් එවැනි අවස්ථා දැකිය හැක්කේ ශ්‍රී ලංකාවේ කවර ප්‍රදේශයක ද යන්න ඉස්මතු කර ගන්න.
- අනතුරුව ශ්‍රී ලංකාවේ වියළි කලාපීය සිතියම ඇමුණුම 7.3.2.3 හා 7.3.2.4 සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එම සිතියම නිරීක්ෂණය කරමින් සිසුන් සමග ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය පිළිබඳ ව පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.

> - ශ්‍රී ලංකාවේ දැදුරුඔය, වලවේ ගඟ හා මධ්‍ය කඳුකරයේ නැගෙනහිර සීමාවෙන් (මීටර් 300 සමෝච්ඡ රේඛාව) මායිම් වන විශාල ප්‍රදේශයක් වියළි කලාපීය භූ දර්ශනයට අයත් වන බව
> - මේ කලාපයෙහි වසර මුළුල්ලේම අධික උෂ්ණත්වයක් පවතින බව
> - ඊසාන දිග මෝසමින් මේ කලාපයට වැසි ලැබෙන බව
> - වර්ෂාවේ අවිනිශ්චිත බව හා කෙටිකලකට සීමා වන බව
> - මේ නිසා බොහෝ විට අවුරුද්දේ මාස 2ක් 5ත් අතර කාල සීමාවක් දක්වා බලපැවැත්වෙන දැඩි නියං කාලයක් හටගන්නා බව
> - ඒ අනුව නියඟය හා ජල හිඟය මේ කලාපයේ බහුල ව පවත්නා ගැටලු බව

- නියඟ හා ජලහිඟය යන අභියෝග ජය ගැනීම සඳහා පිළියමක් ලෙස ජලය ගබඩා කිරීම පිණිස වැව් ගොඩනැගූ බව
- වියළි කලාපීය භෞතික තත්ත්වයන්ට අනුරූපව මිනිස් කටයුතු ද හැඩ ගැසී ඇති බව
- වැව් ආශ්‍රිතව වී වගාව කෙරුන ද ගොඩ ගෙවිතැන් සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති හෙයින් හේන් ගොවිතැන ව්‍යාප්ත වී ඇති බව
- විසිරුණු ජනාවස රටාවක් ඇති බව
- වැව් ගම්මානයක ඒකරාශි වූ ජනාවාස රටාවක් බිහි වී ඇති බව
- වැව් ගම්මාන ආශ්‍රයෙන් විසිරුණු ජනාවාස රටාවක් බිහි වී ඇති බව

මිනිත්තු 15

පියවර 7.3.2.2 :

- පන්තියේ සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට පැවරෙන කාර්යය පිළිබඳ පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන විට කණ්ඩායමේ සියලු දෙනාගේ ම සහභාගිත්වය තිබේදැයි විමසිල්ලෙන් සිටින බවත් සෑම කෙනෙකුටම ඒ ඒ අයගේ ක්‍රියාකාරිත්වය තක්සේරු කර ලකුණක් ප්‍රදානය කරන බවත් දන්වන්න.
- එක් එක් කණ්ඩායම් තම අභිමතය පිරිදි නායකයකු පත්කරගෙන ක්‍රියාකාරකමෙහි යෙදිය යුතු බව සඳහන් කොට එක් එක් කණ්ඩායමට සුදුසු පරිදි කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- අවශ්‍ය විටක තම සහාය ලබා ගත යුතු බව ද කණ්ඩායම්වලට දන්වන්න.
- ක්‍රියාකාරකමෙහි නිරතවන අවස්ථාවේ කණ්ඩායම් අතර රැඳෙමින් ඔවුන් නිසි මගට යොමු කරවන්න.

මිනිත්තු 25

පියවර 7.3.2.3 :

- ක්‍රියාකාරකම අවසාන එක් එක් කණ්ඩායම තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සළසන්න.
- සෑම කණ්ඩායමකම නිර්මාණ පිළිබඳ ව අන් කණ්ඩායම්වල අයගේ අදහස් හා යෝජනාවලට ද අවස්ථාව දෙන්න.
- සියලුම කණ්ඩායම්වල නිර්මාණ ඉදිරිපත් කිරීමෙන් පසු ව වියළි කලාපයේ භූ දර්ශනය පිළිබඳ ව ඒවායින් ඉදිරිපත් වූ තොරතුරු ගොනු කරමින් මඟ හැරුණු කරුණු තිබේ නම් ඌණ පුරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න. එහි දී පහත සඳහන් කරුණු ඉස්මතු කර දැක්විය යුතු ය.

- වියළි කලාපීය භූ දර්ශනයට දැදුරුඔය, මධ්‍යකඳුකරයේ නැගෙනහිර මායිම් හා වලවේ ගඟින් මායිම් වන විශාල ප්‍රදේශයක් අයත් වන බව
- මේ කලාපයට හම්බන්තොට, මොනරාගල, අම්පාර, මඩකලපුව, පොලොන්නරුව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, වව්නියාව, මුලතිව්, කිලිනොච්චිය, මන්නාරම, පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටසක් ද අයත් වන බව
- අවුරුද්ද පුරාම 27^0c° වැඩි උෂ්ණත්වයක් පවතින බව

- දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය තුළ ඊසාන මෝසමින් මේ කලාපයට මි. මි. 1000- 1500 දක්වා වූ වර්ෂාපතනයක් ලැබෙන බව
- මේ කලාපයෙහි පවතින දේශගුණික තත්ත්වයන් නිසා අවුරුද්දේ වැඩි කාලයක් නියඟ හා ජල හිඟය බලපවත්වන බව
- ජල හිඟයට පිළියමක් ලෙස ජලය ගබඩා කර තැබීම සඳහා වැව් තනා ඇති බව
- වැව් ආශ්‍රිත ව වී ගොවිතැන සිදු කෙරුන ද ගොඩ ගොවිතැන සඳහා අවශ්‍ය ජලය ප්‍රමාණවත් තරම් නොමැති බව
- අඩු ජල ප්‍රමාණයකින් කළ හැකි කෘෂිකාර්මික කටයුත්තක් ලෙස හේන් ගොවිතැන ප්‍රචලිත ව ඇති බව
- හේන් ගොවිතැන යටතේ මුං, කව්පි, තල, කුරහන් වැනි ධාන්‍ය වර්ග හා මිරිස් , වට්ටක්කා, බටු, බඩඉරිඟු හා වෙනත් එළවලු වර්ගද වගා කෙරෙන බව
- කලාපය තුළ විසිරුණු ජනාවාස රටාවක් දක්නට ලැබෙන බව
- සමස්තයක් ලෙස අඩු ජන සංඛ්‍යාවක් දක්නට ලැබෙන බව

මිනිත්තු 30

තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනයෙහි කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරයි.
- විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද හේන් ගොවියා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සපයන දායකත්වය අගය කරයි.
- ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනයට ඇතුළත් වන ප්‍රදේශයේ සීමා දිස්ත්‍රික්ක සිතියමකින් දක්වයි.
- ස්වභාවික සම්පතක් වූ ජලය අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු බව අන්‍යයන්ට පහදා දෙයි.
- වියළි කලාපයෙහි භූ දර්ශනයේ භෞතික ලක්ෂණ හා මානව කටයුතු අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.

ඇමුණුම 7.3.2.1

ඇමුණුම 7.3.2.2

ඇමුණුම 7.3.2.3

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සීමාවන්



පරිමාණය 1:2,200,000

ඇමුණුම 7.3.2.4

වාර්ෂික නියං උපද්‍රව බලපාන දිස්ත්‍රික්ක



ඇමුණුම 7.3.2.5

වියළි කලාපයේ වැව්,ගංගා හා ඔයවල් සිතියම

වියළි කලාපයේ වැව් ගංගා හා ඔයවල්

1. ඉරණමඩු වැව	දැදුරුඔය
2. වව්නිකුලම්	මී ඔය
3. පදවිය වැව	කලාඔය
4. වාහල්කඩ වැව	මල්වතුඔය
5. පාවට්කුලම්	කනගරායන් ආරු
6. කනදරාවැව	යාන් ඔය
7. නාච්චදූව වැව	මහවැලි ගඟ
8. රාජාංගන වැව	මුන්ගෑනි ආරු
9. කලාවැව	මගලවට්ටවන් ආරු
10. හුරුළුවැව	
11. කන්තලේ වැව	ගල් ඔය
12. පරාක්‍රම සමුද්‍රය	කුඹුක්කන් ඔය
13. කවුඩුල්ල	මැණික් ගඟ
14. මාදුරුඔය ජලාශය	කිරිඳිඔය
15. ගල්ඔය සේනානායක සමුද්‍රය	
16. ලුණුගම් වෙහෙර	වලවේ ගඟ
17. උඩවලව	

ඇමුණුම 7.3.2.6

කාර්ය පත්‍රිකාව 1

- ඔබ කණ්ඩායමට පැවරී ඇත්තේ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය ව්‍යාප්ත ව ඇති ප්‍රදේශ දක්වන සිතියමක් පිළියෙළ කර ඉදිරිපත් කිරීමයි.
- මේ සඳහා ශ්‍රී ලංකාවේ සිතියමක් ඔබ කණ්ඩායම වෙත සපයා ඇත.
- ශ්‍රී ලංකාවේ නියං උපද්‍රව සම්භාවිතාව දක්වන සිතියමක් ඔබට සපයා ඇත.
- ඇට්ලස් සිතියම් පොතක් හා නියං උපද්‍රව සම්භාවිතාව දක්වන සිතියම ද උපකාර කර ගෙන ඔබට සපයා ඇති ශ්‍රී ලංකාවේ සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
  1. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනයට අයත් කලාපයේ මායිම්
  2. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්කවල නම්
  3. ඒ එක් එක් දිස්ත්‍රික්යේ ප්‍රධාන නගරයෙහි නම
  4. මේ කලාපය තුළ මාස 5ට වැඩි කාලයක් වියළි තත්ත්වය බලපවත්වන ප්‍රදේශ දුඹුරු පාටින් සේයා කරන්න.
  5. මස 4ක් වියළි තත්ත්වය බලපවත්වන කලාපය රෝස පාටින් සේයා කරන්න.
  6. මාස 2-3 අතර කාලයක් වියළි තත්ත්වය බලපවත්වන කලාපය කහ පාටින් සේයා කරන්න.
- සිතියමට උචිත පරිදි සුචකයක් දක්වන්න
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුතුමාගේ සහාය ලබාගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාම මේ ක්‍රියාකාරකමට සහාය විය යුතුය.
- ඔබේ සහභාගිත්වය අනුව සෑම කෙනෙකුටම ලකුණක් ගුරුතුමා විසින් ලබාදෙනු ඇත.
- මේ කාර්යය සඳහා අවශ්‍ය පෑන් පැන්සල් ඇට්ලස්පොත් ආදිය ගුරුතුමා විසින් ඔබට සපයනු ඇත.

ඇමුණුම7.3.2.7

කාර්ය පත්‍රිකාව 2

- ඔබේ කණ්ඩායමට පැවරෙන කාර්යය වනුයේ ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ ගංගා හා වැව් දැක්වෙන සිතියම (7.3.2.5) අධ්‍යයනය කොට ඇට්ලස් පොතක ආධාරයෙන් වියළි කලාපීය භූ දර්ශනයට අයත් කලාපයෙහි ඇති වැව් හා ගංගා මොනවාදැයි නිවැරදි ව නම් සඳහන් කොට ඉදිරිපත් කිරීමයි. මේ සඳහා අදාළ වැව් හා ගංගාවල නම් ලැයිස්තුවක් මේ සමඟ ඔබ වෙත සපයා ඇත. ඔබ විසින් කළ යුත්තේ ඒ එක් එක් නම් සිතියමේ අදාළ ස්ථානවල නිවැරදි ව ලියා දැක්වීමයි.
- සිතියමේ ඔබ නම් කළ වැව් සියල්ල නිල්පාටින් සේයා කරන්න.
- ගංගාවල නම් ලියන ආකාරය ගුරුතුමා ගෙන් අසා ඒ අනුව ලියා දක්වන්න.
- කණ්ඩායමේ සියලු දෙනාම මෙම කටයුත්ත සඳහා සහාය විය යුතු ය.
- කණ්ඩායම තුළ ක්‍රියාකරන ආකාරය අනුව ගුරුතුමා විසින් සෑම කෙනෙකුටම ලකුණක් ප්‍රදානය කරනු ඇත.
- අවශ්‍ය උපකරණ සියල්ල ගුරුතුමා ඔබට සපයා දෙනු ඇත.
- නියමිත කාලය තුළ ඔබේ කාර්යය අවසන් කොට පන්තියට ඉදිරිපත් කළ යුතු ය.
- අවශ්‍ය සෑම විටම ගුරුතුමාගේ සහාය ලබා ගන්න.

ඇමුණුම 7.3.2.8

කාර්ය පත්‍රිකාව 3

- ඔබට පවරෙන කාර්යය වන්නේ හේන් ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් ලුහුඩු වාර්තාවක් සැකසීමයි.
- පළමු කොට කාර්ය පත්‍රිකාවේ අඩංගු කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.
- අනතුරු ව පහත සඳහක් ශීර්ෂ යටතේ ''ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනයෙහි විශේෂ ලක්ෂණයක් වූ හේන් ගොවිතැන'' යන මාතෘකාව යටතේ තොරතුරු පත්‍රිකාවක් සකස් කරන්න.

- **තොරතුරු පත්‍රිකාව සඳහා ශීර්ෂ**
  1. වියළි කලාපයේ වගා ක්‍රම අතර හේන් ගොවිතැන වැදගත්වීමට හේතු
  2. හේන් ගොවිතැන කෙරෙන කාලසීමාව
  3. හේනක් සකස් කරගන්නා ආකාරය
  4. වගා කරන බෝග වර්ග
  5. හේන් ගොවියා මුහුණපාන ගැටලු

පහත සඳහන් පාඨය හොඳින් කියවන්න

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ හේන් ගොවිතැන

ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපය ඊසාන දිග මෝසමින් වැසි ලබන කලාපයකි. නිරිත දිග මෝසමින් තරම් වැසි ප්‍රමාණයක් ඊසාන දිග මෝසම මගින් ශ්‍රී ලංකාවට නො ලැබේ. මේ නිසා ඊසාන මෝසමින් තරම් වැසි ලබන ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවලට මිනිස් කටයුතු සඳහා ප්‍රමාණවත් තරම් ජලය නොලැබේ. මේ නිසා වියළි කලාපයේ ගොවිතැන් ක්‍රම අතර අඩු ජල ප්‍රමාණයකින් කළ හැකි හේන් ගොවිතැන බහුලව ව්‍යාප්තව ඇත. ඊසාන මෝසම ආරම්භ වීමට පෙර කැලෑව එළිපෙහෙලිකොට වගා සඳහා බිම් සකස් කරන හේන් ගොවියා දඬුවැටක් දමා හේනට ආරක්ෂාව ද සලසයි. ඊසාන දිග මෝසම ආරම්භයත් සමගම විවිධ බෝග වර්ග සිටුවීම සිදු කෙරේ. හේන්වල වගා කෙරෙන බෝග හා බඩ ඉරිගු වැනි ධාන්‍ය වර්ගද, වම්බටු, පිපිඤ්ඤා, කැකිරි වැනි එළවලු වර්ග ද ප්‍රධාන වේ. වර්තමාන හේන් ගොවියා වගාවට වැළදෙන ලෙඩරෝග මර්දනය සඳහා දේශීය ක්‍රම මෙන්ම පළිබෝධනාශක හා කෘමිනාශක රසායන වර්ග ද භාවිතයට පෙළඹී ඇති අතර කෘත්‍රිම පොහොර භාවිතයට ද ඇබ්බැහි වී සිටී.

හේන් ගොවියා මුහුණ පාන ගැටලු ද රැසකි. වගාවට වැළදෙන ලෙඩ රෝග හානි ද ඒ අතර වේ. මේ නිසා බෝග එල දරණ කාලයේ දී හේනේ ගසක් උඩ හෝ වෙනත් ස්ථානයක අටවා ගන්නා පැලක් තුළ රාත්‍රි කාලය මෙන්ම දහවල් කල ද ගත කරමින් කටුක දිවියක් ගෙවමින් වගාව ආරක්ෂා කර ගැනීමට වෙහෙසෙයි.

එසේ ම තම නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් මිලක් නොලැබීම ද තවත් ගැටලුවකි. එසේ වුවද දුෂ්කර ජීවිතයක් ගෙවමින් හේන් ගොවිතැනෙහි යෙදෙන ගොවියා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සපයන දායකත්වය අගය කළ යුතු ය.

- ඔබේ තොරතුරු පත්‍රිකාව සඳහා තොරතුරු ලබා ගැනීමට පෙළපොත ද උපකාරී කර ගන්න.
- අවශ්‍ය අවස්ථාවලදී ගුරුතුමාගේ සහාය ද ලබා ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාගේ ම සහාය මේ කාර්යයේ දී වැදගත් වේ. සෑමකෙනෙකුගේ ම සහභාගිත්වය නිරීක්ෂණය කොට ගුරුතුමා විසින් සෑම කෙනෙකුට ම ලකුණු ප්‍රදානය කරන බව ද මතක තබා ගන්න.
- නියමිත කාල සීමාව තුළ දී ඔබේ නිර්මාණය අවසන් කොට පන්තියට ඉදිරිපත් කරන්න.
- ඔබට අවශ්‍ය උපකරණ ගුරුතුමා ඔබට සපයා දෙනු ඇත.

ඇමුණුම 7.3.2.9

කාර්ය පත්‍රිකාව - 4

ඔබගේ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය පිලිබඳ ව පහත දැක්වෙන ශීර්ෂ යටතේ තොරතුරු වගුවක් සකස් කිරීමයි.

වගුව සකස් කිරීම සඳහා වූ ආකෘතිය

ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය

වියළි කලාපීය භූ දර්ශනයට අයත් කලාපයේ සීමා හා දිස්ත්‍රික්ක	දේශගුණයෙහි විශේෂ ලක්ෂණ	භූ දර්ශනයෙහි කැපී පෙනෙන ලක්ෂණ

වගුව සකස් කිරීමට පෙර පහත විස්තරය ද හොඳින් අධ්‍යයනය කරන්න

ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ පහත රට වියළි කලාපීය ප්‍රදේශ වියළි කලපීය භූ දර්ශනයට අයත් වේ.

මායිම් : දැදුරුඔය, වලවේ ගඟ හා මධ්‍ය කඳුකරයේ නැගෙනහිර සීමාවෙන් (මීටර් 300 සමෝච්ඡ රේඛාව) මායිම්වන මේ කලාපයට, හම්බන්තොට, මොනරාගල, අම්පාර, මඩකලපුව, පොලොන්නරුව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, වව්නියා, මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක අයත් වේ.

භෞතික ලක්ෂණ :
- මෙම කලාපය ඊසාන මෝසමින් වැසි ලබන අතර වාර්ෂික වර්ෂාපතනය මි. මි. 1000 - 1250 අතර වේ.
- වර්ෂය පුරාම 27^0cට වැඩි උෂ්ණත්වයක් පවතී ඊසාන මෝසමින් ලැබෙන ජල ප්‍රමාණය මිනිස් කටයුතු සඳහා ප්‍රමාණවත් නොවේ.
- වියළි කලාපයට ලැබෙන වර්ෂාව කෙටි කලකට සීමා වේ. එම වර්ෂාපතනය පිළිබඳ ව ද විශ්වාසයක් තැබිය නොහැකි ය.
- මේ හේතු නිසා වියළි කලාපයෙහි දීර්ඝකාලීනව බලපවත්වන **නියගය** හා ඒ නිසාම උද්ගතව ඇති ජලහිඟය කැපී පෙනෙන ලක්ෂණ බවට පත් ව ඇත.
- වියළි කලාපයෙහි ජීවත් වූ අපේ මුතුන් මිත්තෝ ජල හිඟයට පිළියමක් ලෙස වැසි කාලයේ දී ලබන ජලය ගබඩා කර තැබීම සඳහා වැව් තැනූහ.
- වැව් ආශ්‍රිත ව වී ගොවිතැන කළ ද වෙනත් ගොඩ ගොවිතැන් සඳහා එම ජලය ප්‍රමාණවත් නොවූ හෙයින් අඩු ජල ප්‍රමාණයකින් සෑහීමකට පත්විය හැකි හේන් ගොවිතැනට ඔව්හු පුරුදු වූහ.
- එබැවින් වියළි කලාපයේ භූ දර්ශනයෙහි හේන් ගොවිතැන ද විශේෂ ලක්ෂණයක් බවට පත්ව ඇත
- හේන් ගොවිතැන යටතේ වියළි ධාන්‍ය වර්ග හා විවිධ දේශීය එළවලු වර්ග ද වගා කෙරේ.
- වියළි කලාපීය භූ දර්ශනයෙහි තවත් විශේෂ ලක්ෂණයක් ව ඇත්තේ වැව් ගම්මාන ඇසුරින් එහි විසිරුණු ජනවාස සැකසී ඇති රටාවයි.

නිපුණතාව : **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කරයි

ක්‍රියාකාරකම : 7.3.3. තෙත් කලාපය හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.3.3.1 තෙත් කලාපයේ මායිම් සහිත සිතියම (ප්‍රවේශය සඳහා)
- ඇමුණුම 7.3.3.2 තෙත් කලාපයේ ගංගා දැක්වෙන සිතියම
- ඇමුණුම 7.3.3.3 කාර්ය පත්‍රිකාව
- ශ්‍රී ලංකා ආකෘති සිතියම
- ඇට්ලස් සිතියම් පොත
- පාට පැන්සල්
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.3.1 :

- තෙත් කලාපයේ මායිම් දැක්වෙන සිතියම සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සිතියම නිරීක්ෂණය කිරීමට විනාඩි 2ක කාලයක් ලබාදෙන්න
- තෙත් කලාපයේ මායම් පිළිබඳ ව සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
- තෙත් කලාපයක ව්‍යාප්තව ඇති දිශාවන් විමසන්න.
- තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්ක කීපයක් හඳුනාගත හැකිදැයි විමසන්න
- ශිෂ්‍ය ප්‍රතිචාර ලෑල්ල මත සටහන් කරන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් සාකච්ඡාවක් ගොඩනගන්න.

> - තෙත් කලාපයේ උතුරු මායිම දැදුරුඔය බව
> - තෙත් කලාපයේ දකුණු මායිම් වලවේ ගඟ බව
> - තෙත් කලාපයේ නැගෙනහිර මායිම මීටර් 300 සමෝච්ච රේඛාව බව
> - තෙත් කලාපයට, ගම්පහ කොළඹ, කළුතර, ගාල්ල, මාතර දිස්ත්‍රික්ක අයත්වන බව
> - රත්නපුරය හම්බන්තොට කෑගල්ල, දිස්ත්‍රික්කවලින් කොටසක් අයත්වන බව

මිනිත්තු 10

පියවර 7.3.3.2 :

- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න
- ඇමුණුම 2 සිතියම කණ්ඩායමකට එක බැගින් දෙන්න
- ක්‍රියාකාරකම සඳහා ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක් ලබාදෙන්න
- ක්‍රියාකාරකම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න
- කාර්ය පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් දෙන්න
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න

මිනිත්තු 20

පියවර 7.3.3.3 : ■ සිසුන් නිර්මාණය කල සිතියම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
■ ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ ව විමසන්න.
■ වැදගත් කරුණු ලෑල්ල මත සටහන් කරන්න.
■ පහත දැක්වෙන කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් සාකච්ඡා මෙහෙයවන්න

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා අතුරෙන් වලවේ ගඟ, නිල්වලා ගඟ, ගිංගඟ, බෙන්තොට ගඟ, මහඔය, දැදුරු ඔය, තෙත් කලාපය හරහා ගලායන බව
- තෙත් කලාපයට අධික වර්ෂාවක් ලැබෙන බව
- අධික ජල ප්‍රමාණක් මුහුදට ගෙනයන ගංගා ඇති බව
- ගංගා ආශ්‍රිතව පිටාර තැනි නිර්මාණය වී ඇති බව
- වර්ෂාව අධික කාලයට පහත් බිම් ප්‍රදේශවල ගංවතුර ඇති වන බව
- ගංවතුර ඇතිවීමට ඇතැම් මිනිස් ක්‍රියාකාරකම් හේතු වන බව
- අධික ජන සංඛ්‍යාවක් වාසය කිරීමට හිතකර සාධක රාශියක් තෙත් කලාපයේ ඇති බව
- ජනාධිකවීම නිසා නාගරිකරණයට ලක් වී ඇති බව
- තෙත් කලාපය තුළ කර්මාන්ත රාශියක් ස්ථානගත වී ඇති නිසා ප්‍රධාන නගරවලට ජනයා සංක්‍රමණය වන බව
- තෙත් කලාපයේ ජීවත් වන ජනතාවට පාරිසරික ගැටලු රැසකට මුහුණු පෑමට සිදුවන බව

මිනිත්තු 10

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ශ්‍රී ලංකාව තුළ තෙත් කලාපයේ සීමා නම් කරයි
- තෙත් කලාපයේ ලැබෙන අධික වර්ෂාව ගංවතුර ඇතිවීමට හේතුවන බව පිළිගනියි
- තෙත් කලාපය හරහා ගලාබසින ප්‍රධාන ගංගා ආකෘති සිතියමක ලකුණු කොට නම් කරයි
- තමා ජීවත් වන පරිසරය රැකගැනීමට දායකවෙයි
- ගංවතුර හානිය අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරති

ඇමුණුම 7.3.1.1

තෙත් කලාපයේ සීමා දැක්වෙන සිතියම (දළ වශයෙන්)

ඇමුණුම 7.3.3.2

තෙත් කලාපයේ ගංගා සිතියම



කාර්ය පත්‍රිකාව

ඇමුණුම 7.3.3.3

- ඔබේ කණ්ඩායමට පැවරී ඇත්තේ තෙත් කලාපයේ ගංගා සහ ප්‍රධාන නගර ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කොට නම් කිරීමය.
- නිල් පාට පාට පැන්සලය භාවිත කර ගංගා අඳින්න.
- ගංගාවේ නම ලිවීමට පෑන යොදාගන්න.
- සිතියමේ ලකුණු කළ යුතු නගර ගම්පහ, කොළඹ, කළුතර ,අලුත්ගම, අම්බලන්ගොඩ, ගාල්ල, මාතර, තංගල්ල.
- නගර ලකුණු කිරීමට රතුපාට පාට පැන්සලය යොදාගන්න. රතුපාට රවුම් තිතකින් නගරය පෙන්නුම් කරන්න.
- නගර හඳුනාගැනීමට ඇට්ලස් සිතියම් පොත භාවිත කරන්න.
- ඇට්ලස් සිතියම් පොතේ ජනව්‍යාප්ති සිතියම ඇසුරෙන් අධික ජන සංඛ්‍යාවක් ඇති බවට තහවුරු කරගන්න.
- තෙත් කලාපයේ ජල ගැලීම්වලට ලක්වන ගංගා හඳුනා ගෙන අඳින ලද සිතියමෙහි ගංමෝය අසල රතු පාටින් තිතක් තබන්න.
- ගංවතුර ඇති වීමට බලපාන සාධක සොයා එම සාධක අවම කිරීමට ගත හැකි යෝජනා ඉදිරිපත් කරන්න.

නිපුණතාව : **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.3.4. ''ශ්‍රී ලංකා වෙරළ තීරයේ අසිරිය අත්විඳිමු''

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.3.4.1 ධීවර හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත රූප සිතියම් සරළ භූ ලක්ෂණ, චිත්‍ර සටහන්
- ඇමුණුම 7.3.4.2 කාර්ය පත්‍රිකාව
- කඩදාසි, පාටපැන්සල්, ෆෙල්ට් පෑන්
- ශ්‍රී ලංකා ආකෘති සිතියම් 2ක්
- පිලිප් ලෝක සිතියම් පොත හෝ ශ්‍රී ලංකා සිතියම් පොතක්
- කාර්ය පත්‍රිකා 1 සහ 2

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.4.1 :

- ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය, වෙරළ ආශ්‍රිත භූ ලක්ෂණ, පින්තූර පත්‍රිකා පන්තියේ සිසුන්ට විමර්ශනය කිරීමට සලස්වන්න.
- ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිත පරිසරය හා එහි භෞතික ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් අදහස් විමසමින් සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකා වෙරළ තීරයේ මානුෂ ක්‍රියාවලී පිළිබඳ ව සිසුන් අධ්‍යයනය කළ රූප ඇසුරෙන් ඔවුන් දන්නා දේ පිළිබඳ ව කෙටි සාකච්ඡාවක යෙදෙන්න.
- සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙමින් පහත සඳහන් කරුණු අනාවරණය කරගැනීමට උත්සාහ ගන්න.

- වෙරළබඩ පරිසරය හා වෙරළ තීරය ශ්‍රී ලංකා භූ දර්ශනයේ ඉතා සංවේදී කලාපයක් බව
- වෙරළ තීරයේ භෞතික පරසරය අනුව සංස්කෘතික භූ දර්ශනය හැඩගැසී ඇති බව
- ධීවර කර්මාන්තය වෙරළතීරයේ ප්‍රධාන ආර්ථික කටයුත්තක් වන බව
- ශ්‍රී ලංකා වෙරළ තීරයේ ප්‍රධාන ආර්ථික කටයුතු අතර සංචාරක කර්මාන්තයට සුවිශේෂ ස්ථානයක් හිමිවන බව

මිනිත්තු 20

පියවර 7.3.4.2 :

- පන්තිය කණ්ඩායම් 2කට බෙදන්න.
- පළමු කණ්ඩායමට ඇමුණුම 7.3.4.2 කාර්ය පත්‍රිකා අංක 1 ලබා දෙන්න.
- එම කණ්ඩායම කොටස් 2කට බෙදා කාර්ය පත්‍රිකාවේ පැවරුම සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

- දෙවන කණ්ඩායමට ඇමුණුම 7.3.4.2 කාර්ය පත්‍රිකා අංක 2 ලබා දෙන්න.
- එම කණ්ඩායමටද කොටස් 2කට බෙදා කාර්ය පත්‍රිකාවේ පැවරුම සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- සියලු ම සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවමින් අධීක්ෂණය කරන්න.

මිනිත්තු 30

පියවර 7.3.4.3 :

- කණ්ඩායම් දෙක නිර්මාණය කරන ලද සිතියම් දෙක බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සියලුම සිසුන් සමඟ සිතියම් 2 විමර්ශනය කරමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- අදාළ තොරතුරු හුණු පුවරුවේ සාරාංශගත කරන්න.
- අනතුරු ව එක් එක් මාතෘකාවට අදාළ ව එක් රැස් කරන ලද තොරතුරු බිත්තියේ ඉදිරිප.ත් කිරීමට කණ්ඩායම් 2කට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීමෙන් පසුව පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

> - ශ්‍රී ලංකාවේ ආවේනික කටයුතු අතර සංචාරක කර්මාන්තයට වැදගත් ස්ථානයක් හිමිවන බව
> - වෙරළ තීරය ආශ්‍රිත භූ දර්ශනයේ ප්‍රධානතම ආර්ථික කටයුතු දෙක සංචාරක කර්මාන්ත හා ධීවර කර්මාන්ත වන බව
> - ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිතව වැදගත් සංචාරක මධ්‍යස්ථාන/ කලාප කීපයක් තිබෙන බව
> - දිවයින වටා වෙරළ තීරයේ ධීවර කර්මාන්තය කෙරෙන බව හා ප්‍රධාන ධීවර මධ්‍යස්ථාන හා ධීවර වරායන් කීපයක් ඇති බව
> - වෙරළ තිරයේ මානව කටයුතු සඳහා විවිධ ගැටලු ඇති බව

මිනිත්තු 30

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සංචාරක කර්මාන්තය හා ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් වැදගත්වන බව ප්‍රකාශ කරයි.
- ධීවර කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය කෙරෙහි වෙරළ තීරයේ භෞතික පරිසරය හේතු වී ඇති බව පිළිගනියි.
- සංචාරක කර්මාන්තය හා ධීවර කර්මාන්තය සඳහා වැදගත් ස්ථාන දැක්වෙන සිතියමක් පිළියෙළ කරයි.
- වෙරළ තීරය සංරක්ෂණ කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- වෙරළ භූ දර්ශනය සංවේදී පරිසරයක් බැවින් එය රැක ගැනීමේ වැදගත්කම පිළිබඳ ව අවධානය යොමු කරයි.

ඇමුණුම 7.4.4.1

සංචාරක ව්‍යාපාරය

ධීවර කර්මාන්තය ආශ්‍රිත දර්ශනයක්

වෙරළ බඩ භූ රූප

ඇමුණුම - 7.3.4.2

කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම් සඳහා

1. ශ්‍රී ලංකා ආකෘති සිතියමේ වෙරළ තීරය ආශ්‍රිත සංචාරක කලාප ලකුණු කොට නම් කරන්න.
2. ශ්‍රී ලංකා වෙරළ තීරයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත විවිධ මානව ක්‍රියාකාරකම් ලයිස්තුවක් පිළියෙල කරන්න. ඒ සඳහා පහත තේමා අදාළ කරගන්න.
   - සංචාරක කර්මාන්තය ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියා තිබීම
   - සංචාරක කර්මාන්තයේ දී අලෙවිය සඳහා කරනු ලබන නිෂ්පාදන
   - සංචාරක කර්මාන්තය ආශ්‍රිත ගැටලු

කාර්ය පත්‍රිකාව

2 කණ්ඩායම සඳහා

1. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලංකාවේ ප්‍රධාන ධීවර මධ්‍යස්ථාන ලකුණු කොට නම් කරන්න.
2. පහත තේමා යටතේ ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු එකතු කරන්න.
   - ධීවර ආම්පන්න හා ක්‍රම
   - ධීවර කටයුතු ආශ්‍රිත රැකියා සෘජු / වක්‍ර රැකියා ඇති බව.
   - ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලු

නිපුණතාව : **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කරයි

ක්‍රියාකාරකම : 7.3.5 **''ශ්‍රී ලංකාවේ භූ දර්ශන සසඳමු''**

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.3.5.1 ශ්‍රී ලංකාවේ භූ දර්ශනය
- 7.3.5.2 කාර්ය පත්‍රිකාව
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.5.1 :

- ශ්‍රී ලංකාවේ භූ දර්ශනය දැක්වෙන සිතියම ප්‍රදර්ශනය කරන්න.
- සිතියම් නිරීක්ෂණය කිරීමට විනාඩි කිපයක් ලබාදෙන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන 4 මොනවාදැයි විමසන්න
- වැඩි භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති භූ දර්ශන කලාපය කුමක්දැයි ප්‍රශ්න කරන්න.
- අඩු භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති භූ දර්ශන කලාපය
- ශිෂ්‍ය ප්‍රතිචාර ලෑල්ල මත සටහන් කරමින් සිසු අවධානය ලබාගන්න.
- පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන හතරක් හඳුනාගෙන ඇති බව
> - විශාල බිම් ප්‍රදේශයක පැතිරී ඇත්තේ වියළි කලාපීය භූ දර්ශනය බව
> - ප්‍රධාන භූ දර්ශන අතර විවිධ වෙනස්කම් ඇති බව

මිනිත්තු 10

පියවර 7.3.5.2 :

- සිසුන් කණ්ඩායම්වලට වෙන්කරන්න
- ප්‍රවේශය සඳහා යොදාගත් සිතියමේ පිටපතක් බැගින් කණ්ඩායමට ලබාදෙන්න
- ඇමුණුම 7.3.5.2 වගුව කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න
- පෙර දැනුම උපයෝගී කරගෙන වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදෙන්න
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න

මිනිත්තු 20

පියවර 7.3.5.3 :

- සිසුන් සකස්කරන ලද වගු සටහන් ඉදිරිපත් කරන්න.

- සිසුන් ඉදිරිපත් කළ තොරතුරු ඇගයීමකට ලක් කරන්න
- වගු සටහනේ ආකෘතියක් ලෑල්ලේ සටහන් කොට සිසුන් ඉදිරිපත් කළ තොරතුරු සටහන් කරන්න.
- පහත සඳහන් කරුණුවලට සිසු අවධානය යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න

> - ප්‍රධාන භූ දර්ශන වෙන්කරන මායිම් ලෙස මීටර් 300 සමෝච්ච රේඛාව දැදුරුඔය, වලවේ ගඟ සහ මීටර් 30 සමෝච්ච රේඛාව යොදාගත්ත බව
> - ප්‍රධාන භූ දර්ශනවල භෞතික ලක්ෂණ එකිනෙක වෙනස් වන බව
> - සෑම භූ දර්ශනයකට සුවිශේෂිව කැපී පෙනෙන ලක්ෂණ ඇති බව
> - මධ්‍යම කඳුකර භූ දර්ශනයේ සුවිශේෂ වූ දේශගුණික තත්වයන් ඇති බව
> - වියළි කලාපීය භූ දර්ශනයෙහි කැපී පෙනෙන භූමි පරිභෝග රටා ඇති බව
> - තෙත් කලාපීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස ජනාධික වීම සැලකිය හැකි බව

මිනිත්තු 10

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන හතරක් නම් කරයි.
- එක් භූ දර්ශන ප්‍රදේශයක වුව ද ප්‍රාදේශීය වෙනස්කම් ඇති බව පිළිගනී
- ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ප්‍රධාන භූ දර්ශන හතර ඇඳ දක්වයි.
- තමා ජීවත්වන භූ දර්ශන ප්‍රදේශයේ පරිසරය රැක ගැනීමට දායකවෙයි
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කිරීමට පෙළඹේ.

ඇමුණුම 7.3.5.1

ශ්‍රී ලංකාවේ භූ දර්ශන



ඇමුණුම 7.3.5.2

පහත දැක්වෙන කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කරන්න

භූ දර්ශනය	සීමාවන් ව්‍යාප්ත ප්‍රදේශය දිස්ත්‍රික්ක වශයෙන්	භෞතික ලක්ෂණ	මානව ක්‍රියාකාරකම්	භූ දර්ශනයේ කැපීපෙනෙන ලක්ෂණ
මධ්‍යම කඳුකර භූ දර්ශනය				
වියළි කලාපය භූ දර්ශනය				
තෙත් කලාපීය භූ දර්ශනය				
වෙරළබඩ භූ දර්ශනය				

ගුරුවරයාට විශේෂ උපදෙස් :

වගුව සම්පූර්ණ කිරීම සඳහා පෙර පාඩම්වලින් ලද දැනුම සහ අත්දැකීම් උපයෝගී කර ගැනීමට සිසුන් යොමු කරන්න.

7.4 ඒකකය

තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ භූමියේ ස්වභාවය අනුව රට අභ්‍යන්තරයේ උස්බිම් ද වෙරළාසන්නයේ සමතලා බිම් ද ඒ අතර හෙල්වැටි ද දක්නට ලැබේ. මේ නිසා ප්‍රධාන භූ දර්ශන කීපයක් හඳුනාගත හැකි ය. හඳුනාගෙන ඇති ප්‍රධාන භූ දර්ශනවල ස්වභාවය හාත්පසින්ම එකිනෙකට වෙනස් වේ. ඒ අනුව භෞතික සාධක මෙන් ම මානව ක්‍රියාකාරකම් ද විවිධ වේ. තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය වෙනත් ප්‍රදේශයක භූ දර්ශනයක් සමඟ සමකල නො හැකි ය. එම නිසා තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය පිළිබඳ ව සුවිශේෂ තොරතුරු දැන ගැනීම අත්‍යාවශ්‍යවේ. මෙම ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කරනුයේ තමා ජීවත්වන පරිසරයේ භූ දර්ශනය පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබාදීමයි.

විෂය අන්තර්ගතය

7.4 තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය

- අදාළ ප්‍රදේශයේ භූ දර්ශනය
  - මධ්‍යම කඳුකර භූ දර්ශනය
  - වියළි කලාපීය භූ දර්ශනය
  - තෙත් කලාපීය භූ දර්ශනය
  - වෙරළ තීරය ආශ්‍රිත භූ දර්ශනය

- තමා ජීවත්වන ප්‍රදේශයට ආදාළ ව
  - භූමියේ ස්වභාවය (කඳු, තැනිතලා, ගංගා. . .)
  - දේශගුණික තත්ත්වයන්
    - වර්ෂාපතනය
    - උෂ්ණත්වය
    - අධික උෂ්ණත්වයක් ඇති කාලය

- තමා ජීවත්වන ප්‍රදේශයේ මානව ක්‍රියාකාරකම්
  - වගා කෙරෙන ප්‍රධාන බෝග
  - වගා කෙරෙන ප්‍රදේශ
  - දක්නට ලැබෙන කර්මාන්ත
  - කර්මාන්තවල ව්‍යාප්තිය

- තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනයේ සුවිශේෂ ස්වභාවයන්
  - ස්වභාවික වෘක්ෂලතා වර්ග
  - ස්වභාවික වෘක්ෂලතා ව්‍යාප්තිය හා වනජීවීන්

- තමා ජීවත්වන ප්‍රදේශයේ භෞතික හා මානව ක්‍රියාකාරකම් අතර ගොඩනැගී ඇති සම්බන්ධතාවය

නිපුණතාව : **තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි**

නිපුණතා මට්ටම : තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය පරීක්ෂා කරයි

ක්‍රියාකාරකම : තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.4.1.1 (ප්‍රවේශය සඳහා චිත්‍රය)
- ඇමුණුම 7.4.1.2 කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.4.1.1 :

- ප්‍රවේශය සඳහා චිත්‍රය දැක්වෙන ඇමුණුම සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- චිත්‍රය නිරීක්ෂණය කිරීමට කාලය මිනිත්තු 2ක් ලබාදෙන්න.
- ඇමුණුමේ දැක්වෙන රූපවලට අදාළ භූ දර්ශන නම් කරන්න.
- තමා ජීවත්වන භූ දර්ශනයට අදාළ රූපය නම් කරන්න
- පහත සඳහන් කරුණුවලට අවධානය යොමු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - ශ්‍රී ලංකාවේ විවිධ භූ දර්ශන ඇති බව
  - ශ්‍රී ලංකාවේ භූ දර්ශනවලට සුවිශේෂ වූ තත්ත්වයන් ඇති බව
  - තමා ජීවත්වන භූ දර්ශනය තුළ ද සුවිශේෂ තත්ත්වයන් ඇති බව
  - සුවිශේෂ භූ දර්ශන තත්ත්වයන් පිළිබඳ ව කරුණු සොයා බැලිය යුතු බව

මිනිත්තු 10

පියවර 7.4.1.2 :

- පන්තිය කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.4.1.2 කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න.
- ක්‍රියාකාරකම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

මිනිත්තු 20

පියවර 7.4.1.3 :

- සිසුන්ට ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම්වල සුවිශේෂතා සාකච්ඡාවට යොමු කරන්න.
- වැදගත් කරුණු ලෑල්ල මත සටහන් කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.
  - තමා ජීවත්වන භූ දර්ශන ප්‍රදේශයේ විවිධ භෞතික සාධක ඇති බව
  - විවිධ භෞතික සාධක පදනම් කරගෙන මානව ක්‍රියාකාරකම් තීරණය වී ඇති බව
  - ඇතැම් මානව ක්‍රියාකාරකම් භූ දර්ශනයට අහිතකර බලපෑම් ඇති කරන බව
  - මිනිස් ක්‍රියාකාරකම්වලින් භූ දර්ශනයට ඇති වන අහිතකර බලපෑම් අවම කරගැනීමට කටයුතු කලයුතු බව

මිනිත්තු 10

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- තමා ජීවත්වන භූ දර්ශනයේ කැපීපෙනෙන ලක්ෂණ නම් කරයි.
- භූ දර්ශනයට අහිතකර මානව ක්‍රියාකාරකම් ඇති බව පිළිගනි.
- තමා ජීවත්වන භූ දර්ශන ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ලකුණු කොට නම් කරයි.
- තමා ජීවත්වන පරිසරය පිළිබඳ සුවිශේෂ තොරතුරු සොයා ගැනීමට පෙළඹේ.
- තමා ජීවත් වන ප්‍රදේශය රැකගැනීමට දායකවෙයි.

ඇමුණුම 7.4.1.1.

ප්‍රවේශය සඳහා චිත්‍රය

ඇමුණුම 7.4.1.2

කාර්ය පත්‍රිකාව

- තමා ජීවත්වන භූ දර්ශන ප්‍රදේශයේ දක්නට ලැබෙන භෞතික ස්වභාවයන් 2ක් සඳහන් කරන්න.
- තමා ජීවත්වන භූ දර්ශන ප්‍රදේශයට අධික වර්ෂාවක් ලැබෙන කාලය දක්වන්න.
- තමා ජීවත් වන භූ දර්ශන ප්‍රදේශයට වර්ෂාව ලැබෙන මාස මොනවා ද?
- තමා ජීවත් වන ප්‍රදේශයේ දක්නට ලැබෙන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.
- මානව ක්‍රියාකාරකම් නිසා තමා ජීවත්වන භූ දර්ශනයට සිදු වී ඇති හානි දෙකක් ලියන්න.
- භූ දර්ශනයට සිදුවන හානි අවම කරගැනීමට කුමක් කළ යුතු ද?

7.5 ඒකකය

ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා

හැඳින්වීම

භෞතික පරිසරයේ කෙටි කාලීනව ඇතිවන වෙනස්කම් නිසා සිදුවන විනාශකාරී බලපෑම ස්වභාවික ආපදා ලෙස හැඳින්විය හැකි ය.

ලෝකයේ විවිධ රටවල් නිරතුරුව පාහේ ස්වාභාවික ආපදාවලට ලක්වෙයි. ජල ගැලීම, නියඟ, සුළි සුළං, භූමි කම්පා, ගිනිකදු පිපිරීම, නායයාම්, භූ චලන ,අකුණු සැර හා සුනාමි ඒවා අතර ප්‍රධාන වේ.

මෙබඳු ස්වාභාවික ආපදා ඇතිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන්නේ පෘථිවි අභ්‍යන්තරයේ ඇතිවන භෞතික ක්‍රියාකාරිත්වයන් හා වායුගෝලයේ ඇතිවන කෙටිකාලීන වෙනස්වීම් ය. මානව ක්‍රියාකාරකම් මෙම ආපදා තීව්‍ර කිරීමට හේතුවේ.

ශ්‍රී ලංකාවට ස්වාභාවික ආපදා බලපාන ආකාරය ප්‍රාදේශීයව හා කාලීනව වෙනස් වේ. උදාහරණ ලෙස නියඟ තත්ත්වයන් බොහෝ විට වියළි කලාපීය ප්‍රදේශවලද, නායයෑම මධ්‍යම කඳුකර තුළ ද ඇතිවන අතර මෝසම් වර්ෂා කාලවල දී ගංවතුර ඇතිවීම ද දැක්විය හැකි ය.

බොහෝ ආපදා ක්ෂණිකව සිදු වුවත් ඉන් ඇති වන හානිකර ප්‍රතිඵල කෙටිකාලීනව මෙන් ම දිගුකාලීනව ජන ජීවිතයට බලපායි. ඒබැවින් ස්වාභාවික ආපදා මගින් ඇතිවන හානි වළක්වා ගැනීම සඳහා කෙටිකාලීනව මෙන් ම දිගු කාලීනව පිළියම් යෙදිය යුතු ය.

ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා ලෙස නියඟ, ගංවතුර, ජල ගැලීම, සුළි සුළං, අකුණු සැර, නායයෑම් හා සුනාමි තත්ත්වයන් හඳුනා ගැනීම හා එම ආපදා බහුල ව ඇතිවන ප්‍රදේශ මෙන් ම ඒවා ඇතිවීමට බලපාන හේතු හා හානිවලින් වැළකීම සඳහා අනුගමනය කළ හැකි කෙටිකාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ගත් එවැනි අවස්ථාවලදී සිසුන්ට දායක විය හැකි ආකාරය පිළිබඳ ගවේෂණය කිරීමත් මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ. එමෙන්ම ශ්‍රී ලංකාවට සුළු වශයෙන් බලපාන ආපදාවක් ලෙස භූ චලන හැඳින්විය හැකිය.

විෂය අන්තර්ගතය

7.5 ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා

- නියඟ
- ගංවතුර
- ජල ගැලීම්
- අකුණු සැර
- නායයෑම්
- සුනාමි

නියඟ

ඇතිවීමට හේතු

- නියමිත කාලවල දී වැසි නොලැබී යාම
- වනාන්තර හෙළි පෙහෙළි කිරීම වැනි මානව ක්‍රියාකාරකම්

බහුලව ඇතිවන ප්‍රදේශ

- හම්බන්තොට
- මොනරාගල
- අනුරාධපුරය
- පොළොන්නරුව
- මන්නාරම
- වවුනියාව
- කුරුණෑගල

■ පුත්තලම යන දිස්ත්‍රික්කවල

නියඟ තත්වය බහුලව ඇතිවන දිස්ත්‍රික්ක

සිතියම 7.5.1



සිදුවන හානි

- ■ වගා හානි වීම
- ■ පානීය ජල හිඟය හා ගෘහ අවශ්‍යතා සඳහා ජලය හිඟවීම
- ■ පරිසර ජීවීන් විනාශ වීම
- ■ අපිරිසිදු ජලයෙන් බෝවන වසංගත රෝග පැතිරී යාම

ගංවතුර

ඇතිවීමට හේතු

- ■ ඇතැම් කාලවලදී අනපේක්ෂිත ලෙස අධික වර්ෂාපතනයක් ලැබීම
- ■ කඳු බෑවුම් ප්‍රදේශ හෙළි කිරීම
- ■ ගං ඉවුරු ප්‍රදේශවල අනවසර ඉදිකිරීම්
- ■ වෙනත් අනවසර ඉදිකිරීම්
- ■ පහත් බිම් ගොඩ කිරීම හා ජල මාර්ග අවහිර කිරීම

බලපාන ප්‍රදේශ

- ගාල්ල, මාතර, කළුතර, රත්නපුර, කොළඹ, ගම්පහ ආදී තෙත් කලාපීය දිස්ත්‍රික්කවල
- නිතර ගංවතුරවලට ලක්වන ගංගා නිම්න වශයෙන් කළු ගඟ, ගිංගඟ, නිල්වලා ගඟ හා කැළණි ගඟ

සිදුවන හානි

- වගා බිම් විනාශ වීම
- වාසස්ථානවලට හානි සිදුවීම
- මංමාවත් විනාශ වීම
- පානීය ජල මූල අපිරිසිදු වීම හා වසංගත රෝග පැතිරීම

ගංවතුර තත්ත්වය බලපාන දිස්ත්‍රික්ක

සිතියම 7.5.2



සුළි සුළං

ඇති වීමට හේතු

- බෙංගාල බොක්ක ප්‍රදේශයේ ඇතිවන අඩුපීඩන තත්ත්වයන් වර්ධනය වීම නිසා වාසුළි ඇතිවීම
- ක්ෂණිකව ඇතිවන කාලගුණික විපර්යාසයන් නිසා කුඩා ප්‍රදේශවලට බලපාන ටෝනාඩෝ යනුවෙන් හඳුන්වන කුණාටු
- ටොර්නාඩෝ හදිසියේ ඇතිවිය හැකි සංසිද්ධියකි. මෙබඳු තත්ත්වයක දී සිදුවන බලපෑම බොහෝ විට කුඩා ප්‍රදේශයකට සීමා වේ.

ටෝර්නාඩෝ

බලපාන ප්‍රදේශ

- විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඊසාන දිග මෝසම් කාලයේදී වාසුළිවල වැඩි බලපෑම් ඇති වේ.
- වාසුළි බෙංගාල බොක්ක ප්‍රදේශයෙන් ආරම්භ වන නිසා වැඩි වශයෙන් ලංකාවේ නැගෙනහිර වෙරළ ප්‍රදේශයෙන් දිවයිනට ඇතුල්වී වයඹ දිශාවෙන් දිවයිනෙන් පිටවී යන නිසා ඒ ආශ්‍රිත ප්‍රදේශවලට හානි සිදු වේ.

වාසුළි ගමන් මග



සිදුවන හානි

- තද වැසි නිසා ඇතිවන ජල ගැලීම
- මිනිස් ජීවිත හා දේපලවලට හානි සිදුවීම
- දුරකතන රැහැන් විදුලි රැහැන් විනාශ වීම
- වගා හානි වීම.

අකුණු සැර

ඇතිවීමට හේතු

- උණුසුම් හා තෙත් වායුගෝලීය තත්ත්වයන් යටතේ නිර්මාණය වන වලාකුළු තුළ අකුණු හා ගිගුරුම් හට ගනී.

බලපාන ප්‍රදේශ

- දිවයිනේ සෑම ප්‍රදේශයකම විදුලි කෙටීම හා අකුණු සැර බලපෑමට ලක්විය හැකිය
- මාර්තු - අප්‍රියෙල් හා සැප්තැම්බර් ඔක්තෝම්බර් යන අන්තර් මෝසම් කාලවලදී වැඩිවශයෙන් බලපායි

සිදුවන හානි

- මිනිස් ජීවිත හානි සිදුවීම
- විදුලි රැහැන් පද්ධතියට හානි සිදුවීම
- ගෘහ විදුලි උපකරණවලට හානි සිදුවීම

නාය යෑම්

ඇතිවීමට හේතු

- අධික වර්ෂාපනතය
- බෑවුම් හෙළි පෙහෙළි කිරීම
- අක්‍රමවත් භූමි පරිභෝජනය - අධික බෑවුම් සහිත ප්‍රදේශවල කෙරන විවිධ ඉදි කිරීම් නොකඩවා ඇද හැලෙන අධික වර්ෂාපතනය නිසා බෑවුම් සහිත ප්‍රදේශවල මතුපිට පස් තට්ටුව පහළ ප්‍රදේශවලට රූරා යාම නායයෑම ක්‍රියාවලියයි.

බලපාන ප්‍රදේශ

- නුවරඑළිය
- බදුල්ල
- රත්නපුර
- මාතලේ
- මහනුවර
- කෑගල්ල,
- ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල අභ්‍යන්තර උස්බිම් ප්‍රදේශ

සිදුවන හානි

- මිනිස් ජීවිත හානි වීම
- දේපල විනාශ වීම
- වගාබිම් විනාශ වීම
- ගමනාගමන කටයුතු අඩාල වීම
- ජල මාර්ග අවහිර වීම
- ජලාශ ගොඩවීම
- ජල විදුලි බලාගාර ක්‍රියාත්මක වීමට බාධා ඇතිවීම

නායයෑම් වලට ගොදුරු වන ප්‍රදේශ

සිතියම 5.4



සුනාමි

භූ තැටි තල මායිම්වල සිදුවන භූමි කම්පා මගින් සාගර ජලයේ හටගන්නා දැවැන්ත රැලි සමූහය සුනාමි යනුවෙන් හැඳින්වේ.

ඇතිවීමට හේතු

- සාගරයේ භූ තැටි තල මායිම්වල ඇතිවන භූමි කම්පා හෝ වෙනස්වීම්
- සාගර පත්ලේ ඇතිවන නායයෑම්
- විශාල උල්කාවක් මුහුදට වැටීමෙන්
- සාගරපත්ලේ ගිනි කඳු පිපිරීමෙන්

බලපාන ප්‍රදේශ

- ශ්‍රී ලංකාවේ වෙරළ බඩ ප්‍රදේශ
- 2004 දෙසැම්බර් 26 දින ඉන්දුනිසියාවේ සුමාත්‍රා දුපත අසල මුහුදු පත්ලේ ඇති වු භූමි කම්පාව නිසා හටගත් සුනාමි බලපෑමට හසුවු ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ලෙස මන්නාරම දිස්ත්‍රික්කය හැර අනිකුත් සියලු ම වෙරළබඩ දිස්ත්‍රික්ක.

2004 සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශ
සිතියම 5.5



සිදුවන හානි

- ජීවිත හානි
- දේපල හානි
- යටිතල පහසුකම්වලට සිදු වූ හානි
- පාරිසරික හානි

ස්වාභාවික ආපදාවලින් සිදුවන හානි අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හා ඒ සඳහා සිසුන්ට දායක විය හැකි ආකාරය

- අහිතකර මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම
- වනාන්තර ආරක්ෂා කිරීම
- බෑවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම
- වෙරළබඩ ප්‍රදේශ සංරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
- මනා ජලවහන රටාවක් ඇති කිරීම
- ක්‍රමවත් භූමි පරිභෝජනය

කෙටිකාලීනව ගත හැකි ක්‍රියාමාර්ග

- ආපදාවන්ට ලක්වුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- ජලය, ආහාර, ඇඳුම් වැනි මූලික අවශ්‍යතා සපුරා ලීම
- සෞඛ්‍ය ගැටලු සඳහා වහාම පිළියම් යෙදීම
- වසංගත රෝග පැතිරීම වැළැක්වීමට කටයුතු කිරීම
- තාවකාලික වාසස්ථාන සැපයීම
- ආපදාවලට ලක්වූවන්ගේ මානසික සහනය සඳහා කටයුතු කිරීම.

දිගුකාලීනව ගතහැකි ක්‍රියාමාර්ග

- ස්ථිර වාසස්ථාන ඉදිකිරීම
- පොදු පහසුකම් සැලසීම
- ණය සහනාධාර ලබාදීම
- පරිසර සංරක්ෂණ කටයුතු ක්‍රමවත් කිරීම
- විනාශ වී ගිය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- උපදේශන සේවා පැවැත්වීම
- ස්වාභාවික ආපදාවන්ට මුහුණු දීමේ ශක්තිය ඇති කිරීම
- ස්වාභාවික විපත් කල්තබා හඳුනාගත හැකි අනතුරු ඇඟවීම් පද්ධතියක් සකස් කිරීම
- ස්වාභාවික විපත් කලින් හඳුනාගත හැකි සතුන්ගේ චර්යා රටා ගවේෂණය

නිපුණතාව : ජීවිතයේ අභියෝගත්මක අවස්ථා ජය ගැනීමට උපකාරීවන සුවිශේෂී දිවිරැකුම් කුසලතා භාවිත කරයි.

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : 7.5.1 ස්වාභාවික ආපදා හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.5.1.1 කාලගුණ වාර්තාව
- ඇමුණුම 7.5.1.2 ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.5.1.3 පුවත් පත් වාර්තාව
- පෙල්ට් පෑන්
- පෙළ පොත,

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.1.1 :

- ඇමුණුම් 7.5.1.1 හි සඳහන් කාලගුණ වාර්තාව ශිෂ්‍යයකු ලවා පන්තියේ සියලුම සිසුන්ට හොඳින් ඇසෙන සේ පැහැදිලි ව කියවීමට සලස්වන්න.
- සිසුන්ගෙන් ප්‍රශ්න විමසමින් කාලගුණ වාර්තාවෙන් කියවෙන ස්වාභාවික ආපදා පිළිබඳ විමසීමක් කරන්න.
- ශ්‍රී ලංකාවට බලපාන වෙනත් ස්වාභාවික අපාදා පිළිබඳ තොරතුරු විමසන්න
- සිසුන් සඳහන් කරන ආපදා හුණු පුවරුවේ සටහන් කරන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න

  - ලෝකයේ බොහෝ රටවල් කවර හෝ ආපදාවකට ලක්වන බව
  - ශ්‍රී ලංකාවට ද මෙවැනි ආපදාවන්ට මුහුණු දීමට සිදු වී ඇති බව
  - මෙවැනි ආපදාවන් ස්වාභාවික හේතූන් මත ඇති වන බව
  - එම නිසා මෙවැනි තත්ත්වයන් ස්වාභාවික ආපදා ලෙස හඳුන්වන බව

මිනිත්තු 10

පියවර 7.5.1.2 :

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් 6ට බෙදා ගන්න.
- සුදුසු නායකයකු පත් කර ගැනීමට අවකාශ සලස්වන්න
- කුසපත් ඇදීමේ ක්‍රමයට එක් ස්වාභාවික ආපදාවක් එක් කණ්ඩායමකට එක බැගින් ලබා දෙන්න.
- ඇමුණුම අංක 7.5.1.2 හා ඇමුණුම් අංක 7.5.1.3 කණ්ඩායමකට එක බැගින් ලබා දෙන්න.
- පැවරුම සිසුනට පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරකමේ යොදවන්න
- සිසු කණ්ඩායම් අතර යමින් සිසුන්ට සහායවන්න.

මිනිත්තු 30

පියවර 7.5.1.3 : ■ එක් එක් කණ්ඩායම් විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පත්‍රිකා පන්තියට ඉදිරිපත් කරවන්න.

■ එක් එක් කණ්ඩායම ඉදිරිපත් කළ කරන ලද තොරතුරුවල පවතින පොදු කරුණු පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

■ හුණු පුවරුවේ එම කරුණු වගුවක් ලෙස සටහන් කරන්න.

■ පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න

■ නියමිත කාලවල දී වැසි නො ලැබීම නිසාත් වනාන්තර හෙළිකිරීම වැනි මානව ක්‍රියාකාරකම් නිසාත් නියඟ ඇති වන බව.

■ අනපේක්ෂිත ලෙස අධික වර්ෂාපතනයක් ලැබීම කඳු බෑවුම් ප්‍රදේශවල වනාන්තර හෙළිකිරීම, ගංගා
ඉවුරු ප්‍රදේශවල අනවසර ඉදි කිරීම් හා පහත් බිම් ගොඩ කොට ජල මාර්ග අවහිර කිරීම නිසා ජල ගැලීම ඇති වන බව.

■ බෙංගාල බොක්ක ප්‍රදේශයේ අඩු පීඩන තත්ත්වයන් වර්ධනය වීම නිසා සුළි සුළං තත්ත්වයන් ඇති වන බව.

■ ක්ෂණිකව ඇති වන කාලගුණික විපර්යාසයන් නිසා සමහර ප්‍රදේශවලට බලපාන ටෝනාඩෝ තත්ත්වයන් ඇති වන බව.

■ උණුසුම් තෙත් වායුගෝලීය තත්ත්වයන් යටතේ නිර්මාණය වන වලාකුළු තුළ අකුණු සැර හා ගිගුරුම් හටගන්නා බව.

■ නොකඩවා ඇද හැලෙන අධික වර්ෂාපතනයත් බෑවුම් සහිත ප්‍රදේශවල වනාන්තර හෙලි කිරීම හා අක්‍රමත් භූමි පරිභෝජනයන් නිසා නායයාම් ඇති වන බව.

■ සාගරයේ භූ තැටි තල මායිම්වල ඇතිවන භූමි කම්පා සාගර පත්ලේ ඇතිවන නායයෑම්,ගිනිකඳු පිපිරීම් හා විශාල උල්කාපාත පතිත වීම නිසා සුනාමි තත්ත්වයන් ඇතිවන බව.

■ ජල ගැලීම්, නාය යෑම් හා නියඟ. වැනි ස්වාභාවික ආපදාවලට අහිතකර මානව ක්‍රියාකාරකම් බෙහෙවින් බලපා ඇති බව.

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

■ ශ්‍රී ලංකාවට බලාපාන ස්වාභාවික ආපදා නම් කරයි.
■ ස්වාභාවික හේතූන් මෙන් ම මානව ක්‍රියාකරකම් ස්වභාවික ආපදාවන්ට හේතු වන බව පිළිගනියි.
■ එක් එක් ආපදාවන්ට බලපාන හේතූන් වෙන් වෙන් ව වගු ගත කරයි.
■ ස්වාභාවික ආපදාවන්ට හේතුවන හානිදායක මානව ක්‍රියාකාරකම් අවම කිරීමට දායක වෙයි.
■ ස්වභාවික ආපදා වලින් සිදුවී ඇති හානි හා ඒ පිළිබඳ වෙනත් තොරතුරු රැස්කරයි.

ඇමුණුම අංක 7.5.1.1

කාලගුණ නිවේදනය

දැනට පවතින වැසි තත්ත්වය තව දුරටත් වර්ධනය වීම නිසා ගංවතුර තත්වයක් ඇතිවීමට ඉඩ තිබෙන බැවින් ගංවතුර තර්ජනයට ලක්වන ප්‍රදේශවල ජනතාව ඒ පිළිබඳ විමසිල්ලෙන් සිටින ලෙස නිවේදනය කරයි.

මේ අතර බෙංගාල බොක්කෙ ප්‍රදේශයේ අඩු පීඩන තත්ත්වයන් වර්ධනය වීම නිසා සුළි සුළං තත්ත්වයක් හටගෙන ඇති අතර දිවයිනේ ප්‍රදේශ ගණනාවකට එහි බලපෑම් ඇති වීමට ඉඩ ඇත.

අධික වර්ෂාව නිසා කඳුකරයේ බෑවුම් ප්‍රදේශවල නායයෑමට ඉඩ ඇත. මේ දිනවල පවතින අධික වැසි සහිත තත්වයන් යටතේ අකුණු සැරවලට ලක්වීමට ඉඩ ඇති නිසා ඒ පිළිබඳ සැලකිලිමත් වන්න.

ඇමුණුම් 7.5.1.2

කාර්ය පත්‍රිකාව

- ඔබ කණ්ඩායම අදාළ ස්වාභාවික ආපදාව තෝරා ගන්න.
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ඇමුණුම 7.5.1.3 පත්‍රිකාව හොඳින් කියවන්න.
- පන්ති පොත අදාළ කොටස හොඳින් කියවන්න.
- ඔබ කණ්ඩායම අදාළ ආපදාව ඇතිවීමට බලපාන ස්වාභාවික හේතු හා මානව ක්‍රියාකාරකම වෙන් කොට හඳුනා ගන්න
- ඉතා කෙටියෙන් අදාළ වගු සටහනේ අදාළ කොටස සම්පූර්ණ කරන්න.

ස්වභාවික ආපදාව	ඇතිවීමට බලපාන ස්වාභාවික හේතු	ඇතිවීමට බලපාන මානව ක්‍රියාකාරකම්
නියඟ		
ගංවතුර		
සුළි සුළං		
විදුලි කෙටීම හා අකුණු සැර		
නායයෑම්		
සුනාමි		
භූචලන		

ඇමුණුම 7.5.1.3

පුවත් පත් වාර්තාව

ස්වාභාවික ආපදා

වර්ෂාව නොමැති දිගු කාලයක් පැවතීම නියඟ ඇතිවීමට හේතුවේ. අප රටේ නැගෙනහිර හා උතුරු ප්‍රදේශවලට වැසි ලැබෙන්නේ ඊසාන දිග මෝසම් කාලයේදීය. එනම් නොවැම්බර් දෙසැම්බර් ජනවාරි මාස වල ය. වසරේ ඉතිරි මාසවල වැසි ලැබෙන්නේ මඳ වශයෙනි. ඊසාන දිග මෝසම් වැස්ස ප්‍රමාණවත් ලෙස නොලැබීයාමෙන් ඇතැම් වර්ෂවලදී නියඟ තත්ත්වය ප්‍රබල ලෙස එම ප්‍රදේශවලට බලපායි වැස්ස අඩුවීම සඳහා වනාන්තර හෙළි කිරීම වැනි මිනිස් ක්‍රියාකාරකම් වක්‍රව බලපාන බව සඳහන් කළ හැකි ය.

ස්වාභාවික ආපදා පිළිබඳව කථා කිරීමේදී ගංවතුරට, ජල ගැලීම්වලට ලැබෙන්නේ ප්‍රධාන තැනකි. මේ ආපදාව ඇතිවීමට හේතුවන ප්‍රධාන කරුණු කිහිපයකි. අධික වර්ෂාව හේතුවෙන් ජල මාර්ග උතුරායාම, පස් එකතු වීමෙන් ජල මාර්ග අවහිර කිරීම නිසා ජල මාර්ග වෙනස් කිරීම, වන විනාශය හා ගං ඉවුරු දෙපස ඉදිකිරීම්, වනාන්තර හෙළි කිරීම නිසා ගං පත්ල පස් වලින් ගොඩ වීම ජල ගැලීම්වලට හේතුවේ.

සුළි සුළඟක් වැනි ස්වාභාවික ආපදාවක් කවදා කිනම් මොහොතක ඇති වී විපතක් සිදුවේදැයි කිව නොහැක. විශේෂයෙන් බෙංගාල බොක්ක ප්‍රදේශයේ ඇතිවන අඩු පීඩන තත්ත්වයන් මර්දනය වීම නිසා වාසුළි ඇති වන අතර එම වාසුළි ශ්‍රී ලංකාව හරහා ගමන් කිරීම උදා 1978 ඇති වූ සුළි සුළං මඩකලපුව ප්‍රදේශයෙන් දිවයිනට ඇතුල් වී මන්නාරම ප්‍රදේශයෙන් ඉවත් විය.

වායුගෝලය තුළ හටගන්නා කැටි වලාවක අකුණු වැඩි ප්‍රමාණයක් ඇතිවේ. හොඳින් ආරෝපනය වූ කැටි වැහි වලාවක පහළ කොටසේ ඍණ - විද්‍යුත් ආරෝපන ද ඉහළ කොටසේ ධන විද්‍යුත් ආරෝපනය ඇති වේ. වලාකුලක ඇතිවන ප්‍රතිවිරුද්ධ ආරෝපන නිසා විදුලි ධාරාවේ සිට පහළ වළාකුලේ විදුලි ධාරාවට වාතය හරහා විදුලි ධාරාවක් ගමන් කිරීමේදී මෙවැනි විදුලි පුපුරක් ඇතිවේ. මේ අනුව ධන විදුලිය රැස් වී ඇති වළාකුලක් සිට ඍණ විදුලිය රැස්වී ඇති වළාකුලක් අතර සිදුවන විදුලි පුපුර අකුණක් ලෙස හඳුන්වයි. .මෙම විදුලි පුපුර ආරෝපිත වළාකුලක සිට තවත් ආරෝපිත වළාකුලකට පෘථිවිය වෙතට ගමන් කළ හැකි ය. මෙසේ පොලොව මතට එන අවස්ථාවන් අකුණු වැදීම ලෙස සලකනු ලැබේ.

නායයෑම් ගැන පසුගිය දා ලංකාවේ කඳුකර ප්‍රදේශවලින් වාර්තා විය. භූ විද්‍යා පතල් කැනීම් අංශයේ ගවේෂණයකට අනුව ලංකාවේ නගර ගණනාවක් නායයෑමෙන් විනාශ වීමේ තර්ජනයට මුහුණු පා සිටී. මෙම නගර තද වැසි සමඟ දරුණු නායයෑම් වලට ලක්විය හැකි ය. එසේ වුවහොත් සුනාමියට පසු ලංකාවේ සිදුවන ලොකුම ස්වාභාවික අනතුර නායයෑම් වීමටත් ඉඩ තිබේ.

නායයෑම් හට ගැනීමට බලපාන ප්‍රධාන හේතු දෙකකි. එනම් ස්වභාවික හේතු හා මිනිස් ක්‍රියාකාරකම්ය. තද බෑවුම් වල ආනතිය මෝසම් වැසි දිශාවට නිරාවරණය වීම, වර්ෂාපතනයේ තීව්‍රතාව, පාෂාණය මත පිහිටි ජීර්ණය වූ පස් තට්ටුවේ උස නායයෑම කෙරෙහි බලපාන ස්වාභාවික හේතූන් ය.

මිනිස් ක්‍රියාකාරකම් ද නායයෑම් සිදුවීමට බලපායි. විශාල වශයෙන් වන පෙත් හෙළි කිරීමට හේන් ගොවිතැන් සඳහා කැලෑ එළිකිරීම නිසා පස් සෝදා ගොස් පාංශු ඛාදනය අතිවීම, අවිධිමත් ඉඩම පරිහරණය, අවිධිමත් ඉදි කිරීම් හා ගවේෂණයකින් තොරව ගල් වලවල් හෑරීම, ගල් පිපිරවීම හා ස්වභාවික ජල මාර්ග අවහිර කිරීම හා උස්බිම්වල ජලය රඳවා තැබීම නායයෑම්වලට බලපාන අහිතුත් මිනිස් ක්‍රියාකාරකම් වේ.

ශ්‍රී ලංකාවට සුළු වශයෙන් බලපාන ස්වාභාවික අපදාවක් ලෙස භූ චලන ද හඳුනාගත හැකිය. ගැඹුරු මුහුදේ සිදුවන විවිධ භූ චලනවල බලපෑම් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට බලපා ඇති අවස්ථා පිළිබඳව ද පුවත් පත් හා ප්‍රවෘත්ති ඇසුරින් වරින්වර තොරතුරු වාර්තා වේ.

නිපුණතාව : **ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරිවන සුවිශේෂී දිවි රැකුම් කුසලතා භාවිත කරයි.**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : 7.5.2 ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා ප්‍රදේශ හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.5.2.1 - දිස්ත්‍රික් මායිම් ඇඳින ලද ශ්‍රී ලංකා සිතියම
- ඇමුණුම 7.5.2.2. ස්වාභාවික ආපදා සිදුවන දිස්ත්‍රික්ක ලේඛනයක්
- ඇමුණුම් - 7.5.2.3. ස්වාභාවික ආපදා 06 නම් ලැයිස්තුව
- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක දැක්වෙන බිත්ති සිතියමක්
- ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප දැක්වෙන බිත්ති සිතියමක්
- පාට පැන්සල්
- පෙළ පොත
- ලෝක සිතියම් පොත

උපදෙස් :

- ස්වාභාවික ආපදා පිළිබඳ පින්තූර ගෙන එන ලෙස ළමයින්ට උපදෙස් දීම
- ඇමුණුම් 7.5.2.1. සිතියම් කණ්ඩායමකට 01 බැගින් දෙන්න.
- ලෝක සිතියම් පොත් කණ්ඩායමකට 01 බැගින් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.2.1 :

- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් බිත්ති සිතියම හා දේශගුණික කලාප බිත්ති සිතියම පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- කෙටි ප්‍රශ්න අසමින් තමා අයත් දිස්ත්‍රික්ක හා ආසන්න දිස්ත්‍රික්ක පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- සිසුන් පෙර දැනුමද උපයෝගි කර ගනිමින් ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ විමසීමක් කරන්න.
- එම කලාපවලට අයත් දිස්ත්‍රික්ක වෙන් කර දැක්වීමට හැකිවන සේ ප්‍රශ්න නගන්න.
- සමහර දිස්ත්‍රික්ක මෙම කලාප දෙකටම අයත් ද යන්න සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.

> - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ක් ඇති බව
> - ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප 03 ක් ඇති බව
> - සම්පූර්ණයෙන් ම තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්ක ඇති බව
> - සම්පූර්ණයෙන් ම වියළි කලාපයට අයත් දිස්ත්‍රික්ක ඇති බව
> - තවත් සමහර දිස්ත්‍රික්ක මෙම කලාප 02ටම අයත් බව

මිනිත්තු 10

පියවර 7.5.2.2 : ■ සිසුන් කණ්ඩායම් 06කට බෙදන්න
■ සුදුසු නායකයෙක් තෝරාගැනීමට යොමු කරන්න.
■ එක් කණ්ඩායමකට ඇමුණුම 7.5.2.3ට අදාළ මාතෘකාව බැගින් දෙන්න.
■ එක් කණ්ඩායමකට ලෝක සිතියම් පොත බැගින් දෙන්න.
■ ඇමුණුම 7.5.2.1 පදනම් කර ගනිමින් දිස්ත්‍රික්ක නම් කරන්න සලස්වන්න.
■ එක් එක් දේශගුණික කලාපයට අයත් එ. එ. ස්වාභාවික ආපදා සිදුවන දිස්ත්‍රික්ක ලකුණු කර සෙයා කිරීමට උපදෙස් දෙන්න.
■ වරින් වර කණ්ඩායම්වලට ගොස් සිසුන්ට මග පෙන්වන්න
■ වැරදි නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් දෙන්න.

මිනිත්තු 30

පියවර 7.5.2.3 : ■ කණ්ඩායම් විසින් සකස් කරන ලද ස්වාභාවික ආපදා සිතියම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න
■ ඒවා හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරවන්න.
■ එම සිතියම් පදනම් කරගනිමින් ආපදා සිදුවන දිස්ත්‍රික්ක පිළිබඳ තොරතුරු විමසමින් සාකච්ඡාවක් ගොඩ නගන්න.
■ විෂය කරුණුවලට අදාළවන ආකාරයට සාකච්ඡා මෙහෙයවන්න. නිවැරදි තොරතුරු සංවිධානය කරමින් ඇමුණුම් 7.5.2.3ට අදාළ වගුව හුණු පුවරුවේ සම්පූර්ණ කරන්න.
■ මෙසේ සකස් කරන ලද තොරතුරු හා වගුව තම සටහන් පොත්වලට ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
■ සාකච්ඡාවෙන් අනතුරුව පහත සඳහන් කරුණු ඉස්මතු වන ආකාරයට සමාලෝචනය කරන්න.

■ එක් එක් ස්වාභාවික ආපදාවලට අදාළ දිස්ත්‍රික්ක ඇති බව
■ තවත් ස්වභාවික ආපදා බොහෝවිට දේශගුණික කලාප අනුව සිදුවන බව,
■ විවිධ ස්වාභාවික ආපදා එකම දේශගුණික කලාපය විවිධ අවස්ථාවල ක්‍රියාත්මක විය හැකි බව
■ ඒ අනුව එකම දිස්ත්‍රික්කයේ විවිධ දේශගුණික ආපදා සිදුවන බව
■ ස්වභාවික ආපදා කාලානුරූපිව සිදු වන බව
■ ඉතා අඩුවෙන් ස්වාභාවික ආපදා ඇති දිස්ත්‍රික්ක ඇති බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම් නිර්නායක

■ ස්වාභාවික ආපදාවලට මුහුණපාන දිස්ත්‍රික්ක නම් කරයි.
■ ස්වාභාවික ආපදාවල මට්ටම මිනිස් ක්‍රියාකාරකම් නිසා තීව්‍ර වන බව පිළිගනියි.
■ ස්වාභාවික ආපදා සිදුවන ප්‍රදේශ සිතියම්වල ලකුණු කර ප්‍රදර්ශනය කරයි.
■ සහයෝගය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, නායකත්වය ගැනීම වැනි පුද්ගල ගුණාංග නිරතුරුව ප්‍රදර්ශනය කරයි.
■ ස්වාභාවික ආපදා අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.

ඇමුණුම 7.5.2.1

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියම



ඇමුණුම 7.5.2.2

නියගය බලපැවැත්වෙන දිස්ත්‍රික්ක	ගංවතුර බලපැවැත්වෙන දිස්ත්‍රික්ක
- හම්බන්තොට, ත්‍රිකුණාමලය	- ගාල්ල
- මොනරාගල , කිලිනොච්චිය	- මාතර
- අනුරාධපුරය , මුලතිව්	- කලුතර
- පොලොන්නරුව, යාපනය	- කොළඹ
- මන්නාරම	- රත්නපුර
- වවුනියාව	- පොලොන්නරුව
- කුරුණෑගල	- අම්පාර
- පුත්තලම	- මඩකලපුව

සුළි සුළං බලපැවැත්වෙන දිස්ත්‍රික්ක	**නායයාම් බලපැවැත්වෙන දිස්ත්‍රික්ක**
නැගෙනහිර උතුරුමැද හා උතුරු පළාත්වලට අයත් දිස්ත්‍රික්ක	රත්නපුර නුවරඑළිය බදුල්ල මහනුවර මාතලේ කෑගල්ල ගාල්ල මාතර

- සුනාමි බලපැවැත්වූ ප්‍රදේශ වෙරළබඩ ප්‍රදේශයට අයත් සියලු දිස්ත්‍රික්ක
- අකුණු සැර හා විදුලි කෙටීම දිවයිනේ සෑම ප්‍රදේශයකටම බලපැවැත්වෙන බව

ඇමුණුම 7.5.2.3

ශ්‍රී ලංකාවේ බල පැවැත්වෙන ස්වභාවික අපදා වර්ග
නියගය ගංවතුර හා ජලගැලීම් සුළිසුළං නායයාම් අකුණු සැර හා විදුලි කෙටීම සුනාමි

නිපුණතාව : **ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී දිවි රැකුම් කුසලතා භාවිත කරයි.**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : 7.5.3 ස්වභාවික ආපදා හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම් 7.5.3.1 ප්‍රදර්ශන පත්‍රිකාව
- අමුණුම් 7.5.3.2 ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව
- පෙළ පොත
- බ්‍රිස්ටල් බෝඩ්
- ගම්, කතුරු, පෙල්ට් පෑන්

විශේෂ උපදෙස් : ■ ස්වභාවික අපදා හා ඒවායින් ඇතිවන හානි පිළිබඳ තොරතුරු සිසුන්ට රැගෙන එන ලෙස උපදෙස් ලබා දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.3.1 :

- ඇමුණුම 7.5.3.1 දැක්වෙන ප්‍රදර්ශන පත්‍රිකාව හෝ ඒ ආකාරයට සකස් කළ ප්‍රදර්ශන පත්‍රිකාවක් පන්තියට ඉදිරිපත් කරන්න. (ප්‍රදර්ශනය කරන්න)
- ඒ පිළිබඳ ව සිසු අවධානය යොමු කරවමින් ස්වභාවික ආපදාවලින් සිදු වී ඇති හානි පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් දක්වන පිළිතුරු හුණු පුවරුවේ සටහන් කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.

> - මිනිස් ජීවිතයවලට හානි සිදුවන බව
> - දේපලවලට හානි සිදුවන බව
> - ප්‍රවාහන පද්ධතිය විනාශ වන බව

මිනිත්තු 10

පියවර 7.5.3.2 :

- ස්වාභාවික ආපදා හඳුනාගත් අවස්ථාවේ සිසුන් කණ්ඩායම් වූ ආකාරයටම සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.5.3.2 ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබාදෙන්න.
- බ්‍රිස්ටල් බෝඩ් කතුරු, ගම්, පෙල්ට් පෑන් ලබා දෙන්න.
- පැවැරුම පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම් අතරතුර අවශ්‍ය උපදෙස් හා සිසුන්ගේ කටයුතු නිරීක්ෂණය කරමින් ඇගයීමක යෙදෙන්න.

මිනිත්තු 30

පියවර 7.5.3.3 :

- සිසු කණ්ඩායම් සකස් කළ බිත්ති පුවත්පත පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න
- සිසුන් තුලින්ම නිර්මාණ අගය කරන්න.
- බිත්ති පුවත් පත ඇසුරින් සිසුන් සමඟ කෙරෙන සාකච්ඡා අතර එහි සාරාංශය හුණු පුවරුවේ සටහන් කරන්න. සිසුන් ලවා වගු සටහනක් තුළට කරුණු ගොනු කරන්න.

■ සිසුන්ට පාඩමේ සාරාංශය සටහන් කර ගැනීමට අවස්ථාව සලස්වන්න.
■ කණ්ඩායම් නිර්මාණය සඳහා අවශ්‍යය පරිදි ලකුණු පිරිනැමීම ද කරන්න.
■ පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

■ ස්වාභාවික ආපදා නිසා විවිධාකාර හානි සිදුවන බව
■ මිනිස් ජීවිත වලට සිදුවන හානි ඉතා ප්‍රබල බව
■ නිවාස ගොඩනැගිලිවලට හානි සිදුවන බව
■ පොදු ගොඩනැගිලිවලට හානි සිදුවන බව (රෝහල් පාසල් ආදියට)
■ ප්‍රවාහන පද්ධතියට හානි සිදුවන බව (මහා මාර්ග දුම්රිය මාර්ග පාලම්, බෝක්කු ආදීය)
■ විදුලි පද්ධතියට හානි සිදුවන බව.
■ වගා බිම්වලට හානි සිදුවන බව (කුඹුරු, පොල්, තේ එළවළු වගාවන්)
■ ස්වාභාවික ආපදා නිසා ඇතිවන හානි කෙටිකාලීන හා දිගු කාලීන හානි වශයෙන් වර්ග කළ හැකි බව
■ ස්වභාවික ආපදා නිසා සිදුවන හානි ස්වාභාවික පරිසරයට, ජීවින්ට හා ආර්ථිකයට සිදුවන හානි ලෙස වර්ග කළ හැකි බව.

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

■ ස්වාභාවික ආපදාවලින් සිදු වන හානි පිළිබඳ විස්තර කරයි.
■ ස්වාභාවික ආපදා හානි පිළිබඳ ව සංවේදී වෙයි.
■ ස්වාභාවික ආපදාවලින් සිදු වන පාරිසරික ආර්ථික සාමාජිය හානි සටහන් කරමින් පත්‍රිකාවක් නිර්මාණය කරයි.
■ ආපදා අවස්ථාවල දී අන්‍යන්ට උදව් කිරීමට පෙලඹෙයි.
■ ඕනෑම මොහොතක එළඹිය හැකි ආපදාවක් සඳහා ජීවිත සූදානමක් ඇති කර ගනී.

ඇමුණුම 7.5.3.1

ස්වභාවික ආපදා දැක්වෙන පිංතූර



ඇමුණුම 7.5.3.2

ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව

- ස්වාභාවික අපදා වලින් සිදු වන හානි පිළිබඳව බිත්ති පුවත් පතක් සකස් කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යයයි.
- ඔබගේ කණ්ඩායමට හිමි ස්වාභාවික ආපදාව පිළිබඳ ව සුවිශේෂී වන්න.
- ඔබ කණ්ඩායම රැස් කරගෙන ඇති පුවත් පත් තොරතුරු පින්තූර රූප සටහන් ආදිය මේ සඳහා භාවිත කරන්න.
- අවශ්‍ය තැන්වල දී ඔබ විසින් ලියන ලද තොරතුරු වගු සටහන් ආදිය ද ඇතුල් කරන්න.
- ප්‍රදර්ශනය කළ හැකි අන්දමට බිත්ති පුවත් පත සකස් කරන්න.
- ඔබට සපයා ඇති බ්‍රිස්ටල් බෝඩ් පෙල්ට් පෑන් අදාළ පරිදි භාවිත කරන්න
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුවරයාගේ උදව් ලබා ගන්න.
- අදාළ අවස්ථාවේ දී ඔබ කණ්ඩායම සකස් කළ බිත්ති පුවත් පත අනිකුත් කණ්ඩායම්වලට ප්‍රදර්ශනය කරන්න.

නිපුණතාව : **ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂි දිවි රැකුම් කුසලතා භාවිත කරයි**

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : 7.5.4 ස්වාභාවික ආපදා අවම කිරීමට දායක වෙමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම් 7.5.4.1 වගුසටහන
- පෙළ පොත
- පාට පැන්සල්
- බ්‍රිස්ටල්බෝඩ්

උපදෙස් :

- ස්වාභාවික ආපදාවන් ඇතිවීමට පෙර පරිසරයේ හැසිරීම් රටාව ගැන තොරතුරු සොයා ගෙන ඒමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ස්වාභාවික ආපදාවන් වූ විට අප ක්‍රියා කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම් 7.5.4.1 වගුවට අදාළ මාතෘකාව බැගින් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.4.1 :

- ආපදා ඇතිවීමට බලපාන හේතු පිළිබඳ ව සිසුන්ගෙන් කෙටි ප්‍රශ්න අසමින් කෙටි සාකච්ඡාවක් ගොඩ නගන්න.
- ආපදාවන් කලින් හඳුනා ගැනීමට බලපා සාධක කෙටියෙන් සාකච්ඡා කරන්න.
- සිසුන් සඳහන් කළ ආපදා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග ගැන විමසීමක් කරන්න.
- ආපදාවක් සිදු වූ අවස්ථාවක දී ජනයා ක්‍රියා කරන ආකාරය ගැන විමසීමක් කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාවක් ගොඩ නගන්න.

  - ස්වාභාවික ආපදා ඇති වීමට විවිධ හේතු බලපාන බව
  - ස්වාභාවික ආපදා ඇති වීමට කලින් පරිසරයේ හැසිරීම් වෙනස් වන බව
  - ස්වාභාවික ආපදා අවම කර ගැනීමට විවිධ ක්‍රියා මාර්ග ගත හැකි බව
  - ස්වාභාවික ආපදාවන් ඇතිවූ විට දී ජනයාට විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක විය හැකි බව
  - ආපදාවන් ඇති අවම කර ගැනීමට හා අපදාවක් සිදු වූ අවස්ථාවේ දී සිසුන් ක්‍රියා කළ යුතු ආකාරය විවිධ ස්වරූප ගන්නා බව

මිනිත්තු 10

පියවර 7.5.4.2 :

- සිසුන් කණ්ඩායම් 06 කට බෙදන්න.
- සුදුසු නායකයෙක් තෝරා ගැනීමට යොමු කරන්න.
- එක් එක් කණ්ඩයාමට ඇමුණුම් 7.5.3.1 හි මාතෘකාව බැගින් දෙන්න.
- එක් එක් ආපදාව හා වගුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.

- වරින් වර කණ්ඩායම්වලට ගොස් අවශ්‍ය මගපෙන්වීම් කරන්න.
- වැරදි නිවැරදි කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම කරන්න.

මිනිත්තු 30

පියවර 7.5.4.3 :
- කණ්ඩායම් විසින් සකස් කරන ලද ස්වභාවික ආපදා අවම කර ගැනීම හා එවැනි අවස්ථාවලදී ගත යුතු ක්‍රියාමාර්ග පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවා හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරවන්න.
- එම වගු පදනම් කර ගනිමින් සාක්ච්ඡාවක් ගොඩ නගන්න.
- එම සාකච්ඡාව පදනම් කර ගනිමින් හුණු පුවරුවේ 7.5.3.1 වගුවට අදාළ තොරතුරු ලියා දක්වන්න.
- මෙසේ සකස් කරගන්නා ලද තොරතුරු වගු තම සටහන් පොත්වලට ගැනීමට සිසුන්ට අවස්ථවක් ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන ආකාරයට සමාලෝචනය කරන්න.

■ ස්වාභාවික ආපදා බොහෝමයක් මිනිසා දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවන බව ■ ජනයා ස්වාභාවික ආපදා පිළිබඳ නිරන්තරයෙන් අවධානයෙන් සිටිය යුතුබව ■ සමහර ස්වාභාවික ආපදා සිදුවන කාල සීමාවන් ඇති බව ■ ජනතාව දැනුවත් කිරීමෙන් ආපදාවලින් සිදුවන හානිය අවම කල හැකි බව ■ සිසුන්ට ඒ සඳහා විශාල කාර්ය භාරයක් ඇති බව ■ ආපදාවන් ඇති වූ පසු ගත යුතු බොහෝ ක්‍රියාමාර්ග සඳහා සිසුන් දායක විය යුතු බව

මිනිත්තු 40

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ස්වාභාවික ආපදාවලින් වන හානිය අවම කර ගත හැකි ක්‍රියා මාර්ග නම් කරයි.
- ස්වාභාවික ආපදාවලදී සිසුන් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග ඇති බව පිළිගනියි.
- ස්වාභාවික ආපදා අවම කල හැකි ආකාරය චිත්‍ර, පොස්ටර්, පත්‍රිකා මගින් ප්‍රදර්ශනය කරයි.
- ස්වාභාවික ආපදා කල්තියා හඳුනාගැනීමට පෙළඹේ
- සහයෝගය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, නායකත්වය වැනි ගුණාංග ප්‍රදර්ශනය කරයි.

ඇමුණුම - 7.5.3.1

- ස්වාභාවික ආපදා අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග හා ඒ සඳහා දායක විය හැකි ආකාරය

- ආපදාව නම් කරන්න...

කෙටි කාලීන	දිගු කාලීන	සිසුන් දායක විය හැකි ආකාරය	ආපදා කල්තියා හඳුනාගන්නා ආකාරය

7.6 ඒකකය
තේමා සිතියම් කියවීම

හැඳින්වීම

භූගෝල විද්‍යාව හැදෑරීමේ දී සිතියම අත්‍යාවශ්‍ය මෙවලමක් ලෙස හැඳින්විය හැකි ය. වර්තමානයේ එදිනෙදා ජීවිතයේ දී සිතියම් භාවිතය අත්‍යවශ්‍ය වෙයි. විවිධ කාර්යන් සඳහා විවිධ සිතියම් භාවිත කරනු ලබයි. සිතියම් විවිධ නිර්ණායක අනුව වර්ග කර දැක්විය හැකි ය.

කිසියම් තේමාවක් මුල් කරගෙන අඳිනු ලබන සිතියම් තේමා සිතියම් ය. භූ විෂමතා ලක්ෂණ, වර්ෂාපතනය, මහා මාර්ග, ස්වාභාවික වෘක්ෂලතා, සංචාරක තොරතුරු ආදි වශයෙන් එක් එක් තේමාව මුල්කරගෙන මෙම සිතියම් අඳිනු ලබයි.

සිතියමක මූලික ලක්ෂණ කිහිපයකි. දිශාව, පරිමාණය, සම්මත සංකේත හා සම්මත වර්ණ ඒ අතරින් ප්‍රධාන වේ. සිතියමක් නිවැරදිව කියවීම සඳහා ඒවා පිළිබඳ ව අවබෝධයක් ලැබීම අත්‍යවශ්‍ය ය.

තේමා සිතියම් හඳුනා ගැනීමත්, එම සිතියම් නිවැරදිව කියවීම් සඳහා අවශ්‍ය කුසලතා ලබාදීමත් මේ ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කෙරේ.

විෂය අන්තර්ගතය

7.6 සිතියමක් යනු කුමක් ද?

- භූ තලය මත ඇති විවිධ ලක්ෂණ පැතැලි තලයක් මත නිරූපනය කිරීම.

සිතියම් වර්ග

- සාමාන්‍ය සිතියම්
- විශේෂ සිතියම් (තේමා සිතියම්)

තේමා සිතියම් හඳුනා ගැනීම

එකම කරුණක් (තේමවක්) මුල් කරගෙන අඳිනු ලබන සිතියම්

උදා:- ශ්‍රී ලංකාවේ භූ විෂමතා සිතියම
ශ්‍රී ලංකාවේ සංචාරක සිතියම
ශ්‍රී ලංකාවේ වර්ෂාපතන ව්‍යාප්ති සිතියම
ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෝග ව්‍යාප්තිය දැක්වෙන සිතියම
ලෝකයේ ගුවන් මාර්ග

සිතියමක මූලික ලක්ෂණ

- **දිශාව**
  - සිතියමේ දිශාව දක්වා ඇති ආකාරය හඳුනා ගැනීම
  - ප්‍රදේශයේ දිශා හඳුනා ගැනීම
  - සිතියමක් දිශාගත කිරීම

පරිමාණය

විවිධ පරිමාණ සිතියම්

කුඩා පරිමාණයේ සිතියම් උදා:- පෙළ පොත්වල ඇති සිතියම්
ඇට්ලස් සිතියම්

මධ්‍ය පරිමාණයේ සිතියම්උදා:- 1:50,000 ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම

විශාල පරිමාණයේ සිතියම් උදා:- පාසල් භූමිය දැක්වෙන සිතියම
නිවසේ සැලැස්ම

පරිමාණය දක්වන විවිධ ක්‍රම

- පරිමාණ අනුපාතය - පරිමාණය භාගය
- රේඛීය පරිමාණය

සම්මත වර්ණ හා සංකේත මගින් විවිධ භූ ලක්ෂණ දැක්වීම

- සම්මත වර්ණ භාවිත කරන ආකාරය

උදා:-	භූ විෂමතා	- දුඹුරු වර්ණය
	වගාබිම් හා වනාන්තර	- කොළපාට
	මාර්ග	- කළු හෝ රතුපාට

- සංකේත භාවිත කරන ආකාරය
- සමෝච්ච රේඛා මගින් භූමියේ උස දැක්වීම (භූමියේ සම උස තැන් යා කොට අඳිනු ලබන රේඛා සමෝච්ච රේඛා ලෙස හැඳින්වේ)

ගුවන් තොටුපොල	- ගුවන් යානාවක්
අභය භූමිය	- සත්ව රූපයක්
වරාය	- නැව
ජනගහනය	- මිනිස් රූප

නිපුණතාව : **දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි**

නිපුණතා මට්ටම : තේමා සිතියම් සරලව අර්ථ දක්වයි

ක්‍රියාකාරකම : 7.6.1 සිතියම් හඳුනා ගනිමු

නිපුණතාව : දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි

නිපුණතා මට්ටම : තේමා සිතියම් සරලව අර්ථ දක්වයි
ක්‍රියාකාරකම : 7.6.1 සිතියම් හඳුනා ගනිමු
කාලය : මිනිත්තු 80
ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.6.1.1
- ඇමුණුම 7.6.1.2
- ශ්‍රී ලංකාවේ බිත්ති සිතියම්
- ලෝකයේ බිත්ති සිතියම
- ආදර්ශ ගෝලය
- ඇට්ලස් සිතියම් පොත
- ජාතික සිතියම් පොත

උපදෙස් :
- ඇට්ලස් පොත්, ජාතික සිතියම් පොත්, පෙළපොත් සොයා ගැනීමට උපදෙස් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.6.1.1 :
- ශ්‍රී ලංකා සිතියම, ලෝක සිතියම, ආදර්ශ ගෝලය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිතියමකින් නිරූපණය වන කරුණු ඉස්මතු වන සේ ප්‍රශ්න කීපයක් විමසමින් සාකච්ඡාවක් ගොඩනගන්න
- සිසුන්ගේ පෙර දැනුම ද මේ සඳහා උපයෝගී කර ගන්න.
- සිසු අදහස් ගොනු කරමින් ඒවා එකිනෙක හුණු පුවරුවේ සටහන් කරන්න.

> - භූගෝල විද්‍යාව ඉගෙනීමේ දී සිතියම් භාවිතය අත්‍යවශ්‍ය වන බව
> - භූ තලය මත ඇති විවිධ ලක්ෂණ සිතියමක නිරූපණය කෙරෙන බව
> - භූ තලය මත ඇති විශාල ප්‍රදේශයක තොරතුරු සිතියමකින් කුඩාවට දක්වන බව

මිනිත්තු 15

පියවර 7.6.1.2 :
- සිසුන් කණ්ඩායම් කීපයකට බෙදන්න
- නායකයෙක් පත් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- සෑම කණ්ඩායමකටම ඇට්ලස් පොත, ජාතික සිතියම් පොත, පෙළ පොත සපයා ගැනීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 7.6.1.1 සහ ඇමුණුම 7.6.1.2 කණ්ඩායමකට එක බැගින් සපයාගන්න

- කණ්ඩායම තුළ සාකච්ඡා කරමින් ඇමුණුම 7.6.1.1 හි සඳහන් වගු සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- වරින් වර කණ්ඩායම්වලට ගොස් සිසුනට මග පෙන්වන්න
- වැරදි නිවැරදි කර ගැනීමට උපදෙස් දෙන්න.

මිනිත්තු 30

පියවර 7.6.1.3 :
- කණ්ඩායම් විසින් සකස් කරන ලද වගු සටහන් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- ඒවා හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- ඉදිරිපත් කර ඇති තොරතුරුවල සමාන හා අසමානතා සසඳමින් සමූහ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වනසේ සමාලෝචනයක යෙදෙන්න
- නිවැරදි තොරතුරු ඇතුළත් වගුවක් හුණු පුවරුවේ සටහන් කරන්න.
- එම තොරතුරු තම සටහන් පොත්වල සටහන් කර ගැනීමට සිසුනට අවස්ථාව දෙන්න.

  - සිතියමකින් නිරූපනය වන තොරතුරු අනුව ඒවා වර්ග තුනකට බෙදා දැක්විය හැකි බව
  - ස්වාභාවික තොරතුරු ඇතුළත් සිතියම් භෞතික ලක්ෂණ සිතියම් ලෙස හැඳින්වෙන බව
  - මිනිස් කටයුතු දක්වන සිතියම් සංස්කෘතික ලක්ෂණ දක්වන සිතියම් ලෙස හැඳින්වෙන බව
  - සිතියමක දැක්වෙන තොරතුරු ප්‍රමාණය අනුව ඒවා වර්ග දෙකකට බෙදා දැක්වෙන බව
  - එකම සිතියමක කරුණු රාශියක් නිරූපණය කරන්නේ නම් ඒවා සාමාන්‍ය සිතියම් ලෙස හඳුන්වන බව
  - එක් විශේෂ කරුණක් පමණක් නිරූපණයට කෙරෙන සිතියම විශේෂ සිතියම්, තේමා සිතියම් ලෙස හැඳින්වෙන බව.

මිනිත්තු 35

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සිතියම් යනු කුමක්දැයි අර්ථ කථනය කර දක්වයි.
- භූගෝල විද්‍යාව හැදෑරීමේදී අත්‍යාවශ්‍යයෙන්ම සිතියම් භාවිත කළ යුතු බව පිළිගනියි.
- සිතියම් වර්ග කර දක්වයි.
- කණ්ඩායම් වශයෙන් ක්‍රියාකිරීමෙන් අන්‍යෝන්‍යව අදහස් හුවමාරු කර ගැනීම සඳහා සංයමයක් ඇති කර ගනී.
- සිතියම් මගින් ස්වාභාවික පුළුල් පරිසරය සරලව වටහාගත හැකි බව පිළිබඳ අත්දැකීම්

වගුව

ඇමුණුම 7.6.1.1

- ඔබ කණ්ඩායමේ ඇති පොත් ඇසුරින් සිතියම් 6 ක් තෝරාගෙන ඒවා පිළිබඳ ව මෙ වගුව සම්පූර්ණ කරන්න.
- සිතියමේ නම 2 තීරයේ ද සිතියම සපයාගත් පොතේ නම 3 තිරු වේ ද ලියන්න.
- සිතියම අයත්වන වර්ගය/ වර්ග 4, 5 තීරුවල ලියන්න.

අනු අංකය	සිතියමේ නම	සිතියම සපයා ගත් මුලාශ්‍රය	තොරතුරුවල ස්වභාවය භෞතික/සංස්කෘතික	තොරතුරුවල ප්‍රමාණය සාමාන්‍ය / විශේෂ
1.				
2.				
3.				
4.				
5.				
6.				

- ඔබේ පන්ති පොත්වල පළ වී ඇති සිතියම් හා සිතියම් පොතක පළ වී ඇති සිතියම් අධ්‍යයනය කර ඒ ඒ සිතියම්වලින් නිරූපනය කෙරෙන තොරතුරු මොනවා දැ යි සොයන්න.
- සිතියමකින් නිරූපණය වන තොරතුරුවල ස්වභාවය අනුව ඒවා ප්‍රධාන වර්ග දෙකකට බෙදා දැක්විය හැකි ය.

අ. භෞතික තොරතුරු දක්වන සිතියම්

භූ විෂමතා ලක්ෂණ, ජලවහනය, දේශගුණක තොරතුරු භූ ව්‍යුහය, පාෂාණ වැනි ස්වභාවික තොරතුරු දක්වන සිතියම් මීට අයත් ය.

ආ සංස්කෘතික තොරතුරු දක්වන සිතියම්

ජල සම්්පාදනය භෝග ව්‍යාප්තිය, ගමනාගමන, ජන ව්‍යාප්තිය, ජනාවස වැනි මානව තොරතුරු දක්වන සිතියම් මීට අයත් ය.

විශේෂ කාර්යයන් සඳහා ද ඇතැම් සිතියම් සකස් කරන හෙයින් පහත දැක්වෙන ලෙස ද සිතියම් වර්ග කළ හැකි ය.

අ. සාමාන්‍ය සිතියම්

පොදු කරුණු රාශියක් නිරූපණය කිරීම සඳහා සකස් කර ඇති සිතියම් මේ වර්ගයට අයත් ය. එක ම සිතියමක් මත භූ විෂමතාව ජලවහනය, නගර පාලන මායිම්, නැව් මාර්ග, ගුවන් මාර්ග වැනි තොරතුරු රාශියක් නිරූපණය කෙරෙන අවස්ථා තිබේ. ලෝක බිත්ති සිතියමක් මීට හොඳ උදාහරණයකි.

ආ. විශේෂ සිතියම්

විශේෂ කරුණක් නිරූපනය කිරීම සඳහා යොදා ගන්නා සිතියම් මෙම වර්ගයට ගැනේ. ජන ව්‍යාප්තිය, භූ ව්‍යුහය, ජල සම්පාදනය, උෂ්ණත්වය වැනි තොරතුරු මෙයින් නිරූපනය කෙරේ. මේවා තේමා සිතියම් යනුවෙන් ද හැඳින්වේ.

නිපුණතාව : **දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි**

නිපුණතා මට්ටම : තේමා සිතියම් සරලව අර්ථ දක්වයි

ක්‍රියාකාරකම : 7.6.2 සිතියමක් නිවැරදි ව දිශාගත කරමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.6.2.1 දිශා සටහන
- ඇමුණුම 7.6.2.2 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.6.2.3 ශ්‍රී ලංකා ආකෘති සිතියම
- ඇමුණුම 7.6.2.4 ලෝක ආකෘති සිතියම
- මාලිමා යන්ත්‍ර
- සෙ.මී 50 පමණ දිග සිහින් ලී පටි 4ක්
- මීටර් 1 ½ පමණ දිග ලී කනුවක්

උපදෙස් :

- ලී පටි සහ කනුව සපයා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- පන්තියේ සිසුන් එළිමහනට ගෙන යන්න. මේ සඳහා පැහැබර කාල ගුණයක් ඇති දිනයක් යොදා ගැනිම සුදුසුය. හුණු පුවරුවක් සකස් කර ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.6.2.1 :

- ඇමුණුම 7.6.2.1හුණු පුවරුවේ සටහන් කරන්න. ඉන් එක පිටපත බැගින් සිසුනට බෙදා දෙන්න.
- සිසුනගේ පෙර දැනුම හා පාරිසරික දැනුම උපයෝගීකර ගනිමින් දිශා සටහන නම් කරන්න.
- සිසුන් වෙත සපයා ඇති දිශා සටහන ඒ අනුව සම්පූර්ණ කරගැනිමට සලස්වන්න.
- පහත කරුණු මතුවනසේ සාකච්ඡා කරන්න.

> - උතුර,නැගෙනහිර,දකුණ,බටහිර ප්‍රධාන දිශා හතර බව
> - ඊසාන, ගිනිකොණ, නිරිත හා වයඹ අනු දිශා ලෙස හඳුන්වන බව
> - ප්‍රධාන දිශා හතර 90° කෝණික පරතරයක් ඇතිව පිහිටා ඇති බව
> - අනු දිශාවක් ප්‍රධාන දිශා අතර පිහිටි බව

මිනිත්තු 15

පියවර 7.6.2.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කීපයකට බෙදන්න
- නායකයෙක් පත් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 7.6.2.2 කාර්ය පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් බෙදන්න.
- ඇමුණුම 7.6.2.3. සහ ඇමුණුම 7.6.2.4 කණ්ඩායමකට එක බැගින් බෙදාදෙන්න.
- සිසුන් ක්‍රියාකාරීව වැඩෙහි යොදවන්න.

මිනිත්තු 40

පියවර 7.6.2.3
- සිසුන් විසින් කරනලද වැඩ කටයුතු ඇසුරින් සාකච්ඡාවක් ගොඩ නගන්න.
- දිශාව හඳුනාගැනීම හා සිතියමක් දිශාගත කිරීම යන සංකල්ප ඉස්මතුවන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- සිසු අදහස් ඔස්සේ සමාලෝචන සටහනක් හුණු පුවරුවේ ගොඩ නගන්න.
- මූලික කරුණු පිළිබඳ සටහනක් තබා ගැනිමට කාලය දෙන්න.

> - ප්‍රදේශයේ දිශා හඳුනාගැනීම සඳහා සූර්යයාගේ පිහිටීම හා මාලිමාව යොදාගත හැකි බව.
> - සිතියමක් නිවැරදිව දිශා ගත කිරීම යනු සිතියමේ දිශාවන් , ප්‍රදේශයේ දිශාවන්ට අනුකූලවන සේ තබා ගැනිම වන බව
> - තමා සිටින ස්ථානය නිශ්චය කරගැනීමෙන් පසු ඒ අනුව අනෙකුත් ස්ථාන පිහිටි දිශාවන් නිවැරදිව නිශ්චය කල හැකි බව.

මිනිත්තු 25

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක
- සිතියම් නිවැරදිව දිශාගත කර ගනී.
- සිතියමක් කියවීම සඳහා එය නිවැරදිව දිශාගත කළ යුතු බව පිළිගනී.
- සිසුන්දිශා සටහනක් සකස් කරයි.
- අප රටේ හා ලෝකයේ දිනපතා සිදුවීම් පහසුවෙන් තේරුම් ගැනීමට හුරුවක් ලබාගනී.
- දිශාව පිළිබඳ දැනුම එදිනෙදා ජීවිතයේ දී භාවිත කරයි.

ඇමුණුම 7.6.2.1

දිසා සටහන



ඇමුණුම 7.6.2.2.

කාර්ය පත්‍රිකාව

- සූර්යයාගේ පිහිටීම සොයාගන්න.
- වේලාව හා සූර්යයාගේ පිහිටීම අනුව නැගෙනහිර, බටහිර දිශාව නිශ්චිත කරන්න.
- සෙවනැල්ල පතිතව ඇති දිශාව නිරීක්ෂණය කරන්න.
- ඒ අනුව උතුරු හා දකුණු දිශා දෙක නිශ්චය කරන්න.
- ප්‍රධාන දිශා හතරේ පිහිටි බිම් සලකුණු හතරක් තීරණය කරන්න.
- ප්‍රධාන දිශා අනුව අනු දිශා හතර නිශචය කරන්න.
- මාලිමාව පැතලි තලයක තබන්න.
- එහි දැක්වෙන දිශා අනුව එය කරකවා නිවැරදිව සකස් කර ගන්න.
- ඒ අනුව ඔබ කලින් නිශ්චය කරගත් දිශාවල නිවැරදිතාව තහවුරු කර ගන්න.
- ඔබට සපයා ඇති දිශා සටහන දිශාගත කර එහි රේඛා කෙලවර ඔබ තෝරාගත් ඒ ඒ සලකුණු ඇඳ/ ලියා දක්වන්න.
- සපයා ඇති ලංකා සිතියම නිවැරදිව දිශාගත කරන්න.
- ඔබ පාසල පිහිටි නගර එහි ලකුණු කරන්න.
- ඒ අනුව එහි ලකුණු කර ඇති ස්ථාන හය පිහිටි දිශාවන් ලියන්න.
- ලෝක සිතියම නිවැරදිව දිශාගත කර එහි ප්‍රධාන මහාද්වීප පිහිටි දිශා ලියන්න.
- දිශා අට දැක්වෙන පරිදි ලී පටි හතර ඇණයකින් ලී කනුවට සවිකර එය සිටවා ගන්න. ලී පටි කෙලවර දිශාව සටහන් කරන්න.

ඇමුණුම 7.6.2.3

ශ්‍රී ලංකා සිතියම



ඇමුණුම 7.6.2.4

නිපුණතාව : **දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට, අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි**

නිපුණතා මට්ටම : තේමා සිතියම් වලට අර්ථ දක්වයි

ක්‍රියාකාරකම : 7.6.3 සිතියම් වර්ණ හා සංකේත හඳුනා ගනියි

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ලෝකයේ බිත්ති සිතියම
- ඇමුණුම 7.6.3.1 වගුව
- ඇමුණුම 7.6.3.2 භූ විෂමතා සිතියම
- ඇමුණුම 7.6.3.3 ප්‍රධාන සංචාරක ස්ථාන හා ගමන් මාර්ග සිතියම
- ඇට්ලස් සිතියම් පොත (2003) පිලිප් සිතියම් පොත
- පාට පැන්සල්
- කළු පාට පෑනක් බැගින්
- කවකටු පෙට්ටියක්

උපදෙස් : ■ ඉහත ද්‍රව්‍ය සපයා ගැනීමට කලින් උපදෙස් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.6.3.1 :

- ලෝක බිත්ති සිතියම් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිතියම් වර්ණ යොදා ඇති ආකාරය හා සංකේත යොදා ඇති ආකාරය විමසමින් සාක්ච්ඡාවක් ආරම්භ කරන්න.
- ගුරු සිසු අදහස් ගොනු කරමින් හුණු පුවරුවේ සටහනක් ගොඩ නගන්න

■ සිතියමක් ඇඳීමේ දී වර්ණ හා සංකේත භාවිත කරන බව

මිනිත්තු 10

පියවර 7.6.3.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 7.3.4.1 එක බැගින් සපයන්න.
- පිලිප් සිතියම් පොතක් හෝ පොත් කීපයක් කණ්ඩායම සපයා ගැනීමටඋපදෙස් දෙන්න.
- 7.6.3.1 වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් වැඩෙහි යෙදෙන අතර කණ්ඩායම්වලට ගොස් අවශ්‍ය උපදෙස් දෙන්න.
- අවශ්‍ය මග පෙන්වන්න.

මිනිත්තු 40

පියවර 7.6.3.3 :

- සම්පූර්ණ කරන ලද වගු එක් එක් කණ්ඩායම ලවා ඉදිරිපත් කරවන්න.
- ඒවා සංසන්දනය කරමින් සමූහ සාකච්ඡාවක් ගොඩ නගන්න.
- සිසු අදහස් ඔස්සේ සමාලෝචන සටහනක් හුණු පුවරුවේ ගොඩ නගන්න.
- අවශ්‍ය තොරතුරු සටහනක් කර ගැනීමට කාලය දෙන්න.

- භෞතික හා සංස්කෘතික භූ ලක්ෂණ දැක්වීම සඳහා විවිධ සංකේත හා වර්ණ යොදාගන්නා බව
- තොරතුරු නිරූපනය සඳහා යෙදෙන වර්ණ හා සංකේත අර්ථවත් ලෙස යොදන බව
- තොරතුරු නිරූපණය සඳහා වෘත්ත, චතුරස්‍ර, සෘජු කෝණාස්‍ර යොදාගන්නා බව
- ඇතැම් තොරතුරු දැක්වීම සඳහා චිත්‍ර සංකේත යොදා ගන්නා බව
- භූ විෂමතා දැක්වීම සඳහා සමාන උසතැන් යාකොට අඳිනු ලබන සමෝච්ච රේඛා යොදාගන්නා බව
- තේමා සිතියම් සඳහා යොදාගන්නා සංකේත හා වර්ණ සමාන සංකේත හා වර්ණ ලෙස හැඳින්විය හැකි බව

මිනිත්තු 30

තක්සේරුව හා ඇගයීම් නිර්නායක

- සිතියමක තොරතුරු නිරූපණය කිරීමේ දී විවිධ වර්ණ හා සංකේත අර්ථවත් ලෙස යොදාගත යුතු ආකාරය පැහැදිළි කරයි.
- භූ ගෝල විද්‍යාව හැදෑරීමේ දී වර්ණ හා සංකේත අවශ්‍යයෙන්ම භාවිත කළ යුතු බව පිළිගනියි.
- වර්ණ හා සංකේත මගින් තොරතුරු නිරූපනය කරයි.
- එදිනෙදා ජීවිතයේ දී හමුවන විවිධ සංකේත මගින් දක්වන තොරතුරු ඉක්මනින් තේරුම් ගනී.
- අනාගත ලෝකයේ ඇතිවන කාළගුණික වෙනස්කම්වලට අනුගත වේ.

ඇමුණුම 7.6.3.1

වගුව

උපදෙස්

- පහත දී ඇති උපදෙස් පරිදි වගුව සම්පූර්ණ කරන්න
- එහි 2 තීරයේ දී ඇති භූ ලක්ෂණ නිරූපණය කිරීම සඳහා යොදා ඇති වර්ණ 2 තීරයේද, යොදාඇති සංකේත 3 තීරයේද දක්වන්න.
- මේ සඳහා පිලිප් සිතියම් පොත (2003) පරිහරණය කරන්න.
- භෞතික ලක්ෂණ දැක්වීම සඳහා එහි පිටු අංක 107 - ශ්‍රී ලංකා භූ විෂමතා සිතියම ද සංස්කෘතික ලක්ෂණ දැක්වීම සඳහා පිටු අංක 132 - ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංඛ්‍යාත්මක ස්ථාන හා ගමන් මාර්ග දක්වන සිතියම ද භාවිත කරන්න.

ඇමුණුම 7.6.3.1

වගුව

1 භූ ලක්ෂණය	යොදාගෙන ඇති		වර්ණය හා සංකේතය
භෞතික ලක්ෂණ	2 වර්ණය	3 සංකේතය	අකුරින් ලියන්න
පිටුව 107			
උස් බිම්			
පහත් බිම්			
අතර මැද ප්‍රදේශ			
නොගැඹුරු මුහුද			
ගැඹුරු මුහුද			
ගංගා			
වැව්			
මී. 2200 උස			
ගංගා			
මුහුදේ ගැඹුර			
කන්ද			

1 භූ ලක්ෂණය	යොදාගෙන ඇති		වර්ණය හා සංකේතය අකුරින් ලියන්න
	2 වර්ණය	3 සංකේතය	
භෞතික ලක්ෂණ පිටුව 132			
ප්‍රධාන මාර්ග			
දුම්රිය මාර්ග			
දුම්රිය පොළ			
ගුවන් තොටුපල			
වරාය			
ස්ථූපය			
දේවස්ථානය			
පල්ලිය			
කෝවිල			
වනෝද්‍යාන			
පුරාවිද්‍යා බිම			
කෞතුකාගාර			
සංචාරක වෙරළ			
බලකොටුව			
ප්‍රදීපාගාරය			
නගරය			

ඇමුණුම 7.6.3.3

භූ විෂමතාවය



ඇමුණුම 7.6.3.3

ප්‍රධාන සංචාරක ස්ථාන හා ගමන් මාර්ග

තක්සේරුව හා ඇගයීම

3 වන කොටස

තක්සේරුව හා ඇගයීම

හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟාකර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවයකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම් හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම් ලබන සියලු ම සිසුන්ට, අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාවයක් ලබාගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගැයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමයි.

තක්සේරුවේ යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (FEED BACK) හා ඉදිරි පෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබාදීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළහැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගැයීම් වැඩ පිළිවෙළ සිසු සාර්ථකත්වය මට්ටම් ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර, සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT - CENTERED) නිපුණතා පාදක (COMPETENCY - BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථයක් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANS FORMATION ROLE) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාවේ ඉගෙනුම හා ඉගැන්වීම තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායකය පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශී වී තිබෙන දැනුම, කුසලතා හා ආකල්ප මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුන්ට අත දේ. නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්ති කාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර, තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමටත්, ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

ඇගයීම් වැඩපිළිවෙල වැඩි දියුණු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. ඒ සඳහා ක්‍රියාකාරකම් සන්තතිය (ACTIVITY CONTINUM) ඔස්සේ ඇගයීම් අවස්ථා කිහිපයක් ඇති කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත. ඇගයීම් ලක්ෂ්‍ය (EVALUATION POINTS)

හඳුනා ගැනීමට පහසු වන පරිදි ක්‍රියාකාරකම් සන්තතිය, පොකුරු ක්‍රියාකාරකම් (ACTIVITY CLUSTER) කිහිපයකට වෙන් කිරීමෙන් ඇගයීම් වැඩ පිළිවෙල අර්ථවත් කළ හැකි ය. සෑම ක්‍රියාකාරකම් පොකුරක් ආරම්භයේ දී ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා ගන්නා ඇගයීම් උපකරණ කවරේ දැයි සිසුන්ට හඳුන්වා දීම අවශ්‍ය වේ. ඇගයීම් ප්‍රභේද තෝරා ගැනීමේ දී සිසු ඉගෙනුම් පෙළඹවීම විකසිත කරවන ප්‍රබෝධවත් ක්‍රියාකාරකම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ.

මීට අදාළ ක්‍රියාකාරකම් ලැයිස්තුවක් මතු දැක්වේ.

- සංකල්ප සිතියම් (CONCEPTMAPS)
- බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (QUZZES)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් QUESTION AND ANSWER BOOKS)
- ශිෂ්‍ය කාර්ය සාධක ගොනු (STUDENT PROJECT)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (EXHIBITONS)
- විවාද (DEBETES)
- සාකච්ඡා මණ්ඩල (PANEL DISCUSSIONS)
- සම්මන්ත්‍රණ (SEMINAR)
- ක්ෂණික කථා (IMPROMPTU SPEECHES)
- භූමිකා රංග (RLOE PLAYS)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර පොත්, ස්වභාව අධ්‍යයනය දින පොත්, හොඳවැඩ පොත් (FIELD BOOK, NATURE DIARIES)
- ප්‍රායෝගික පරීක්ෂණ (PRACTCAL TESTS)

පාඨ මාර්ගයේ තුන්වන කොටස යෝජිත ඇගයීම් ලක්ෂ්‍යයක් හා ඒ සඳහා තෝරා ගෙන ඇති ඇගයීම් උපකරණය හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් ඇගයීම් දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමෙහි නියැලීමට සිසුනට හැකි වේ.

භූගෝල විද්‍යා විෂයය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද යොදා ගැනීම තුළින් ප්‍රියජනක ඉගෙනුම් අවස්ථා සිසුන්ට ලබාදීමට හැකි වේ.

තක්සේරුව හා ඇගයීම් භූගෝල විද්‍යාව

ස්වයං තක්සේරුව

ඒ ඒ ඒකක යටතේ අදාළ නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා ස්වයං තක්සේරුවක් සැලසුම් කිරීම. ඒ ඒ පාඩම් පිළිබඳ සිසුන් දක්වන අදහස හා ආකල්ප පිළිබඳවත් වාර හෝ වර්ෂ අවසානයේ එම පාඩම් පිළිබඳව ශිෂ්‍ය අදහස් හා ආකල්ප සැසඳීම මගින් තක්සේරුව කළ හැකි ය. ශිෂ්‍යයින්ටම තම ප්‍රබලතා හා දුලබතා අවබෝධ කරගත හැකි අතර ගුරුවරයාටද ශිෂ්‍ය දුබලතා හඳුනාගෙන අවශ්‍ය නිපුණතා සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග සැලසුම් කළ හැකි ය.

කණ්ඩායම් ඇගයීම

කණ්ඩායම් හෝ සමූහ ක්‍රියාකාරකම් (චාරිකා, බිත්ති පුවත්පත්, ව්‍යාපෘත්, වාර්තා ආදී) වලදී සිසුන් දක්වන දායකත්වය අන්තර් සම්බන්ධතා හා සැලසුම් කිරීම හා නිර්මාණශීලී බව, නිමාව පිළිබඳ නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් කළ හැකි අතර ශිෂ්‍යයින් දිරිමත් කළ හැකි ය.

ව්‍යාපෘති ඇගයීම

වාරයක් අවසානයේ කේවල හෝ කණ්ඩායම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී සුදුසු නිර්ණායක යොදන ඇගයීම් කළ හැකි ය.

විධිමත් ඇගයීම

භූගෝල විද්‍යා විෂයයට අදාළ මූලික සංකල්ප තහවුරු වී ඇත් ද යන්න වාර අවසාන/වර්ෂ අවසාන විධිමත් පරීක්ෂණ මගින් අභිමත පරිදි මැනිය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය

1 වාරය

7 ශ්‍රේණිය

1.0 උපකරණ අංක : 1

2.0 නිපුණතා මට්ටම : ■ අප ජීවත් වන ලෝකය විස්තර කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය

1 වාරය

7 ශ්‍රේණිය

1.0 උපකරණ අංක 1

2.0 නිපුණතා මට්ටම්

3.0 විෂය අන්තර්ගතය

■ අප ජීවත් වන ලෝකය විමර්ශණය කරයි.

■ ශ්‍රී ලංකාවේ භූගෝලීය අනන්‍යතාව විමර්ශනය කරයි.

4.0 උපකරණයේ ස්වභාවය :

■ අප ජීවත්වන ලෝකයේ පිහිටීම හා ශ්‍රී ලංකාව පිළිබඳ සිතියම් එකතුවක් සකස් කිරීම.

5.0 උපකරණයේ අරමුණ :

■ අප ජීවත්වන ලෝකයේ පිහිටීම පිළිබඳ අවබෝධයක් ලබාදීම

■ ශ්‍රී ලංකාවේ භෞතික ප්‍රපංචයන්ගේ හා මානව කටයුතු කීපයක ව්‍යාප්තීන් අධ්‍යයනය කිරීම.

6.0 උපකරණ ක්‍රියත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :

■ සෑම සිසුවකුටම මෙම සිතියම් ගොනුව සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දෙන්න.

■ සෑම ඒකක කොටසක්ම ඉගැන්වීම් අවසානයේ පහත දී ඇති සිතියම් මාතෘකාවලට අදාළ සිතියම් සිසුන් ලවා නිර්මාණය කරවන්න.

■ සිසුන් ලවා සිතියම් නිර්මාණය කිරීමේ දී පොත පරිශීලනයට අවස්ථාව දෙන්න.

■ සිතියම් සඳහා හැකිතාක් දුරට විද්‍යානුකූලව ක්‍රමශිල්ප භාවිත කිරීමට උපදෙස් දෙන්න.

■ ඒ ඒ සිතියම්වලට ඇතුළත් කළ යුතු කරුණු පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

■ සිතියම් ලකුණු කිරීමේ ප්‍රගතිය අඛණ්ඩව නිරීක්ෂණය කරන්න.

■ වාර අවසානයේ සිසුන්ගේ සිතියම් සංග්‍රහය සඳහා පහත ඇගයීම් නිර්ණායක යටතේ ලකුණු ලබාදෙන්න.

ඇගයීම් නිර්ණායක

1. මාතෘකාවට අදාළ බව
2. පැහැදිලි බව
3. ක්‍රමවත් බව
4. නිර්මාණශීලී බව
5. සමස්ත නිමාව

7.0 සිසුන්ට උපදෙස් :

- සෑම සිසුවකුම ගුරුවරයා ගේ උපදෙස් මත පළමු වාරය තුළ මෙම සිතියම් සංග්‍රහය සකස් කළ යුතුයි.
- මුද්‍රිත ආකෘති සිතියම් හෝ පිටපත් කරගත් ආකෘති සිතියම් මේ සඳහා යොදාගන්න
- සෑම සිතියමකටම මාතෘකාවක්, රාමුවක් හා සුදුසු පරිදි යතුරක් සපයන්න.
- සුදුසු පරිදි සිතියම වර්ණ යොදා සකස් කරන්න මේ සඳහා ගුරු උපදෙස් ලබාගන්න.
- සිතියම් සංග්‍රහය සඳහා නිර්මාණශීලි පිටකවරයක් පටුනක් යොදන්න.
- ගුරුවරයා නියම කරනු ලබන දිනට සිතියම් සංග්‍රහය නිමා කර භාර දෙන්න.

සිතියම් සංග්‍රහය සඳහා ඇතුළත් කළ යුතු තේමා :

1. ආදර්ශ ගෝල ආකෘතියක පහත දැක්වෙන විශේෂ අක්ෂාංශ හා දේශාංශ ලකුණු කර නම් කිරීම.
   - උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය
   - සමකය කර්කටක නිවර්තනය, මකර නිවර්තනය, ආක්ටික් වෘත්තය, ඇන්ටාටික් වෘත්තය යන අක්ශාංශ
   - ග්‍රිනිච් රේඛාව හා ජාත්‍යන්තර දින රේඛාව යන දේශාංශ
2. මහාද්වීප හා සාගර දැක්වෙන සිතියම (මහද්වීප 07, සාගර 05 විශාලත්වය අනුව අංක යෙදීම උචිත වේ)
3. ඉන්දියන් සාගරය හා ඒ අනුව ඇති රටවල් දැක්වෙන සිතියමක් (මෙහිදි ශ්‍රී ලංකාවේ නිරපෙක්ෂ පිහිටීම දැක්වීම උචිත යි)
4. ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය ප්‍රදේශය දැක්වෙන සිතියම
5. ශ්‍රී ලංකාවේ පළාත් හා දිස්ත්‍රික් පරිපාලන ඒකකයන් දැක්වෙන සිතියම්
6. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප දැක්වෙන සිතියම
7. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්ත කීපයක් පිහිටා ඇති ස්ථාන දැක්වෙන සිතියම (ටයර් / සිමෙන්ති /සීනි /පිඟන් භාණ්ඩ)
8. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග කීපයක ව්‍යාප්තිය දැක්වෙන සිතියම (තේ / පොල් / රබර්)

ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය

2 වාරය

7 ශ්‍රේණිය

1.0 උපකරණ අංක : 2

2.0 නිපුණතා මට්ටම :
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුලනාත්මකව අධ්‍යයනය කරයි.
- තම ආසන්න ප්‍රදේශයේ භූ දර්ශනය පරීක්ෂා කරයි.

3.0 විෂය අන්තර්ගතය : 7.3 ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

7.4 තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය

4.0 උපකරණයේ ස්වභාවය :
- ඉගෙනුම් ප්‍රදර්ශන පත්‍රිකාවක් සකස් කිරීම

5.0 උපකරණයේ අරමුණු :
- ශ්‍රී ලංකාවේ භූ දර්ශන සහ තමා ජීවත්වන ප්‍රදේශයේ භූ දර්ශනය සංසන්දනාත්මක අධ්‍යයනයක් කිරීම

6.0 උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :
- අදාළ ඒකක පිළිබඳ සමස්ත අවබෝධයක් ලබාදීම සඳහා මෙම ක්‍රියාකාරකම සෑම සිසුවකු ලවාම කරවන්න.
- සිසු ක්‍රියාකාරකම සඳහා සපයා ඇති වගු සම්පූර්ණ කිරීමට පිළිතුරු සඳහා දී ඇති වගුව යොදාගැනීම සම්බන්ධව උපදෙස් දෙන්න.
- ප්‍රදර්ශනය කළහැකි පත්‍රිකාවක් ලෙස වගුව සකස් කර ගැනීමටත් අදාළ අවස්ථාවක් හී දී අදාළ රූප හෝ චිත්‍ර අලවා විචිත්‍රවත් කරන ලෙසත් උපදෙස් දෙන්න.
- නිමා කළ වගුව සහිත ප්‍රදර්ශන පත්‍රිකා වෙනුවෙන් ඇගයීම් නිර්ණායක අනුව ලකුණු ලබාදෙන්න.
- සිසුන් සකස් කළ ප්‍රදර්ශන පත්‍රිකා පන්තියේ ප්‍රදර්ශනයට අවස්ථාවක් සලසා දෙන්න.

7.0 සිසුන්ට උපදෙස් :
- ප්‍රදර්ශන පත්‍රිකා සකස් කිරීමේ දී අවශ්‍ය ගුරු උපදෙස් ලබාගන්න.
- විශාල ප්‍රමාණයේ පත්‍රිකාවක (බ්‍රිස්ටල්බෝඩ් / ඩිමයිකොල) වගු සකස් කර ගන්න.
- අවශ්‍ය සෑම අවස්ථාවකම චිත්‍ර පින්තූර ආදිය යොදා විචිත්‍රවත් ප්‍රදර්ශන පත්‍රිකාවක් පිළියෙල කිරීමට උත්සාහ ගන්න.
- තමා ජීවත්වන ප්‍රදේශය සඳහා වගුව සකස් කිරීමේ දී සපයා ඇති පිළිතුරු වගුව යොදා නොගන්න. එයට ස්වාධීනව උචිත පිළිතුරු සපයන්න.

8.0 ඇගයීම් නිර්ණායක :1. තොරතුරුවල නිවැරදි බව
2. චිත්‍ර / රූප ගැලපීම
3. ක්‍රමවත් බව
4. නිර්මාණශීලී බව
5. සමස්ත නිමාව

පිළිතුරු වගුව

වී වගාව	ත්‍රිකුණාමලය	රබර් වගාව	කෑගල්ල
අනුරාධපුරය	වතු ජනාවාස	ශේෂ කඳු	පොකුරු ජනාවාස
සංචාරක කර්මාන්තය	නුවරඑළිය	නාගරික ජනාවාස	හේන් වගාව
දිය ඇල්ල	ධීවර ජනාවාස	මහනුවර	හෙල්වැටි
අර්තාපල් වගාව	කලපුව	ධීවර කර්මාන්තය	පොළොන්නරුව
රත්නපුරය	පොල් වගාව	පුත්තලම	තේ වගාව

සිසුන් විසින් සම්පූර්ණ කළයුතු වගුව

භූ දර්ශනය	පූර්ණ ලෙස අයත් දිස්ත්‍රික්ක දෙකක්	විශේෂ භූ ලක්ෂණයක්	පිහිටා ඇති ජනාවාස වර්ගයක්	ජනාවාසයේ පින්තූර/චිත්‍ර	ආර්ථික කටයුතු දෙකක්	ආර්ථික කටයුතු වල පින්තූර/චිත්‍ර
මධ්‍යම කඳුකරය	1 2					
වියළි කලාපය	1 2					
තෙත් කලාපය	1 2					
වෙරළ තීරය	1 2					
තමා ජීවත්වන ප්‍රදේශය	අයත්වන දිස්ත්‍රික්කය					

ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය

3 වාරය

7 ශ්‍රේණිය

1.0 උපකරණ අංක : 3

2.0 නිපුණතා මට්ටම :
- ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා
- තේමා සිතියම් සරලව අර්ථ දක්වයි.

3.0 විෂය අන්තර්ගතය : 7.5 ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා
7.6 තේමා සිතියම් කියවීම

4.0 උපකරණයේ ස්වභාවය :
- තොරතුරු ගොනුවක් සකස් කිරීම හා තම පාසල අවට ප්‍රදේශයේ භෞතික හා සංස්කෘතික තොරතුරු දැක්වෙන සිතියමක් සැකසීම

5.0 උපකරණයේ අරමුණ :
- ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා කීපයක් පිළිබඳ අවබෝධයක් ලබාදීම
- සිතියම් නිර්මාණයේ දී සම්මත වර්ණ හා සංකේත භාවිත කිරීම පිළිබඳ අවබෝධයක් ඇති කිරීම

6.0 උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස් :
- මෙම ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණය කොටස් දෙකකින් යුක්ත බව සලකන්න.
- ක්‍රියාකාරකම් දෙක සඳහා සුදුසු පරිදි කාල සීමා දෙකක් යොදාගන්න.
- 7.5 ඒකකයේ අදාල මාතෘකා සඳහා තොරතුරු ගොනුවක් ද 7.6 ඒකකය සඳහා තම පාසල අවට ප්‍රදේශයේ දළ සිතියමක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
- තොරතුරු ගොනුවට ඇතුලත් විය යුතු කරුණු චිත්‍ර, පින්තූර හා සිතියම් පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- සිතියමෙන් දැක්විය යුතු දේවල් පිළිබඳව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- සංකේත හා වර්ණ යෙදීම පිළිබඳ ව අවශ්‍ය උපදෙස් සිසුන්ට ලබා දෙන්න.
- සිතියමට යතුරක් සැපයීමටද උපදෙස් දෙන්න
- තොරතුරු ගොනුවට හා සකස්කළ සිතියමට දී ඇති නිර්ණායක අනුව වෙන වෙනම ලකුණු ලබාදෙන්න.

7.0 සිසුන්ට උපදෙස් :

- සෑම සිසුවකුම ගුරුවරයාගේ උපදෙස් අනුව ඉහත ක්‍රියාකාරකම් දෙකම කළ යුතුයි.
- ගුරුවරයා ඔබට පවරන ස්වභාවික ආපදා හය පිළිබඳ ව තොරතුරු ගොනුව සකසන්න.
- තොරතුරු ගොනුවට හැකිතාක් චිත්‍ර, රූප, සිතියම්, වගු ආදිය යොදන්න උත්සාහ ගන්න.
- පටුනක්, පිළිගැන්වීමක් හා ස්තුතිය සහ ශීර්ෂ ද ඇතුළත් කරන්න.
- තොරතුරු ගොනුවට උචිත මාතෘකාවක් සිත්ගන්නා පිටකවරයක් යොදන්න.
- සිතියම සකස් කිරීමේ දී තරමක් විශාල පත්‍රිකාවක් උපයෝගි කරගන්න.
- සිතියමට ඇතුළත් කළයුතු තොරතුරු පිළිබඳ ලැයිස්තුවක් සකස් කරගන්න.
- නිවරදිව හා පැහැදිලිව සිතියම අදින්න උත්සහ ගන්න.
- දිශාව දැක්වීම, වර්ණ භාවිතය, පරිමාණය, තොරතුරු දැක්වීම පිළිබඳ ගුරු උපදෙස් ලබාගන්න.
- ගුරුවරයා නියම කරනු ලබන දිනයන්වල දී නිර්මාණය නිමාකර භාර දෙන්න.

තොරතුරු ගොනුවේ ඇතුළත් විය යුතු ශීර්ෂ හා සැකැස්ම

- උචිත පිටකවරයක්
  - පිදුම
  - පටුන
  - ස්වභාවික ආපදා යටතේ
    - නියගය
    - ගංවතුර
    - සුළි සුළං
    - විදුලි කෙටීම් හා අකුණුසැර
    - නායයෑම්
    - සුනාමි පිළිබඳ තොරතුරු
- ආපදාවන් විස්තර කිරීමේ දී ඒවාට අදාළ පින්තූර / චිත්‍ර ආදිය
- ඒ ඒ ආපදාවන් සිදුවන ප්‍රදේශ දැක්වෙන සිතියම්

8.0 තොරතුරු ගොනුව සඳහා ඇගයීම් නිර්ණායක :

1. තොරතුරුවල නිරවද්‍යතාව
2. තොරතුරු සිත්ගන්නා ලෙස ඉදිරිපත් කිරීම
3. ක්‍රමවත් බව
4. නිර්මාණශීලිබව
5. සමස්ත නිමාව

සකස් කළ සිතියම සඳහා ඇගයීම් නිර්ණායක :

1. නිවැරදි බව
2. වර්ණ හා සංකේතවල අදාළ බව
3. නිර්මාණශීලී බව
4. ක්‍රමවත් බව
5. සිතියමේ නිමාව

එක් නිර්ණායකයකට ලකුණු 4 බැගින් මුළු ලකුණු 20යි.